ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ආරම්භය: 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය



ලේඛක, පාඨක ඔබ සැමට

සුබ නව වසරක් !

ක්‍රි.ව. 2014 ක් වූ ජනවාරි 05 ඉරිදා 148 වෙළුම 31 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/35/NEWS/2014 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

## කුරුසිය සහෝදරත්වයේ තිරසාර පදනම් පථයයි

### සසුන් පියා 2014 සාම දින පණිවුඩයෙන් අර්ථ ගන්වයි



කුරුසිය සහෝදරත්වයේ තිරසාර පදනම් පථයයි. එම සහෝදරත්වය උපදවා ගැන්මට නොහැකි වීම ගැටුමට හේතු වේ. සහෝදරත්වය අත්දැකිය යුතුය. ආදරය විඳිය යුතුය. ප්‍රේමය ප්‍රකාශ කළ යුතු යැයි අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ජනවාරි 01 දිනට යෙදුන ලෝක සාම දිනය නිමිත්තෙන් පණිවුඩයක් නිකුත් කරමින් ප්‍රකාශ කර සිටී. **(සසුන් පිය සාම දින පණිවුඩය 11 පිටුවේ පළවේ)**



## ඉතාලි කතෝලික රදගුරු මඬුල්ලේ සභාපති අති උතුම් ඇන්ජලෝ

# බැග්නෙස්කෝ හිමි දිවයිනට සැපත් වේ

**ශ්‍රී ලංකාවේ ජනතාව තුළ පවත්නා ආගමික භක්තිය සමස්ත ලෝකයටම මහත් ආදර්ශයක් ගෙන එන්නේ යැයි ශ්‍රී ලංකාවට සැපත්ව සිටින ඉතාලි රදගුරු මඬුල්ලේ සභාපති හා ජෙනෝවා අගරදගුරු වසමේ අගරදගුරු අති උතුම් ඇන්ජලෝ කාදිනල් බැග්නෙස්කෝ හිමිපාණෝ ප්‍රකාශ කළහ.**

කඳාන සාන්ත සෙබස්තියන් සිද්ධස්ථානයේ පැවති මෙහෙයේදී උන්වහන්සේ මේ බැව් පළ කළහ. කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ විශේෂ ඇරියුමක් මත ශ්‍රී ලංකාවට පැමිණ සිටින කාදිනල් හිමිපාණෝ මෙරට විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති දැක බලා ගැනීමට ද යන්නාහ. අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා යම් හෙයකින් ශ්‍රී ලංකාවට සැපත් වන්නේ නම් අති උතුම් ඇන්ජලෝ කාදිනල් බැග්නෙස්කෝ හිමිපාණන්ගේ කටයුතු ද ඊට හේතු විය හැකි යැයි සසුන් අභ්‍යන්තර ආරංචි මාර්ග අනාවරණය කරයි.

2014



ඡායා - අශෝක් ජේසාරත්න

සාමයෙ සමගියෙ සිතිවිලි පුබුදා ප්‍රේමය ලොව රජ වේවා
ක්‍රෝධය වෛරය දුරින්ම දුරුවී සැම හදවත් සුවපත් වේවා
කිතුහිමි වදාළ දහමේ මෙත් මල් සැම හදවත් තුළ පිබි දේවා
නව වසරේ අප දිවි ගමනේ මඟ දෙව් මව් ජීවිත මඟ වේවා

**සංකල්පනාව - බෙනී ජයමාන්න**

## කඳානේ දී හා බොරැල්ලේ දී මහත් හරසර



දෙසැ. 29 ඉරුදින කඳාන සා. සෙබස්තියන් මුනි සිද්ධස්ථානයට පැමිණි අති උතුම් ඇන්ජලෝ කාදිනල් බැග්නෙස්කෝ හිමිපාණන්ව කඳාන මීසම් ජනතාව එක්ව මහත් හරසරින් යුතුව පිළිගනු ලැබූහ. එහිදී අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සමඟ හවුල් දිව්‍ය යාගයට සම්බන්ධ වූ එතුමන් ඉන්පසු මීසම් වැසි ජනතාව සමඟ ඉතාමත් සුහදව අදහස් බෙදාගැනීමකට ද සම්බන්ධ විය. සිද්ධස්ථාන පාලක ගරු නිහාල් අයිවන් පියතුමන් ප්‍රමුඛ මීසම් ධර්ම සේවා සභාව කටයුතු සංවිධානය කළ මෙම පිළිගැනීම මොන්සිඤ්ඤෝර් අතිගරු නෙවිල් ජෝ පෙරේරා මාහිමිපාණන්ගේ අධීක්ෂණය යටතේ සිදුවිය.

## ලංකා අපෝස්තුළුවර භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන්ගේ මංගල්‍යය - 2014

**අසේල දසනායක විසිනි**

ශ්‍රී ලංකා අපෝස්තුළුවරයාණන්, අසහාය ධර්මධරයාණන් වන භාග්‍යවත් ජුසේ වාස් මුනිතුමන්ගේ ස්වර්ගීය උපතේ 303 වන සැමරුම හා වාර්ෂික මංගලෝත්සවය ජනවාරි 16 වැනි දිනට යෙදී ඇත. ඒ වෙනුවෙන් පදවි මට්ටමින්, මීසම්, ආයතන හා පාසල් මට්ටමින් විවිධ සැමරුම් සංවිධානය කර ඇත. සියලු සැදැහැවතුන්ගේ සහභාගිත්වය සඳහා හා දැනගැනීම සඳහා ජුසේවාස් ජාතික කාර්යාංශය විසින් ඒවා මෙලෙස නිවේදනය කර සිටී.

**යාපනය රදගුරු වසම**

★ ජනවාරි 16 - සා. මරියා දේවස්ථානය සිල්ලෙයිහි පිහිටි ජුසේ වාස් මුනි සිද්ධස්ථානයේ දී යාපනය රදගුරු අති උතුම් තෝමස් සෞන්ද්‍රනායගම් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන්

**කොළඹ අගරදගුරු වසම**

★ ජනවාරි 16 - කන්‍ය ශුද්ධ දේවමාතා දේවස්ථානය, පිටිපන වීදිය, මීගමුව. සවස 5.00 ගරු ලෝරන්ස් ආනන්ද පියතුමන්ගේ ප්‍රධානත්වයෙන්

★ ජනවාරි 19 - ශ්‍රී සළුධාතු දේවමාතා දේවස්ථානය, වැල්ලපල්ලිය, හැඳල, වත්තල (අගරදගුරු වසමේ ප්‍රධාන මංගල්‍යය) උදේ 8.00 අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු සහයක රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙනි. සංවිධානය වත්තල දිසාව.

★ ජනවාරි 12 - උදේ 6.30 ශු. ප්‍රැන්සිස් සාලෙස් දේවස්ථානය, කට්ටුව.

★ ජනවාරි 19 - උදේ 8.00 ශු. ජූඩ් දේවස්ථානය, දළුවකොටුව,

★ ජනවාරි 19 - භාග්‍යවත් ජුසේවාස් දේව ධර්ම නිකේතනය

★ ජනවාරි 19 - උදේ 8.30 භාග්‍යවත් ජුසේවාස් දේවස්ථානය, මාකොළ.

★ ජනවාරි 19 - උදේ 8.00 ශ්‍රී කුරුස දේවස්ථානය, ගම්පහ.

★ ජනවාරි 19 - උදේ 7.30 ශු. මිඛායෙල් දේවස්ථානය, නාගොඩ, කළුතර.

★ ජනවාරි 19 - උදේ 7.00 බිළිඳු ජේසු දේවස්ථානය කළමුල්ල, කළුතර

★ ජනවාරි 26 උදේ 8.00 භාග්‍යවත් ජුසේවාස් දේවස්ථානය, මෝදර, මොරටුව.

**ලබන සතියට...**

**"සියලු ජාතීන්ට ගැලවීමේ සහභාගිකම ලැබේ." (එපීස 3:2)**




# දේශපාලකයන්ගේ පරම වගකීම කාදිනල් හිමිපාණෝ පෙන්නා දෙති

**සිය නායකයින්ට සෑම අවස්ථාවකදීම සත්‍ය තත්ත්වය අවබෝධ කර දීම සහ සත්‍යය වෙනුවෙන් පෙනී සිටීම දේශපාලකයින්ගේ පරම වගකීම බව කොළඹ අගරදගුරු, අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පැවැසූහ.**

අගරදගුරු හිමි එසේ පැවසුවේ බේරුවල ශාන්ත ආනා දේවස්ථානයේ ඉදිකළ අභිනව මීසම් ශාලාව විවෘත කිරීමේ මහෝත්සවයේදීය.

මේ මීසම් ශාලාව ඉදිකිරීමට ඉෆාඩ් ආයතනය මෙහෙයවූ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය, දොස්තර රාජිත සේනාරත්න මහතා සභාව අමතමින්, ජාතික ගැටලු සම්බන්ධයෙන් කාදිනල් හිමිපාණන්ගේ නිර්භීත අදහස් දැක්වීම සහ මෙරට පිළිබඳව ජාත්‍යන්තරය දැනුවත් කිරීමෙහිලා එතුමාණන්ගෙන් ඉටුවන කාර්යභාරය අති ප්‍රශංසනීය බව පැවැසීය.

මීසම් සේවක, චමින්ද රෝෂන් ගරු පියතුමා ඇතුළු මීසම් ධර්ම සේවා සභාවේ ගොඩනැගිලි කමිටුව උත්සවය සංවිධානය කළේය.

මෙරිල් ශාන්ත ප්‍රනාන්දු

## සුබාසිංසන



ගාල්ල විශ්‍රාමික රදගුරු අතිඋතුම් එල්මෝ ජේ. පෙරේරා, අනුරාධපුර රදගුරු අතිඋතුම් නෝබට් එම් අන්ද්‍රාදි නි.ම.නි හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සංවත්සරයන් පිළිවෙලින් ජනවාරි 06 හා 10 දිනවලට යෙදේ. කුරුණෑගල විශ්‍රාමික රදගුරු අතිඋතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්ගේ නාමසාන්තුවර මංගල්‍යය ජනවාරි 07 ට යෙදේ. එතුමනට දේවාසිරි බහුලව ලැබේවායි. ප්‍රදීපය සුබාසිංසන පිරිනමයි.



එඩේරමුල්ල සාන්ත සෙබස්තියන් දෙව් මැඳුරේ ගීතිකා කණ්ඩායමේ 30 වන සංවත්සරය පසුගියදා සැමරීය. පසුව ඔවුන් මීසම් සේවක ගරු ප්‍රසන්න රොහාන් පියතුමා සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටියහ.

ශිරාන් උෟවගේ

# දේව වචනය තුළ දිනපතා ජීවත්වන්න

දේව වචනය අන් අයට කියාදීමේ වගකීම බාර ගන්න. දිනපතා ජීවිතයේදී කෙතෙක් දුරට දේව වචනයට සමීපද යන්න විමසා බලන්නැයි අනුරාධපුර සා. ජෝශප් ආසන දෙව් මැඳුරේ පැවැති දහම් ගුරු වාර්ෂික තුති දීමේ දිව්‍ය පූජා මෙහෙයේදී රජ රට රදගුරු අතිඋතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි හිමිපාණෝ ප්‍රකාශ කළහ.

අනුරාධපුර, පොලොන්නරු දෙදිසාවේ දහම් ගුරුවරුන්, පූජක පැවිදි සොයුරු සොයුරියන්, මෙන්ම දහම් පාසල් විභාග, තරග ආදියෙන් ජයග්‍රහණය ලැබූ දරු දැරියන් රැසක් සහභාගි වූ මේ උත්සව සභාවේදි ගරු පියතුමන් මෙන්ම පැවිදි සොයුරියන්ද විශේෂාංග ඉදිරිපත් කරමින් සභාව ප්‍රබෝධමත් කළ අතර දහම් ගුරු සේවය අගයමින් නත්තල් ත්‍යාග බෙදා දීමක්ද සිදුවිය.

අනුරාධපුර පදවියේ අපෝස්තලික සේවා කටයුතු භාර ගරු සරත් පීරිස් පියතුමන් විසින් 2014 වසර සඳහා සැලසුම් හා දහම් සේවා වගකීම් පිළිබඳව සභාව දැනුවත් කරන ලදී. මෙම වාර්ෂික උලෙළට සහභාගි වීමට මීසම් දහතුනකින් තුන් සියයකට ආසන්න ප්‍රමාණයක් පැමිණ සිටියහ.

ඩබ්. ඩී. මැටිල්ඩා අධිකාරම්



ගොඩැල්ල සා. සෙබස්තියන් දෙව් මැඳුරේ සේවක මංඩලයේ නව නිළධාරීන් පත්කිරීම මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් සහයක ගරු ධනුෂ්ක ප්‍රනාන්දු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදුවූ අතර එහිදී ඉදිරි වසර තුන සඳහා, සභාපති නිළ බලයෙන් මීසම් සේවක පියතුමා, උප සභාපති, සරත් තිසේරා, ලේකම් පූර්ණ අප්පුහාමි, උප ලේකම් එච්. ඒ. සිරිල් පෙරේරා, භාණ්ඩාගාරික ඩී. රවිල් පෙරේරා, උප භාණ්ඩාගාරික පැට්රික් ප්‍රනාන්දු පුල්ලේ යන මහත්වරුන් පත් වූ අතර හත්දෙනෙකුගෙන් යුත් කාරක සභාවක්ද පත් කරගන්නා ලදි. ගොඩැල්ල දේවස්ථාන සේවක මංඩලය පදවි අනුනායක අතිගරු පීටර් චාල්ස් සහ මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමන් සමග ප්‍රදීප කැමරාව හමුවේ.

# නත්තල් අරුතට මුල්තැන දුන් 'උඳුවප් මිහිර' ප්‍රතිභා සම්මාන උලෙළ

1976 වසරේදී ප්‍රථම වතාවට ගරු අර්නස්ට් පෝරුතොට පියතුමන්ගේ අනුශාසකත්වයෙන්, කළුතර, කළමුල්ලෙන් එළියදුටු උඳුවප් මිහිර වාර්ෂික නත්තල් කලාපයේ 37 වන දිගහැරුම දින එහි වත්මන් සංස්කාරක වරුන් වන මැක්ෂිමස් රෝයි පෙරේරා සහ ශිරාන් මෛත්‍රී දෙපළගේ මගපෙන්වීම යටතේ සිදුකැරිණ.



ගරු ලිලියන් මැටිල්ඩා තන්ත්‍රිආරච්චි පැවිදි සොයුරිය හා ගරු ජෙරල්ඩ් විනීෂියස් ප්‍රනාන්දු පියතුමා ප්‍රතිභා සම්මානයෙන් පිදුම් ලැබූ අයුරු.

සේයා - ලෙනාඩ් හපුආරච්චි

2013 ප්‍රතිභා ප්‍රණාම සම්මාන උලෙළ ජා-ඇල කලාපීය නාහිමි අතිගරු ශාන්ති කුමාර වැලිවිට පියතුමාගේ ප්‍රධානත්වයෙන් ජාඇල නගරාධිපති උපාලි අරඹවත්ත මහතා ඇතුලු ගිහි පැවිදි රැසකගේ සහභාගීත්වයෙන් ජා-ඇල නගරසභා පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී අගරදගුරු පදවි විවාහ අධිකරණ නාහිමි අතිගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා, ගරු ලිලියන් මැටිල්ඩා තන්ත්‍රිආරච්චි පැවිදි සොයුරිය ප්‍රමුඛ පන්හිඳෙන් ජනතාව දැනුවත් කළ, ජන හදවත් අවදිකළ, සත්‍ය දේම දැයට රටට හෙළිකල ලේඛක ලේඛිකාවන් 25 (විසිපස්) දෙනෙකු උඳුවප් මිහිර ප්‍රතිභා ප්‍රණාම සම්මානයට පාත්‍රවිය.

මේ සබැඳිව පණිවුඩයක් ලබාදෙන කොළඹ අගරදගුරු අතිඅතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ නත්තල් සුබාසිංසන පණිවුඩයෙන් උඳුවප් මිහිර සඟරාවේ සම සංස්කාරක කර්තව්‍යයට අතදෙන ගිහියන් දෙදෙනා විසින් ඉටුකෙරෙන මෙහෙය ආශිර්වාදාත්මක බවත්, කිසිම දිනෙක සම්මානයකට පාත්‍ර නොවූ ලේඛක පරපුර සම්මානයෙන් පිදුම් ලැබීමට තෝරාගත් එකම සංවිධානය උඳුවප් මිහිර සඟරාව බවත්, දිවයින පුරා විසිරී සිටින කතෝලික ලේඛක ලේඛිකාවන් අගය කරන බවත් එතුමාගේ කෙටි පණිවුඩයේ සඳහන් විය.

උඳුවප් මිහිර 2013 නත්තලට සමගාමීව තවත් යෝද පිම්මක් පනිමින් දෙසැම්බර් 22 වන දින නත්තල දුගී දුප්පත් නැති බැරි අය සමග බෙදාගැනීමේ සංකල්පය පෙරදැරි කර ගනිමින් අනුරපුර, තලාව ගම් පියසේ සමාජ මෙහෙවරක නියැලිව සිටි සමාජ සේවිකාවක වන මැටිල්ඩා අධිකාරම් මහත්මියගේ ඇරියුමක් මත අසරණ පවුල් 60 ක් සමග පාසල් පොත්, වියලි ආහාර, ඇඳුම් පැළඳුම් ඇතුළු එදිනෙදා ජීවිතයට ඇවැසි දේ බෙදා දීමට පියවර ගෙන තිබිණ. මෙම සමාජ සත්කාරයට ගරු ජයලත් බලගල්ල පියතුමා, ජා-ඇල නගරාධිපති උපාලි අරඹවත්ත මහතා ප්‍රමුඛ ගිහි පැවිදි රැසක් සහභාගී වූහ.

වැලිවිට එම්. ජෝ පාරිස්

## මහනුවර රදගුරු වසමේ නව පත්වීම්

මහනුවර රදගුරු අතිඋතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන් විසින් පහත දැක්වෙන පත්වීම් වහාම ක්‍රියාත්මක වනසේ සිදුකරනු ලැබීය.

ගරු ඉග්නේෂස් සමරකෝන් පියතුමා (මාතලේ දිසාවේ ජනවන්දනා සම්බන්ධීකාරක), ගරු ලෙස්ලි පෙරේරා පියතුමා නුවරඑළිය දිසාවේ කරිටාස් මහනුවර සම්බන්ධීකාරක, ගිහි සහ පවුල් සේවා සම්බන්ධීකාරක ගරු ලලිත් ටී අමරසිංහ පියතුමා (මහනුවර දිසාවේ තරුණ කටයුතු සම්බන්ධීකාරක), ගරු වයි. සත්කුණරාජා පියතුමා (නුවරඑළිය දිසාවේ තරුණ කටයුතු සම්බන්ධීකාරක). ගරු ඒ. ඩොමිනික් රාජ් පියතුමා (නුවරඑළිය දිසාවේ ධර්මදූත සේවා සම්බන්ධීකාරක)

## දහම් ගුරුවරයා සැමවිටම මාර්ගෝපදේශකයකු විය යුතුයි



**දහම් ගුරුවරුන් වශයෙන් සේවය කිරීම දෙවිඳුන්ගේන ලත් විශේෂිත කැඳවීමක් වන හෙයින් දහම් ගුරුවර ගුරුවරියන් සැමවිටම දරුවන් ඉදිරියේ මාර්ගෝපදේශකයන් විය යුතු වේ. දහම් ගුරුවර ගුරුවරියන්ට මාර්ගෝපදේශකයකු යන නම වඩාත් සුදුසු වේ යයි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණෝ කොළඹ අගරදගුරු පදවියේ නැගෙනහිර කලාපයේ දහම් ගුරු නත්තල් සුහද හමුවේදී පැවසූහ. මෙම හමුව මොරගොඩ සා. සෙබස්තියන් දේවස්ථානයේ දහම් ශාලාවේදී පැවැත්විණ.**

එහිදී තවදුරටත් කථා කළ අගරදගුරු හිමිපාණෝ ධර්මෝපදේශය දීම වූ කලී ක්‍රිස්තු අභිරහසේ සමස්ථ පරිමාණයන් අධ්‍යයනය කිරීම වෙත යම් කෙනෙකු ගෙනයාමය. ක්‍රිස්තු අභිරහසේ අරමුණු ක්‍රියාත්මක කරනු ලබන ආකාරය එළිදරව් කිරීමය. සියලු සැදැහැවතුන් වෙත ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයේ පණිවිඩය වටහාදීමය. දහම් පාසල තුළින් විභාගය සඳහා ඉහළ ලකුණු ලබාගැනීමට සිසුන්ව යොමු කිරීමට වඩා ක්‍රිස්තු පෞරුෂත්වය තුළ ජීවිත ගොඩනැගීම වැදගත්ය. සැබෑ කිතුනුකමට සාක්ෂි දරන්නන් බිහිකිරීම අද දහම් පාසල තුළින් කළ යුතුවේ.

එදින උදේ වරුවේ දිව්‍ය පූජාව කොළඹ සහායක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් විසින් පවත්වන ලදි. ගම්පහ සහ ගුරු බැව්ල දිසාවල දහම් සේවා භාර අධ්‍යක්ෂ පියතුමන්ලාද, දිසාවන්හි ප්‍රධාන පියතුමන්ලාද, මීසම් භාර පියතුමන්ලාද රැසක් සහභාගි වූහ.

නැගෙනහිර කලාපයේ මාහිමි අතිගරු සිරිල් ගාමිණී පියතුමා ද ධර්මදූත කලාපයේ ධර්මෝපදේශ හා බයිබල් දූත සේවා අධ්‍යක්ෂ මංජුල නිරෝෂන් පියතුමා ද, දෙමළ අංශයේ සම්බන්ධිකාරක ගරු කළණ පීරිස් පියතුමාද උත්සව කටයුතු සම්බන්ධිකරණය කරන ලදි. මොරගොඩ මීසම්පති ගරු රවීන් සඳසිරි පෙරේරා පියතුමා දහම් ගුරු සුහද හමුව සංවිධානය කිරීමට ඉමහත් පරිශ්‍රමයක් දැරීය.

ජූඩ් රවින්ද්‍ර විනයසිරි පෙරේරා

## ගුරුබැව්ල දිසා සිරිහඳ නත්තල් විවිධ ප්‍රසංගය

ගුරුබැවිල සිරිහඳ දිසා අධ්‍යක්ෂ ගරු මැක්ෂිමස් රුද්‍රිගු ප්‍රනාන්දු පුල්ලේ සහ හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා දිසා සිරිහඳ සමිතිවල සංවිධානයෙන් නත්තල් විවිධ ප්‍රසංගයක් පැවැත්වුනු අතර හංවැල්ල අවිස්සාවේල්ල, වග, තරාල මීසම් වල සැම සභාවකින් කැරොල් ගායනා, නර්තන, නාට්‍ය විරිදු ආදි අංග ඉදිරිපත් කැරිණ.

ඇග්නස් විජේතුංග



මරිය වසර වෙනුවෙන් දියලගොඩ මීසමෙන් කුමරි මරියාවන්ට පිදෙන තිළිණයක් ලෙස 'උපතක මහිමය' නත්තල් ගී ප්‍රසංගය පසුගියදා පවත්වන ලදී. රමණීය පරිසරයකින් යුත් දියලගොඩ ගාළු පාර අසල පිහිටි ගංතෙරදී පවත්වන ලද මෙම උලෙළේ ප්‍රධාන ආරාධිතයා වූයේ, ධර්මදූත කටයුතු පිළිබඳ කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමාණන්ය. දරු දැරියන්ගේ දස්කම් මනාව පිළිබිඹු කළ මෙම ප්‍රසංගය, ප්‍රවීන නාට්‍ය කලාකරුවන්වූ ජෝසප් ඒ ඩයස්, ලෙනාඩ් කුරේ මහතුන්ගේ පූර්ණ අධීක්ෂනයෙන් ඔපවත්වුනි. මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ සංකල්පයක් අනුව මෙම නත්තල් ගී ප්‍රසංගය අරුත්බරව ගෙන ඒමට දියලගොඩ තරුණ සමිතියේ දායකත්වය හා කැපවීම අගය කළ යුතුය.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

ශ්‍රද්ධානාත් ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com
ක්‍රිස්තු වර්ෂ 2014 ජනවාරි 05 ඉරිදා

# එකිනෙකාට සංවේදි නොවීමෙන් ගැටුම් ඇතිකර ගන්නෝ

2014 නව වසර අරබයා අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියා ප්‍රබල ලෝක සාම පණිවිඩයක් නිකුත් කර ඇත. "සාමය කරා යන ගමනේ පදනම සහෝදරත්වයයි" යන අභියෝගයේ තේමා පාඨය ඔස්සේ නිකුත් කර ඇති මේ සාම පණිවිඩය අද ලෝක බලවතුන් සසල කිරීමට හේතුවක් වී ඇති බවට කිසිදු සැකයක් නැත. අරාජික සිරියාවේ දේශපාලන නායකත්වය සසලව නම්‍යශිලි වූයේද සසුන් පියාගේ මේ ප්‍රබල සාම පණිවිඩය නිසාම බවද සිහිපත් කළ යුතුයි. ජාති, ආගම්, කුල බේද අභිබවා සහෝදරත්වය වෙනුවෙන්ම කැප වන්නට සසුන් පියා කර ඇති ආරාධනාව පිටු දකින්නට අද කිසිවෙකුටත් හැකියාවක් නොමැති බවද සිහිපත් කළ යුතුව ඇත.

ලෝකය සුන්දර කළ හැක්කේද මිනිසාටයි. අසුන්දර කළ හැක්කේද මිනිසාටයි. බල තන්හාව, අධික ලෝභය හා කාම භෝගි ජීවිතය තුළ තමන් රැකෙන්නටත් අනුන් නසන්නටත් හැල්මේ දිව යන මිනිසා එකී ගමන නොනවතින ගමනක් බවට අද සම්පූර්ණයෙන්ම පත් කර ගෙන ඇත. සසුන් පියා හට මේ පිළිබඳව නිර්භයව කථා කරන්නට අද ලැබී ඇති ශක්තිය සිය නිරවුල් හා සරල පැවැත්මෙන්ම ලැබී ඇති නිසා ලෝක ප්‍රබල නායකයින්ට මේ අභියෝගය ඉදිරියෙ දෙවරක් නොව දහස් වාරයක් කල්පනා කර බලන්නට සිදුවී තිබේ. බල තන්හාව හා බලය තුළ ඒකරාශි වීම හරහා බලය ඇත්තන් පළුදු කරන්නේ සහෝදරත්වයේ මූලික වටිනාකමයි. සහෝදරත්වය නොමැති තැන පවුලක් නැත. සාමුහික අත් දැකීමක් නැත. පොදු ගමනක උන්නතියක් නොමැත. එම නිසාම සසුන් පියා පවසන මේ වදන් එකිනෙකාගේ ආගමික විශ්වාසය තුළ කිරා මැන බලන්නටද එකිනෙකාම හැකියාවක් ඇතිකරගන්නේ නම් ලෝකය මෙයට වඩා සුන්දර වනු ඇත යන්න පොදු ජනයාගේ මතයයි. ඒ නිසාම ජගත් බලවතුන් හමුවේ නොව සසුන් පියා වටා එක්රොක් වන්නට විවිධ ජාතින් දක්වන කැමැත්ත 2014 වසර ලෝක දේශපාලනය උඩුයටිකුරු කරන්නට යම් නිමිත්තක්ද ඇති කර තිබේ. 2013 වසරේ හොඳම පුද්ගලයා ලෙස සසුන් පියා තේරී පත් වීම පසුපස ඇති කථාන්දරයත් එයට අද කදිම නිදසුනක් වී ඇති බවක් පෙනේ.

සසුන් පියාගේ සාම පණිවිඩය ඔස්සේ ශුද්ධ වු බයිබලයේ කායින් හා ආබෙල්ගේ ජීවිත සම්බන්ධයෙන් දක්වා ඇති කථා පුවතද අදට වඩාත් සමීපව අර්ථ ගන්වන්නට කතෝලික සසුනට ලැබී ඇති අයිතියද සුලු කොට තැකිය යුතු නොවේ. කායින් හා ආබෙල්ගේ ජීවිත කථාවෙන් සහෝදරත්වය සඳහා අප තුළ කිඳා බැසගත් කැඳවීමක් ඇති බැව් නව ආරකින් අනාවරණයක්ද කරනු ලබයි. එලෙස එම සහෝදරත්වයේ කැඳවීම අපහරණය කිරීමේ දුෂ්ට හැකියාවන් ද අප තුළ තිබෙන බව සසුන් පියා මෙකී සාම පණිවිඩයෙන් මතක් කරන්නේද එබැවිනි.

2013 වසරේ අවසන් දින නිකුත් වූ 'ලංකාදීප' පුවත් පතට විශේෂ සාකච්ඡාවක් ලබාදුන් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ද අප රට අරබයා මෙබඳුම මතක් කිරීමක් කර තිබේ. වර්තමානයේ පවත්නා ආර්ථික අර්බුදය ජයගැනීම සඳහා ආර්ථිකය තුළ සහෝදරත්වය ස්ථාන ගත දැයි සොයා බලන ලෙස සසුන් පියා කරන මතක් කිරීම කාදිනල් හිමිපාණන් ජාතිය. ජාතිකත්වය හා ජාති වාදය තුළට සහෝදරත්වය ස්ථාන ගත වන්නේ කුමන අයුරකින්දැයි ප්‍රශ්න කිරීමක් කරයි. සහෝදරත්වය ආගමික විශ්වාසයෙන් හා ගැඹුරු ආධ්‍යත්මිකත්වයෙන් නිබඳව පෝෂණය වන්නේ නම් අද බල පවත්නා සියළු අර්බුද ජය ගත හැකි බව මේ කතෝලික නායකත්වයේ ප්‍රබල මතක් කිරීම තවදුරටත් හෑල්ලු කිරීම තවත් අපේ කාලයේ නිස්සාර කථාවක් විය යුතු නැත.

සහෝදරත්වය විසින් නිදහස් හා සාධාරණත්වය අතරද පෞද්ගලික වගකීම හා සහයෝගිතාවය අතරද, පෞද්ගලික යහපත හා පොදු යහපත අතරද සමතුලිතතාවය ඇති කොට සමාජ සාමය ඇති කරන බව මතක් කරන එකම ආගමික ආයතනය කතෝලික සභාවම බව අද ලෝකය නැවත තහවුරු කර ඇති මෙවන් සමයක සහෝදරත්වය අත් දැකීමටත්, ආදරය අත් විඳීමටත් 2014 වසර අපිත් යොදා ගත යුතු බව දැඩිවම අවධාරණය කරමු. එතුළින් එකිනෙකාට සංවේදි නොවීමෙන් ගැටුම් ඇතිකර ගන්නට වෙර දරන අන්තවාදින් පිටු දකින්නට කාහටත් ශක්තියක් ඇති වන බවත් තහවුරු කර ගනිමු.

# මිනිසාට අභියෝගයක් වන නත්තල




**පසුගිය සතියෙන්.....**

අපට අප සමග වන දෙවි කෙනෙක් ඇත. ප්‍රඥාවන්තයන්ට පමණක් මෙම පුදුමය සොයා ගත හැක. තරුව දැක ගත හැක්කේ ඔවුනට පමණි.

ජුදෙව්වන්ට එය ප්‍රලාපයකි අන්‍ය ජාතිකයනට එය අඥුවනකමකි. එහෙත් විශ්වාසයෙන් ප්‍රඥාවෙන් ආශිර්වාද ලත් අයට එතුමා දෙවියන් වහන්සේගේ බලය හා ප්‍රඥාව වන සේක. (1 කොරින්ති 1:25 බලන්න). එතුමාගේ උපත හා මරණය සියළු මිනිස් සිතිවිලි වලට අභියෝග කරයි. වෙනස් කළ නොහැකි දෙවි කෙනෙක් කෙසේද බිහි වන්නේ? දෙවි කෙනෙක් නොවේද මරණයට පත්වන්නේ? ගව ඔරුව තුළ බිහි වූ මෙම දරුවා ප්‍රතිමා කඩා බිඳ දමන ප්‍රථමයා වේ. එතුමාගේ වැඩ සිටීම මගින් මිනිස් අතින් නිර්මාණය වුනු සියළු දේව පිළිමයන් බිඳ දමනු ලබයි. ශත වර්ෂයන් පුරා මිනිස් අතින් නිර්මාණය වුනු සියළු චිත්‍රයන් එතුමා විසින් කෑලි කෑලි වලට ඉරනු ලබයි. මිනිසුන් විසින් සාදනු ලබන දෙවියන් මිනිසුන් විසින් හසුරුවනු ලැබිය හැකි දෙවියෙකි. එමනිසාම ඔහු දෙවියෙක් නොවී මිනිසා විනාශ කරනු ලබන බලවේග යනට සහය දෙන දේශපාලනික ආගමික බලවේගයන් විසින් පාලනය කළ හැකි අත්‍යවශ්‍ය සංඛේතයක් පමණක් බවට පත්වේ.

මෙවන් දෙවි කෙනෙකුගේ නාමයෙන් යුද්ධයන් ක්‍රියාත්මක කළ හැක. එවන් දෙවියෙක් නමින් ජනතාව ගැති බවට පත්කිරීමට, භේද කිරීමට, වෙනස් අයුරින් සැලකීමට, යටත් විජිතයක් කිරීමට හා මිනිස් ගරුත්වය මුළුමනින් නැති කිරීමට ඔවුනට හැකිවනු ඇත. එහෙත් සැබෑ දෙවිඳාණෝ තමන් මිනිසුන්ගේ දිවි පැවැත්ම තුළ ගැඹුරින් සම්බන්ධ වෙන වග අනාවරණය කරයි. මෙම 'එම්මානුවෙල්' අප සමග වන දෙවිඳාණෝ, මිනිසා සතුන් මෙන් ශීලෑ කළ යුතු හා භාවිත කළ යුතු හා සැලකිය යුතු කොටසක් නොවන වග අනාවරණය කරයි. ඔවුන්ගේ කැඳවීම වන්නේ පළමු කොටම තරුව දෙස බලා, ඉන්පසු තරුව විසින් යොමුකරවනු ලබන තැනැත්තා වෙත ළඟා විය හැකි මාර්ග නිරන්තරවම සොයා යෑමයි. ඔවුන්ගේ ජීවිතයේ සෑම සියළු සංසිද්ධි හරහා එළඹ සිටින තරුව ගැන අවධියෙන් සිටිය යුතු වේ. එම සංසිද්ධිය හා ජීවිත තත්ත්වයන් මධ්‍යයේ ළදරුවා සොයාගෙන උන්වහන්සේ වැඳ නමස්කාර

> **ගවලෙන තුළ බිහිවු දරුවා බැහැදැකීමට පැමිණි එඬේරුන් හා ප්‍රශංසා ගීත ගායනා කළ සුරදුතයන් ගෙන් තොරව නත්තල් කථාන්තරය සම්පූර්ණ නොවේ. සුරදුතයා විසින් සකල මිනිස් සංහතියට අත්වෙන ගැළවීම පිළිබඳ සුබාරංචිය ප්‍රකාශ කරනු ලබති. ඉන්පසු සුරදූත සමූහයා විසින් ගායනා කළ ගීතිකා මගින් ජේසු කුමරුන් කරණකොට මිනිසුන් හා ලෝකය තුළ උත්පාදනය වෙන සාමය, සංහිඳියාව ඉඟි තරනු ලබයි. එම ගීතය කුලය, පන්තිය ඇඳහිල්ල හෝ ලිංගය හේතුකොට හටගන්නා බෙදීම්. විභේදනයන් හා වෙනස්කම් කිරීම් වලින් තොර නව දැක්මක් තුළ නැගී සිටිය හැකි සැම මිනිසකුටම ගායනා කළ හැකි ගීතයකි.**

කොට, දෙවියන් වහන්සේගේ ගැළවීමදායක වැඩසිටීම විනාශ කරන්නට මාන බලන බලවේග යන්ට යටපත් නොවී සිටින්නට වෙර දැරිය යුතුය.

තමන්ගේ දුෂ්ට සැලැස්ම වලට බාධාවක් ලෙස දෙවියන් සලකන ලෝකය තුළ ඇති සියළු බලවේගයන් හා තමන්ගේ රැවටිලි සහගත සතුට ලඟාකර ගැනීමට බාධාවෙන සියළු දේ විනාශ කරන නොමිනිස් ගති පැවතුම් සියල්ල හෙරෝද් රජු විසින් නියෝජනය කරනු ලබයි. ශ්‍රේෂ්ඨත්වය මිලට ගන්නා විට, හමුදා බලය මගින් හා ආර්ථික බලය මගින් අන් අය යටපත් කොට තමා ඉස්මතු කර ගන්නා විට, දුෂ්චරිතය ඉස්මතු වී අවමානය හා පහත වැටීම ඉබේ සිදුවේ. ජුදයාවේ රජු ලෙස හෙරෝද් පත් කරන ලද්දේ විදේශිය බලවේගයන් වන රෝමවරුන් විසිනි. එම බලය රැක ගැනීම සඳහා ඔහු විසින් සිය බිරිඳ හා ඔහුගේ දරුවන් මරා දමන ලදී. බලය අප අන්ධ කරවයි. බලය විසින් කෙනෙකු අන්ධ කරන විට මිනිස් සබඳතාවල අගයන් නොපෙනේ. එවිට රහස්ගත කුමන්ත්‍රණය සැලසුම් කෙරේ. කපටිකම හා බොරු නැතිනම් අර්ධ සත්‍යයන් භාවිත කෙරේ. ලියැකියවිලිවලට අලුත් දේ. හොර රහස් එකතු කෙරේ. මිනිසුන් මැරීම හා විනාශ කිරිම සඳහා රාජ්‍ය දූත සේවා මාධ්‍යයන් අනිසි ලෙස හසරුවා ගැනේ. සමහර මිනිසුන් ජීවත් විය යුතුද නැද්ද තමන් ජීවිතය හසුරුවන ආකාරය වෙනස් නිසා හෝ ඔවුන් වෙනත් ආගමකට, මහ වාදයකට, වාර්ගික කොටසකට, භාෂාවකට අයත් නිසා එවැනි දේශයන් ආක්‍රමණය කර විනාශ කළ යුතුද නැද්ද ගැන තීරණය කරන බලවේගයන් සඳහා අල්තාර ගොඩ නගනු වස් සැබෑ දෙවියන්ගේ වැඩසිටීම විනාශ කළ යුතුවේ.

ජීවත් වීමට අයිතිය ඇත්තේ කාටද යන්න තීරණය කිරීමට තමන්ට බලය ඇති වග විශ්වාස කරන අය දෙවිවරු මෙන් ක්‍රියා කරන්නට පෙළඹෙති. හෙරෝද්වරුනට දවස ගිය කල, ඔවුන්ට රිසි දේ ඔවුන් කරන කල, රාමා වල විහරක් නොව සිරියාවේ. ඇෆ්ග නිස්ථානයේ, ජෙරුසලමේ, යාපනයේ මං මාවත් පවා රාබෙල්ලා වැලපෙනු ඇත. එහෙත් මේ ලෝකයේ හෙරෝද්ලා නොතකමින් දෙවියන් වහන්සේගේ වැඩ සිටීමට ප්‍රතිචාරය දක්වන අය දෙවියන් වහන්සේ අප සමග "එම්මානුවෙල්" නිසා පූර්ණ ලෙස මිනිසුන් වෙනු ඇත. එතුමාණෝ බලාපොරොත්තු රහිත හා පිළිසරණක් නැති තත්ත්වයට බලාපොරොත්තුව ලබාදෙන සේක. උන්වහන්සේ ආදරයම වන නිසා අප සමග දුක් විඳින සේක.

ගවලෙන තුළ බිහිවු දරුවා බැහැදැකීමට පැමිණි එඬේරුන් හා ප්‍රශංසා ගීත ගායනා කළ සුරදුතයන් ගෙන් තොරව නත්තල් කථාන්තරය සම්පූර්ණ නොවේ. සුරදුතයා විසින් සකල මිනිස් සංහතියට අත්වෙන ගැළවීම පිළිබඳ සුබාරංචිය ප්‍රකාශ කරනු ලබති. ඉන්පසු සුරදූත සමූහයා විසින් ගායනා කළ ගීතිකා මගින් ජේසු කුමරුන් කරණකොට මිනිසුන් හා ලෝකය තුළ උත්පාදනය වෙන සාමය, සංහිඳියාව ඉඟි තරනු ලබයි. එම ගීතය කුලය, පන්තිය ඇදහිල්ල හෝ ලිංගය හේතුකොට හටගන්නා බෙදීම්. විභේදනයන් හා වෙනස්කම් කිරීම් වලින් තොර නව දැක්මක් තුළ නැගී සිටිය හැකි සැම මිනිසකුටම ගායනා කළ හැකි ගීතයකි. එම දැක්ම දෙවිඳුන්, මිනිසුන් හා ලෝකය අතර ඇතිවෙන අන්තර් සම්බන්ධතාවයක දැක්මකි. නත්තල් කථාන්තරය තුළ හමුවෙන එඬේරුන් මෙන් එම අය එම දැක්ම දැකීමට භාග්‍යවත් වනු ඇත. තමන් පෝෂණය කරනු ලබන පොළවට හා ඔවුන්ගේ ගව බැටළුවන් සමග සම්බන්ධවීමට එඬේරුනට හැකියාව ඇත. තමන් පෝෂණය කරනු ලබන මහ පොළොව හා තමන්ව ආරක්‍ෂා කරන හා සුරක්ෂිත කරන දෙවියන් සමග තම ජීවිත එකට වෙලී ඇති බව ඔව්හු අවබෝධ කර ගනිති.

නත්තල මගින් සනිටුහන් කරනු ලබන්නේ සියළු දෙනා වෙනුවෙන් එක වරක් පමණක් සිදුවෙන දේව අනාවරණයයි. අසමසම ලෙයින් උන්වහන්සේගේ පැවැත්ම අප සමග වන සේක. සිය ඉතිහාසය තුළින්ම එහි ඉරණම පෙන්වා දිය හැකි. උත්තරීතර දෙවි කෙනෙක් ගැන මිනිසුන්ට කවදාවත් හිතාගත නොහැකිය.

**ගරු විලියම් ඉවාන්ස් ලියනාරච්චි පියතුමා**
**ජාතික දෙව්සත්හල - අම්පිටිය**

## කැමිලස්ගේ —— තිත්ත ඇත්ත






# තරුණ පරපුර ක්‍රිස්තු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවිය යුතුයි

## විශ්‍රාමික අගරදගුරු හිමිපාණෝ අවධාරණය කරති

**"අගරදගුරු පදවි 2013 නත්තල් ගවලෙන් නිර්මාණ තරගය හා ප්‍රදර්ශනය නැරඹීමේදී මනාව පෙනීගියේ, බහුතර තරුණ පිරිසගේ උනන්දුව හා උද්යෝගය. තරුණ පරපුර අපගේ අනාගතය යි. තරුණයන් අද මෙම ප්‍රදර්ශනය තුළින් සමාජයට විශාල පණිවුඩයක් ලබා දුන්නා. ඒවාගේම තමන් ද ඒවා පිලිපැදීමට උනන්දු වීම වැදගත් වෙනවා. විශේෂයෙන් තරුණ පරපුර රටට, දැයට, සමාජයට ක්‍රිස්තු ප්‍රතිපත්ති අනුව සේවය කිරීමටත්, එම ප්‍රතිපත්ති ජීවිතය තුළ ක්‍රියාවට නැංවීමටත් හිතට ගැනීම අත්‍යවශ්‍යයි."**

විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් එසේ අවධාරණය කළේ රාගම ශු. පේදුරු හා පාවුළු දෙව්මැඳුරු පරිශ්‍රයේ දෙදිනක් මුළු දුන් කොළඹ අගරදගුරු වසමේ මහා ගවලෙන් නිර්මාණ තරගය හා ප්‍රදර්ශනය අවසානයේ දී එතුමන් හා විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් නික්ලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති සමාප්ත උලෙළේදීය.

කොළඹ අගරදගුරු වසමේ නව ධර්මදාන වැඩ පිළිවෙල යටතේ ක්‍රියාත්මක වන සදහම් සජීවක මෙහෙවර, තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය, Jesus youth සංසය සහ රාගම මීසම ඒකාබද්ධව මෙම තරගය හා ප්‍රදර්ශනය "ජේසු සමිඳුනි! ඔබවහන්සේ අද අප අතර උපන්නේ නම්....." තේමාවෙන් සංවිධානය කර තිබුණි. කොළඹ අගරදගුරු අතිඅතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ද මෙම ප්‍රදර්ශනය නැරඹීමට පැමිණියහ. අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්, අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් හා පූජක, පැවිදි, ගිහි විශාල පිරිසක් මීට සහභාගි වූහ.

තරගය සංවිධානයේ දී ගරු සිසිල් ජෝයි පෙරේරා, ගරු ගිහාන් ගුණතිලක, ගරු ජූඩ් ලක්ෂ්මන් අගරදගුරු පදවි ජනවන්දනා අධ්‍යක්ෂ ගරු ඉන්ද්‍රජිත් පෙරේරා, ගරු ඇන්ටන් දිනේෂ් පියතුමා හා මියුරු මුතුතන්ත්‍රි මහත්මා සුවිශේෂී මෙහෙවරක් කළහ.

තරග ප්‍රතිඵළ මෙසේය : වයස අවුරුදු 16 න් පහළ ප්‍රථම ස්ථානය - බලගල සදාසරණ දේවමාතා පූජා උදව් සමිතිය (රු. 100000.00), 2 වන ස්ථානය - කේ. මදාරා නිෂාදි ප්‍රනාන්දු (රු. 50000.00), 3 වන ස්ථානය - කොළඹ 10, සියළු සාන්තුවරයින්ගේ බාලිකා මහ විදුහල (රු. 25000.00),

වයස අවුරුදු 16 න් ඉහළ ප්‍රථම ස්ථානය - එම්. ඇන්ජලෝ රනිල් ශ්‍රීමාල් (රු. 100000.00), දෙවන ස්ථානය - ශ්‍රී ලංකා නාවික හමුදාවේ කතෝලික සංගමය (රු. 50000.00), තුන්වන ස්ථානය පියල් ජයකොඩි (රු. 25000.00)

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**



බලගල කණ්ඩායම (සේයා - තිළිණ අලහකෝන්)



පියල් ජයකොඩි මහතාගේ ගවලෙන (සේයා - අශේන් සේනාරත්න)

## දේව මාතා වර්ෂය සඳහා කෙටි පාඨමාලා

කොළඹ භාග්‍යවත් ජුසේ වාස් දේව ධර්ම නිකේතනය මගින් "මරිය මාතා වර්ෂය" සඳහා කෙටි පාඨමාලා තුනක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඉන් පළමුවැන්න "මරියෝත්තමාව පිළිබඳ කතෝලික සභාවේ ඉගැන්වීම් යන තේමාව යටතේ 2014 ජනවාරි 14 සිට අප්‍රේල් 08 දක්වා සවස 4.30 සිට 6.15 දක්වා අඟහරුවාදා දිනයන්හිදී පැවැත්වේ. ගිහි පැවිදි සැමට මීට සහභාගි විය හැකිය.



2013 වසරේ නත්තල සැමරීම වෙනුවෙන් ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශය විසින් රු. 5ක සහ රු. 30ක වටිනාකමකින් යුත් නව තැපැල් මුද්දර 2ක් සහ සිහිවටන පත්‍රිකාවක් නිකුත් කිරීම ඉකුත් දා හලාවත කාර්මෙල් මාතා ආසන දෙව් මැදුරේදී අග්‍රාමාත්‍ය දි. මු. ජයරත්න මහතා හා හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. එම අවස්ථාවේ දී වයඹ නියෝජ්‍ය තැපැල්පති හේමචන්ද්‍ර හේරත් මහතා අතින් අග්‍රාමාත්‍යතුමාට හා රදගුරුතුමන්ට මුල් දින කවර නිකුත් කළේය. එම අවස්ථාවට විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය නියෝමාල් පෙරේරාණී බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය එම්. කේ. ඩී. එස්. ගුණවර්ධන මහත්වරුන්, ගරු පියවරුන්. පැවිදි සොයුරියන් ද එම අවස්ථාවට සහභාගී විය.

පර්සි ප්‍රනාන්දු

## බුත්ගම්පල විදුහලේ නත්තල් උලෙළ

හලා/ වෙන්/ බුත්ගම්පල රජයේ විදුහලේ නත්තල් උත්සවය පසුගිය දින විදුහල් ශාලාවේදී පැවැත්විණි. ඉරබඩගම මීසම් සේවක කුරුණෑගල පදවි කුඩා කිතුනු සංස අධ්‍යක්ෂ ගරු රූපස් හිලරි පියතුමා විසින් මීසමේ කිතුනුවන් ඒකක වලින් පිරිනමන ලද අභ්‍යාස පොත් පාසලේ සියලුම දරුවන්ට තෑගි ලෙසින් රැගෙන එන ලදී.

හලාවත පදවි කතෝලික අධ්‍යාපන අධ්‍යක්ෂ ගරු ඩිලාන් ප්‍රනාන්දු පියතුමා මෙහි ප්‍රධාන අමුත්තා ලෙසින් සහභාගි වූ අතර වෙන්නප්පුව අධ්‍යාපන කොට්ඨාසයෙ භාෂා හා මානව ශාස්ත්‍ර සහකාර අධ්‍යක්ෂ ඒ. ආර්. උපාලි රණසිංහ මහතාද සහභාගි විය. විදුහලේ කතෝලික සංගමය විසින් සංවිධානය කළ මේ නත්තල් උත්සවයට බොදුනු දරුවෝද මිහිරි ලෙසින් කැරොල් ගායනයට හා අනෙකුත් විශේෂාංග සඳහා සහභාගිවීම ග්‍රාමයේ සියළු දෙනාගේම මහත් ප්‍රශංසාවට හේතුවක් විය.

බොදුනුවකු වන විදුහල්පති එන්. එම්. ජිනදාස මහතාගේ පූර්ණ අනුග්‍රහය මේ සඳහා ලැබී තිබුණි. ඉරබඩගම කන්‍යාරාමයේ ගරු ක්ලැරිස්, ගරු ඈන් යන පැවිදි සොයුරියන්ද මේ සඳහා සහභාගි විය.

පෝල් විජේතුංග



ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ කතෝලික සංගමය විසින් ප්‍රථම වතාවට සංවිධානය කරන ලද නත්තල් දේව මෙහෙයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වු කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ව පිළිගෙන කැඳවාගෙන පැමිණි අයුරු. නත්තල් කැරොල් ප්‍රසංගයටද එතුමා සහභාගි විය.

ඇන්ටනි කෲස්

## ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ නත්තල් උලෙළ

නත්තල් උත්සවය සැමරීම වෙනුවෙන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සංවිධානය කළ නත්තල් උත්සවය ඉතා උත්කර්ෂවත් අන්දමින් මෙවර එම අමාත්‍යාංශ පරිශ්‍රයේදී සිදුකරන ලදී.

අගරදගුරු පදවි විශේෂ ව්‍යාපෘති පිළිබඳව කලාපීය නාහිමි අතිගරු අයිවන් පෙරේරා හා මරදාන මීසම සේවක ගරු ඇන්ජලෝ විජේවික්‍රම නි.ම.නි පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති දේව මෙහෙයට ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න හා නියෝජ්‍ය අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මහත්වරුන් ඇතුලු අමාත්‍යාංශයේ සියලුම නිලධාරීහු හා සේවක සේවිකාවන් එක්වූහ.

ඉතා අලංකාර ලෙස සංවිධානය කර තිබූ නත්තල් උලෙළ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මහතාගේ සම්පූර්න අධීක්ෂණය හා මගපෙන්වීම මත සංවිධානය කර තිබුණි. මේ උත්සවයට සමගාමීව හංවැල්ල නිරිපොළ ළමා නිවාසයේ දුවා දරුවන්ට තෑගි බෝග හා අමාත්‍යාංශයේ පවිත්‍රතා අංශයේ සේවය කරන සියලුම දෙනා හට තෑගි බෝග පිරිනමන ලදී. මීට අමතරව ධීවර අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට ප්‍රනීත දිවා ආහාර වේලක් සැපයීමට කටයුතු කර තිබු අතර කැරොල් ගීත කණ්ඩායම් හා නත්තල්, සීයාගෙන් මෙමම උත්සවය අලංකාර කර තිබිණ.

**සී. රාජපක්ෂ**

## දිලිදුකම මිල මුදල් නැතිකමට ම සීමා වන්නේ නැහැ



'මෙම මොහොතේ සමස්ත කිතුනු ජනතාව අල්පේච්ඡතාවය, දිළිදුකම ප්‍රදර්ශනය කළ කිතු සමිඳාණන්ගේ උපත සමරනවා. ඕනෑම ධනවතෙක් කොතරම් මිල මුදල් තිබුණත් අසාධ්‍ය රෝගි තත්ත්වයට පත්වුනොත් මිල මුදලින් කර ගත නොහැකිව අසරණ බවට දිළිදු බවට පත්වනවා. එසේම විසඳුම් සොයා ගත නොහැකිව විවිධ අභියෝග ගැටලුවලට මුහුණ දීමෙන් දිළිදු බවට පත්වනවා. තම සිතුම් පැතුම් ඉටුකර ගත නොහැකිවීමත් දිළිදුකමේ තවත් පැතිකඩක් වනවා. මේ අනුව දිළිදුකම මිල මුදල් නැතිකමටම සීමාවන්නේ නැතැයි'යි රත්නපුර ආසන දෙව්මැඳුරේ නත්තල් රාත්‍රි දේව මෙහෙය පවත්වමින් රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි හිමිපාණෝ පැවසූහ.

අම්පිටිය ජාතික දෙව්සත්හලේ කතිකාචාර් ගරු ශ්‍රියාන් ප්‍රනාන්දු පියතුමන් සහ රත්නපුර ආසන දෙව් මැඳුරු පාලක ගරු රන්ජන් මාල්මොරායස් පියතුමාගේ සහභාගිත්වයෙන් දෙව් මෙහෙය පැවැත්විණ.

**තියබෝල්ඩ් සමරතුංග**

## ශු. බයිබලයෙන් ප්‍රහේළිකා 25 ක් භාෂා තුනෙන්ම

ශු. බයිබලය ගැන දැනුම වැඩි කර ගන්නට මෙන්ම ශු. බයිබලීය අධ්‍යයනයට විශේෂයෙන් සැකසුණු ප්‍රහේළිකා 25 ක එකතුවක් ලෙස පිළිතුරුද සමග මේ වසරේ මුද්‍රිත අලුත්ම පොත් පිංච ඔබට රු. 60 කට භාෂා 3 කින්ම දැන් ලබා ගත හැක.

වසර අවසානයේ දහම් පාසල් තෑගී දීමටත් කදිමය. අගරදගුරු පදවි ශු. බයිබලීය කොමිසමෙහි ප්‍රකාශනයක් වන මෙය ළමුන්ට මෙන්ම වැඩිහිටියන්ටද ප්‍රයෝජනවත් වේ. පිටපත් සීමිත බැවින් ඔබගේ පිටපත් ඇන්ම පහත ස්ථාන වලින් ලබාගන්න.

කතෝලික මුද්‍රණාලය, කතෝලික පොත්හල, බොරැල්ල රදගුරු නිවස, දොරටුව හා පුස්තකාල පොත්හල, සියළු සාන්තුවර දේවස්ථාන පොත් හල, හා. ජුසේ වාස් දේව ධර්ම නිකේතනය, බැල්කම් පෙදෙස ධර්මෝපදේශ මධ්‍යස්ථානය. ඇක්වයිනස් දේව ධර්ම ඉංග්‍රීසි අංශය.

## තඹකන්දේ නත්තල්

නත්තල් උත්සවය නිමිත්තෙන් තඹකන්ද සා. බෲනෝ එක්සත් සමිතිය මගින් සංවිධානය කරන ලද වැඩිහිටි හා ළමා ක්‍රීඩා තරග රැසක් ඇතුලත් නත්තල් උත්සවය පසුගිය දින තඹකන්ද කල්වාරි පුදබිමේදී පැවැත්විණි.

තඹකන්ද මීසම් සේවක ගරු ස්ටැන්ලි පීරිස් පියතුමාගේ මග පෙන්වීම් මත මේ කටයුතු සිදුකෙරුණු අතර ක්‍රිකට් ක්‍රීඩාව, කඹ ඇදීම, දිවීම, විකට ඇඳුම් තරගය, යෝගට් කෑවීම ඇතුළු ක්‍රීඩා තරග රාශියක් එදින පැවැත්විණි.

පෝල් විජේතුංග

මග්ගොන සාන්ත විසෙන්ති සුසිතෝදය ළමා නිවාසයේ වාර්ෂික නත්තල් උත්සවය එම සමිතියේ ආදි සිසුවන් වන නිෂාන්ත නෝනිස් සහ ජේමන් පෙරේරා යන මහතුන්ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා 'සුසිතෝදය' ශාලාවේදී මහත් හරසරින් පවත්වන ලදී. එහිදී දරුවන් විසින් ඉදිරිපත් කරන ලද නත්තල් නාට්‍යයක් මෙහි දැක්වේ. ළමා නිවාසයේ අධ්‍යක්ෂ ගරු බොනිපස් සහෝදරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උලෙලේදී දස්කම් පෑ දරුවන් සඳහා ත්‍යාග හා සහතික පත් පිරි නැමීම සාන්ත විසෙන්ති ආයතනයේ අධ්‍යක්ෂ ගරු ශ්‍රියාන් රණසිංහ නි.ම.නි පියතුමන් විසින් සිදුකරන ලදි.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු






# නත්තල අප හට පවසන්නේ කුමක් ද?

**අපි එකිනෙකා කුමන පැත්තක් දිහා බැලුවත්, දකින නත්තල් සැරසිලි, අලංකාර විසිතුරු භාණ්ඩ, විවිධාකාර විලාසිතාවන්ගෙන් නිමැ වූ නව මාදිලියේ ඇඳුම් ආයිත්තම්, නැතහොත් මන දොළ පිනවන වෛවාරණ කෑම බීම, නත්තල අර්ථවත් කරාවිද? කන පිනවන කැරොල් ගායනා හෝ හදවත පිනායන අහලා පුරුදු සංගීතය නැතිනම්, ජයටම උත්සව පැවැත්වීම, මිල අධික තෑගි බෝග හුවමාරු කරගැනීමද, මේ අසිරිමත් සත්‍යය වූ උතුම් නත්තලේ අරුත?**



**බන්ධනාගාර රැඳවියකු විසින් ලියන ලද ලිපියකි**

මුළු මිනිස් සංහතියම, පව්කාර කමින් මුදවා ගලවා ගැනීම පිණිස, දෙව් පියාණන් වහන්සේගේ කැමැත්ත තුළ, අප සමිඳුන් වහන්සේ මෙම මාර්ගය සතුටින් භාර ගත් සේක. සියලුම සැප සම්පත් අතහැර දමා, මුළුමනින්ම හිස් වූ සේක. මෙලොව සැම අතින්ම දිළිඳු බව භාරගත් සේක. බැටළු ඔරුවක සැතපී තමන්ගේ ම යහනාව කරගත් සේක.

නත්තලේ සැබෑ දීමනාව නොහොත්, දේව ත්‍යාගය යනු, බලාපොරොත්තුව සුන් වී, ජීවිතය පරාද වී, වේදනාවෙන් තැලී පොඩි වී, අසරණව අතමංව සිටින අය හට, බලාපොරොත්තුව ගෙන දීමය. මුළු ලෝක සකල වාසීන් හට දෙව් පියාණන් වහන්සේගේ අමිල ප්‍රේමය නමැති, දිව්‍යමය ත්‍යාගය තමන් වහන්සේගේ දෝතින් අප සැමටම ප්‍රදානය කිරීම "නත්තලයි" සාමය, සතුට නිදහස නැති වූවන් හට එම සැබෑ සාමය සතුට නිදහස ලබා දීමේ විශ්වාසයේ පණිවුඩය "නත්තලයි" අප එකිනෙකාගේ ජීවිත වලට හදවත් වලට සාමය ලැබීම "නත්තලයි"

ඇත්තටම "නත්තල්" අපට පැන් බෝතල් වලින් පිරිවරා ගන්නට ද මධුපානේ උත්සව වලින් වට කරගන්නට ද නපුරාව නැතහොත් විනාශකාරී යක්ෂයාව අප ජීවිතවල උසස් ලෙස වැළඳ ගන්නට ද සාපයෙන් ද පාපයෙන් ද අප ගලවා කිතු සමිඳාණන්ව පහත් කරන්නට ද, බිම දමා පාගා දමන්නට ද, ක්‍රිස්තුන් වහන්සේගේ උප්පත්තිය සමරන දිනය මහත් ලෙස පාවා දෙන්නට ද, කිතුනු, කතෝලික වන අප සාතන්ගේ විනාශකාරී බලවේග යන් සමඟ කා බී විනෝද වන්නට ද දරාගන්නට බැරි ණය කන්දරාවක් දරා ගන්නා වූද, ආර්ථිකය අතින් තම ජීවිතය තව තවත් ආගාධයකට තල්ලු කර පහතට දමා ගන්නාවූද, තම ජීවිතයේ පවතින ප්‍රශ්න කරදර බාධක වලට තව තවත් බර පටවා ගන්නා වූද උත්සවයක් නොවන අතර, දිළිඳුව සිටින්නන් දිළිඳු කමින් මුදවා ගන්නට ද පාපයේ ශාපයේ පීඩාවන්ගෙන් අසරණ ජනතාව ගලවා ගැනීමට ද, බොරුව පරදවා යක්ෂයාගෙන් ද, ලෝකයාගෙන්ද, මාංශයාගෙන් ද, අප වැටී, සිරවී, තැලී, පොඩි වී සිටින මායා දැලෙන් අප මුදවා ආලෝකයට එතෙර කිරීමට ද, සාධාරණ සමාජයක් තුළ අප ධර්මිෂ්ඨයන් කිරීමට ද උපන් එතුමාණන්, මරණය කරා යන ගමනක ආරම්භක ප්‍රථම පියවර තැබූ දිනය "නත්තලයි" එම නිසා අප ජීවිතවල තිබෙන, පසුගිය වැරදි සහගත දේ විනාශ කර දමා, අප අලුත් විය යුතුමය.

නව අහසත්, නව පොළොවත් නව මැවිල්ලක් ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය කරණකොටගෙන ක්‍රිස්තුන් වහන්සේ තුළ නැවත ඉපදීමක් ලැබිය යුතුමය.

"මෙයයි ජේසුගේ නත්තල"

මා ප්‍රියාදර ක්‍රිස්තුන් වහන්සේ තුළ සිටින ප්‍රේමවන්ත ආච්චියේ සීයේ, අම්මේ, තාත්තේ, සහෝදර සහෝදරිය, නෑදෑ හිත මිතුරු මිතුරියනි, දුවේ පුතේ අප අද සිටින්නේ කොහිද යන්න ගැඹුරින් සිතා ඇතුළාන්ත ජීවිත වෙනසක් අත්දකිමින්, සමරන නත්තල ආශිර්වාදයෙන් පිරුණු අර්ථවත් නත්තලක් කර ගත යුතුයි. ඔබ සැමට සාමය, සතුට, නිදහස, සැනසීම, බලාපොරොත්තුව, සෞභාග්‍යයෙන් පිරුණු ජේසු සමිඳුන් තුළ දෙව් පියාණන් වහන්සේගේ ආශිර්වාදයෙන් පිරුණු නව ජීවිතයක් උදා වේවා!

**වැලිකඩ සිපිරි ගෙදර දී**
**රොහාන්**

# නත්තලේ උත්තුංග වැඩීම

**මනුෂ්‍යයාගේ පාපය ඉතා භයානකය. එය සියලු වරප්‍රසාද දුරු කිරීමට ඉවහල් වේ.**



ශුද්ධවූ අගුස්තීනු මුනිතුමාගේ අදහස අනුව පාපය සදාතන නීතියට එරෙහිව කරන කියන හෝ පතන කුමන දෙයක් වුවද වේ.

එලෙසම සදාකාලික නීතිය ලෙසින් කිතුනු සම්ප්‍රදාය ඉදිරිපත් කරන දෙවිඳුන් විසින් මිනිසාගේ යහපත පිණිස පිහිටුවනු ලබන ප්‍රඥාවන්ත සහ පෙම්බර සැලැස්ම ලෙස සඳහන් කළ හැකිය. මෙම අසහාය සැලැස්ම මිනිසා වෙනස් කර තිබේ. දුක් කරදර, වේදනා, ප්‍රශ්න, ලෙඩ රෝග එහි අනිටු ප්‍රතිඵල වේ. මෙම තත්ත්වයට විසඳුම් සෙවීම ආගමන කාලය තුළින් අවධානයට භාජනය වන අතර සත්‍ය වශයෙන්ම එය මෙම කාලයට පමණක් සීමා වන්නේ නැත.

නත්තල ආශ්‍රිතව බොහෝ කිතුනුවන් අවධානය යොමු කළ ද ශුද්ධවූ සභාව අපට ඇරැයුම් කරන්නේ ආගමන සමය තුළින් නත්තල් උළෙලට එක් වන්නටය.

**අන්‍යයන් පිළිගැනීම, අපගේ සතුරන්ට ප්‍රේම කිරීම, එකිනෙකා සමඟ බෙදා හදා ගැනීම, සම්බන්ධතා ජීවිතය, යුතුකම් නිසි ලෙස ඉටු කිරීම, සාධාරණව ක්‍රියා කිරීම යනාදි දේවල් මඟින් අපට නත්තල් අත්දැකීම කරා ප්‍රවිෂ්ට වන්නට පුළුවන.**

ආගමන කාලය පිළිබඳව නොසිතන නත්තල තුළින් එහි ආධ්‍යාත්මිකත්වය, උදාරත්වය ඉවත් කොට ඇත. ආගමන සමය තුළ අව්‍යාජ මනස්ථාපනයකට ජීවිත මාරුවකට මෙන්ම කිතු සමිඳුන්ගේ තේජාන්විත දෙවෙනි පැමිණීමේ ආනන්දනීය අපේක්ෂාවට අප සැම යොමු කරවයි. එහෙත් කිතුනුවන් අතරින් බහුතර පිරිසක් එය අමතක කර ඇත. හුදෙක් ජන්ම උත්සවයක් සැමරීම සඳහා සාදයකට බාහිර ලෙස සූදානම් වීමක් වැන්න.

කිතු හිමියාණ්ගේ සම්ප්‍රාප්තිය හෙවත් මාංශගත එම හෙළි දරව් වීම දෙවියන් වහන්සේගේ අද්විතීය සැලැස්මේ ප්‍රතිඵලයි. ගැළවීම හෙවත් විමුක්තිය අපට නැතිව සාක්ෂාත් කර ගත නොහැකිය. එය අපට දෙවිඳාණන් වෙතින් ලැබිය යුතු දෙයකි. නව උපතක් හෙවත් අරුත්බර නත්තලක් සැමරීම සඳහා ආගමන සමයෙන් ඉදිරිපත් කෙරෙන පරම සත්‍යයට සංවේදී විය යුතුය.

ඒ සඳහා අපගේ සිත් සතන් ගැඹුරින් සෝදිසි කර බැලිය යුතුය. ජීවිත සහ සමාජයමය පරිවර්තනයකට භාජනය කර ගැනීම පිණිස වඩාත් උචිත වකවානුවකි ආගමන සමය. කාලය හා අවකාශය අභිබවා කිතු සමිඳුන් අප අතර ක්‍රියා කරන බව වටහා ගත යුතුය. විශ්වාස කර ගත යුතු යථාර්ථයකි. හෙබ්‍රෙව් 8:13 සඳහන් කර තිබෙන ආකාරයට ක්‍රිස්තුන් වහන්සේ ඊයෙත්, අදත්, හෙටත් හැමදාමත් එක සමානය යන සත්‍යතාවට අප එක් විය යුතුය.

අපගේ දුබලතා, පාප සඳහා නිසි ආකාරයට පසුතැවිලි වීම තුළින් ඇතුළාන්ත ජීවිත පරිණාමයක් අත්දකින්නට වැය කළ යුතුය. එය අප තුළින් ඇරැඹී සමාජ පරිණාමයක් කරා විහිද යා යුතුය. මෙවර ආගමන කාලය තුළින් ඒ සඳහා ආධ්‍යාත්මික පිපාසයක් ඇති කර ගනිමින් ස්ථිරසාර සිත් පෙරළියකට මූලික අඩිතාලම දමන්නට කිතු සමිඳුන්ගේ පිහිටාශිර්වාද පැතිය යුතුය.

මෙය හුදෙක් ඓතිහාසික සිදුවීමකට පමණක් නොසිතමින් දිනෙන් දින ජීවත් වන අත්දැකීමක් වෙත පියවර තබන්නක් බැව් සිතට ගත යුතුය.

අපගේ ජීවිත මාර්ග වෙනස් කරගනිමින් උත්ථානයේ මහිමාන්විත අර්ථය වෙත අප සමීප කරවන කිතු සමිඳුන් අප ජීවිත වෙත එක් කර ගැනීමට ප්‍රයත්න දැරිය යුතු අතර සාම්ප්‍රදායික අදහස් වලින් මිදී නැවුම් ජීවිත ආකල්ප පද්ධතියක් ඇති කරගැනීමට යත්න දැරිය යුතුය. අපගේ පාප වලට දුක් මනස්ථාප වී ජේසු සමිඳුන් වෙත හැරෙද්දී එය ශුද්ධාත්මයාණෝ සිදු කරති.

සැබෑ උපතක් අප සැමරීම සඳහා සත්‍ය වශයෙන්ම සැබෑ දුගී බවක් අත්දැකිය යුතුය.

මෙය හුදෙක් මිල මුදලින් දුගී වීමකට වඩා ආධ්‍යාත්මය තුළින් දුගී බවක් අත් දකිමින් සැබෑ ආලෝකය වෙත පිවිසෙන්නට ක්‍රියා කළ යුතුය.

අන්‍යයන් පිළිගැනීම, අපගේ සතුරන්ට ප්‍රේම කිරීම, එකිනෙකා සමඟ බෙදා හදා ගැනීම, සම්බන්ධතා ජීවිතය, යුතුකම් නිසි ලෙස ඉටු කිරීම, සාධාරණව ක්‍රියා කිරීම යනාදි දේවල් මඟින් අපට නත්තල් අත්දැකීම කරා ප්‍රවිෂ්ට වන්නට පුළුවන. මිනිස් ජීවිතය තාවකාලිකය.

එය සදාකාලික වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ උපත නිසාය. ක්‍රියාකාරිත්වය නිසාය. සමාව දීමේ ආදරය නිසාය. ඒ හෙයින් අප එම අත්දැකීමට බද්ධ වන්නට වෙහෙසෙමු.

**මලින්ත බෝපෙආරච්චි**
**දළුගම, කැලණිය**

# සැබෑ නත්තල

උඳුවප් සඳ කිරණින් නැහැවෙයි පොලෝ තලේ
පිනි විසිරී මල් සුවඳයි සීත මද නලේ
සාම කුමරු උපත ගෙනා පුංචි ලෙන තුළේ
පණිවුඩය ද රැගෙන එන්නෙ මිහිරි නත්තලේ

ජේසු උපත සාම ගීත යළි සිහි කරමින්
ලෝ දන හට සාමයේ පණිවුඩය ගෙන යමින්
ලොකු පොඩි භේදය දුරලා බැඳී ප්‍රේමයෙන්
නත්තලේ සැබෑ අරුත බෙදමු ජේසු නාමයෙන්

**යූ. එල්. හියුගෝ පෙරේරා** – හලාවත

# නත්තලේ මිහිරියාව

උඳුවප් සිහිල් මද නල ඉඳහිට හමනා
සාමය, ප්‍රේමය සත වෙත පතනා
කිතුදන සැමගෙ සිත් සතොසින් පිරෙනා
නත්තල් මිහිර දසතම පැතිරී යන්නා

මනුපුත් ජේසු බිළිඳු උපන්නාය
මරි මව් තුරුලේ සතොසේ සැතපිලාය
බෙත්ලෙහෙමේ ගව මඩුවේ සුර නාදය
සුර කුමරුන් උපන් පුවත සැල කළාය

**ශීලා ජෙනට් රණසිංහ** – හලාවත



# උපතක අසිරිය

බෙත්ලෙහෙමේ පුංචි ගවමඩුවේ
දෙව් කුමරෙක් අද මෙලොවට බිහි වූවා
සාමයේ ගී හඬ ලොව සත හට ඇසුණා
ගැලවුම්කරු සාමය රැගෙන ආවා
පූර්ව දේශයේ නිල් අහසේ
තරු පායලා දිලිසෙනවා
ප්‍රේමය පතුරා ලෝකය පුරා
අප ගලවා ගත් දෙව් සමිඳා

**ඩබ්ලිව්. සිරිල් ටයිටස් පෙරේරා** – කටුනායක




# බලාපොරොත්තුවේ නව උදාව

**නත්තල, බලා සිටීමේ බලාපොරොත්තුවේ කාලයක්. නොඑසේ නම් අපේක්ෂාවේ කාලයක්. බලාපොරොත්තු මුදුන්පත් වී මිනිස් සිත ප්‍රීතියෙන් පිනා යන්නේ නත්තල උදාවෙද්දිය.**

මිනිස්සු පෝලිම් වල බලා සිටිති. ඒ යමක් බලාපොරොත්තුවෙනි. අහස උසට නඟින බඩු මිල කවදා පහළට බසීවිදෝ කියන බලාපොරොත්තුවෙනි. අධිවේගී මාර්ගයේ වේගයෙන් ඉගිලී ගිය රියැදුරා පරික්ෂණ ස්ථානයේ නොඉවසිල්ලෙන් බලා සිටින්නේ තදබදය නිසා ඉබි ගමනින් ඉදිරියට ඇදෙන රිය පෝලිම නිසාවෙනි. තවත් රියැදුරකු රතු මාර්ග සංඥාව ගැන නොසලකා වාහනයේ නළාව නාද කරන්නේ, පියාඹා යන්නට බැරි නිසාවෙනි. නත්තල උදාවන තුරු රජයේ සේවකයා බලා සිටින්නේ, බෝනස් ලැබෙන තුරුය. ඔහුගේ තොළ කට වියැලී යන්නේ ලැබෙන මුදල නත්තල් කන්නට නොව ලෙව කන්නට වත් මදි නිසාය. මෙසේ බලා සිටින්නෝ බොහෝ ය.

## සෙනඟ බලා සිටීම

සෙනඟ බලා සිටියහ (ලූක් 23:35) ලෝකාරම්භයේදී ආදි මව්පියන්ට බලාපොරොත්තුවක අවශ්‍යතාවයක් නොවූයේ ඔවුනට කිසිදෙයක හිඟයක් නොවූ බැවිනි. සියල්ල දෙවියන් වහන්සේ මනහරව මවා පාලනය, ඔවුනට පවරා තිබිණි. සියල්ල මනහරව තිබූ බැවින් මනහරවම ඉදිරියට යනු ඇතැයි සිතන්නට ඔවුනට සෑම හේතුවක්ම තිබිණි. නමුත් විරෝධකාරි ඝාතන සියල්ල කණපිට හැරෙව්වේය. ආදි මව් උගුලට අසුවිය. ආදි පියා ද උගුලේ පැටලුනේ මුළු මිනිස් සංහතියටම එය උරුම කරමිනි. බලා සිටීමේ කාලය උදාවූයේ ඉන් පසුවය. කරුණු එසේ වුවද බලා සිටීමේ කාලය ඇරඹුනේ අවස්ථාව එනතුරු බලා සිටි ප්‍රයෝගකාරි යක්ෂයාගෙන් කීවද එහි වරදක් නැත. බලාපොරොත්තුවේ අවශ්‍යතාවය හිස එසෙව්වේ ය. නත්තල බලාපොරොත්තුවේ කාලයකි.

එදත් සෙනඟ බලා සිටියා. අදත් සෙනඟ බලා සිටිනවා. යහපත් හෙටක් උදාවන තුරු බලා ඉන්නවා. (නිකම්) බලාගෙන බකන් නිලාගෙන, උඩ බලාගෙන බඩ උලාගෙන ඉන්නවා කීවොත් එය වැරදිම නැහැ. නිකම් බලාගෙන සිටි පිරිසක් ගැන ශු. මතෙව් තුමා 20 පරිච්ඡේදයේ 6 වගන්තියේ මිදි වත්තේ වැඩම සේවකයන් යැවීමේ සිද්ධියේ සඳහන් කරනවා. "ඔබ මෙතන දවස තිස්සේ නිකම් සිටින්නේ මන්දැ"යි ස්වාමියා අසද්දි ඔවුන්ගේ ප්‍රතිචාරය වූයේ" කිසිවකු අප වැඩට නොගත් නිසායැ"යි කීහ. (මතෙව් 20:7) උඩ බලාගෙන සිටි පිරිසක් ගැන අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ 1 වන පරිච්ඡේදයේ 11 වන වගන්තියේ සඳහන් වන්නේ මෙලෙසයි. "ගලීලයේ වැසියනි, ඔබ අහස දෙස බලාගෙන සිටින්නේ කුමට ද?" (ක්‍රියා 1:11) ඉහත සඳහන් සිද්ධීන් දෙකම නූතන සමාජයට යසට ගැලපෙනවා. නිකම් බලාගෙන සිටින්නේ කළ හැකි දෙයක්, විසඳුමක් පෙනෙන තෙක් මානයක නැති නිසයි. පැනල දීල, ඉල්ලගෙන කන්න හැමෝම කැමැති නැහැ. ශක්තිමතා, බලවතා වී දුර්වලයා නිකම්ම නිකම් රූකඩයන්, පඹයන් හෝ මෙවලම් බවට පෙරළාගෙන උඩ බලා සිටින්නේ, වටිනාකම් උඩුකුරු යටිකුරු කර ඇති නිසයි. අද යථාර්ථය මෙය නමුත් බහුතරය නිහඬය. සුළුතරය මුඛරිය. ලිස්සා යන ෂේප් න්‍යායක් ප්‍රධානිහු භාවිත කරද්දී, තතු දන්නෝද කසාය බිවූ ගොළුවන් සේ හැසිරෙති. සුළුතරයක් නිල බලයෙන්, මැර බලයෙන් කුල්මත් වී වළං කඩයකට වැදුනු ගොනුන් සේ ක්‍රියා කරද්දී සෙනඟ තුෂ්නිම්භූත වී සිටිනවා හැර වෙන කුමක් කරන්නද?



## ප්‍රධානින්ගේ රැවුම් ගෙරවුම්

ප්‍රධානිහු උන්වහන්සේට ගැරහුම් කරමින් .. (මතෙව් 23:35) අද සමාජයේ යථාර්ථය මෙය බව පිළිගන්නට අකැමැති වුවහොත් යම් දිනක යෙසායා දිවැසිවරයා ඉදිරියේ මෙන්ම (යෙසායා 6:9-10) එම දිවැසාවලිය උපුටා දක්වන ජේසු සමිඳාණන් ඉදිරියේ උන්වහන්සේගේ දෙවන ආගමනයේ දී නිරුත්තර වන්නට සිදුවනු නොඅනුමානය (මතෙව් 13 - 14) "ඔබ අස අසාත් තේරුම් නොගත්තහුය. දැක දැකත් නොදක්නාහුය. මේ සෙනඟගේ සිත් අඳුරුය. ඔවුන්ගේ කන් වැසී ඇත. ඔවුන්ගේ ඇස් පියවී ඇත. එසේ නොවී නම් ඔවුන් ඇසින් බලා කනින් අසා සිතින් තේරුම් ගෙන හැරෙනු ඇත. මම ද ඔවුන් සුවපත් කරමි." (මතෙව් 13:14-15).

අද ඇතැම් නායකයන් ප්‍රතිවාදින්ට අභියෝග කරන්නේ අතීතයේ "කුණු" අවුස්සමිනි. නැතහොත් "නියර මිටි තැනින් ජලය ගලා යන්නට" සලස්වමිනි. ගෙල උස්සා ඇත්තේ මඩ සංස්කෘතියකි. දිය යටින් ගින්දර ගෙන යන දිය රෙද්දෙන් බෙල්ල කපන, අගේ ඉඳන් තණ කන ඇතැම් නායකයෝ එදා මෙන්ම අදත් වැජඹෙති. ඔවා දෙනු පරහට - තමා සම්මතෙහි පිහිටා සිට. වැටත් නියරත් ගොයම් කෑ නම් කාට පවසම් ඒ අමාරුව?"

## මුර සෙබලුන්ගේ උජාරුව

මුර සෙබළෝ ද ප්‍රධානින්ගේ වදන් වලට උඩ ගෙඩි දෙමින් මුක්කුවක් ගැසූහ. ප්‍රධානින්ගේ අතේ අතකොළු බවට පත් ඔවුන් නීතිය වල් වදින්නට ඉඩ හැර වාසි පැත්තට හෝයියා කියති. මනහර ලොවක් මැවූ විශ්වයේ රජාණන්ට, ඉපදෙන්නට සිදුවූයේ රජ මැදුරක නොව ගව මැදුරකය. උණුසුම ලැබුවේ පිදුරු බිස්සකිනි. වන්දනාමාන ලැබුවේ රාජෝත්තමයාණන්ගෙන් නොව එඬේරුන් හා තිරිසන් සතුන්ගෙනි.

## වරදකරුවන් දෙදෙනාගේ ආකල්පමය වෙනස

එක් පසෙක සිටි වරදකරුවෙක් ද සමිඳාණන්ට මඩ පහරක් එල්ල කරන්නේ අතීතය අවුස්සමිනි. අතීතයේ උන්වහන්සේ කළ පුදුම ක්‍රියාවන් ඔහු අගය නොකළා වෙන්නැති. නමුත් ඔහු අසා තිබූ අතීත කථා ගෙන හැර පාන්නේ අභියෝග යක් සැටියෙන් හා ඔච්චමක් සමච්චලයක් විලසිනි. "ඔබ ක්‍රිස්තුස් නොවේ ද? ඔබත් ගළවාගෙන අපවත් ගළවා ගන්න" (ලූක් 23:29) මෙය විජ්ජාවක් කරන්නට හෝ සර්කස් පෙන්වන්නට කරන අභියෝගයකි.

අනෙකා ඔහුට තරවටු කරමින් (ලූක් 23:40) ... අවසන් මොහොතේ හෝ ඔහු හරි සිහි කල්පනාවට පැමිණියේය. සමාජයට පිළිලයක්ව සිටි ඔහුට කළ හැකි දෙයක් නැත. කළ හැකි දෙය එකම දෙය ඔහු කළේය. ඔහුට සමාව දෙන්නට කිසිවකුත් සූදානම් නැත. ඔහු සොරකු ලෙස ප්‍රචලිතව සිටියා නම් අවසාන මොහොතේ වටිනාම වස්තුවක් සොරාගන්නේ ය. ඒ ස්වර්ග රාජ්‍යයයි. "ඔබ අද ම මා සමඟ පාරාදීසයෙහි සිටින්නෙහිය." (ලූක් 23:43).

එදා මෙන්ම අදත් සෙනඟ බලා සිටිති. ප්‍රධානිහු, මුර සෙබළු, වරදකරුවෝ හිඟ නැත. කුරුස ගස පාමුල සිටියා මෙන්ම ගවලෙන අභියස ද සිටිති. ගිහි, පැවිදි, පූජක සෑම පුද්ගලයන් ලෙසින්, පවුලක් ලෙසින්, සමාජයක් ලෙසින්, සංඝයක් ලෙසින් බලා සිටිති. ක්‍රියාත්මක වෙති.

අද ජේසු බිළිඳුන් හමුවේ ගවලෙන අභියස සිටිද්දී ආවර්ජනයක යෙදෙන්න සුදුසුයි. අප සිටින්නේ කොතැනද කියා. සර්වකාලීන පණිවුඩයක් ගැබ්ව ඇති ශුද්ධවූ ලියවිල්ල තුළින් අපට අප සිටින තැන සොයාගත හැකිද? යමෙකුට ගමන් කළ හැකි දිගම ගමන තමා තුළටම ගමන් කිරීමය.

**ගරු සාර්ටෝ නෝනිස් පියතුමා**

# නව වසරේ නව ජීවිතයක් අරඹමු



**කිතු සමිඳාණන් මරිය තුමියගේ ශ්‍රී කුසයෙන් බිහි වී අටවන දින රාජාති රජාණන් වූ උන්වහන්සේ මෝසෙස් තුමාගේ වේද නීතියට අනුව අපේ ගැලවීම සඳහා චර්මඡේදනය තුළින් පළමු අමිල වූ ලේ බිංදුව වැගුරූ සේක.**

තවද උන්වහන්සේ මෙලොව ඇති සියළු නාමයන්ට වඩා අති උත්කෘෂ්ඨ වූ නාමය වූ "ජේසුස්" නාමය ද ලබා ගත් සේක. ඒ දේව බිළිඳු මිනිස් බිළිදෙකු ලෙස හඳුන්වනු ලැබූ දිනය අපි අළුත් අවුරුද්දේ තුන්වන දින සමරමු. මේ සිද්ධින් සිහිකර අවුරුදු දෙදහස් දහතුනක් ගෙවී අවසන් ය. අපි තවත් අභිනව වර්ෂයකට පා තබා සිටිමු.

මෙම අළුත් අවුරුද්ද සමහර විට අපේ ජීවිතයේ අන්තිම අවුරුද්ද වන්නට ද බැරි නැත. එහෙත් යහමඟ ගමන් කරන්නන්ට මරණය බියජනක දෙයක් නොවේ. ඒ මන්දයත් මරණය ද අළුත් ජීවිතයක ආරම්භයක් වන බැවිනි.

එම අළුත් ජීවිතය අනන්ත ජීවිතයක් වන බැවින් ඊට ඇතුළත් වීමට බැහැපත්කමේ ආදර්ශයක් වූ කිතු සමිඳාණන් අනුගමනය කළ යුතුය. උන්වහන්සේ මෙන් දිළිඳුවිය යුතුය. චාම් විය යුතුය. පසුගිය මාසයේ දී අපි උන්වහන්සේගේ උත්පත්තිය ගැන මෙනෙහි කළෙමු. නත්තල් දින රාත්‍රියේ බෙත්ලෙහෙම් පුරේ ගවහලක උන්වහන්සේගේ උපත සිදුවූවාක් මෙන් අපේ බැහැපත් හදවත් වල ද උන්වහන්සේ ඉපදෙන්නේ නම් උන්වහන්සේ සමඟ අපිත් අලුත් ජීවිතයක් නව වසරේදී අරඹමු. මෙම අලුත් ජීවිත ගමන පටුයි. කඳු සහිතයි. එහි ගමන් කරන්නෝ ස්වල්ප දෙනෙකි. අපිත් එම ස්වල්ප දෙනා අතරට එකතු වීමට ඉටා ගනිමු.

මෙම නව වසරේ ගමන් කරන විට සැප පහසුකම් නිතරම ඇති නොවේ. සියලු බාධාවන් මැඩගෙන මේ ගමන යා යුතුය. නමුත් සදා ප්‍රීතියට යන මඟ පටු මඟයි. මේ මඟ යන්නට යන්නට ප්‍රීතිය ගෙන දෙයි.

දෙවි පියාණන් වහන්සේ අප හදවතට කතා කරමින් ද වරප්‍රසාදයේ මාර්ගයෙන් අප හදවත් වලට තට්ටු කරමින් ද අපේ ආදරය අයදින සේක. එබැවින් උන්වහන්සේට ආදරය දක්වන්නට ගිය වසරට වඩා මේ වසරේදී සහතික වෙමු.

ඒ සඳහා අවැසි වන්නේ ජේසු සමිඳාණන් මෙන් අන් අයට ආදරය කිරීමත්, සමාව දීමත්ය. අපේ දුබලකම්, වෛර, ක්‍රෝධ, සමාව නොදීම් ආදී අවගුණයන් ගතවූ අවුරුද්ද සමඟම වළලා දමා කිතු සමිඳුන් සමඟ නව මඟක් අරඹමු. වයසින් වැඩෙනවා සේම ආධ්‍යාත්මික නැණින් වැඩෙමු.

**මෙල්වින් ද කොස්තා**

# සැබෑ නත්තලක්



**වර්තමාන තරගකාරී ලෝකයේ දුගී දුප්පත් ජනතාව පාගා දැමීම සහ බල රහිත කිරීම අද සමාජයේ දකින්නට ලැබේ. දිළිඳුකම මිනිස් පැවැත්මට බාධාවක් වූවත් එය තමන් කැමැත්තෙන් උරුම කර ගන්නා දෙයක් නොවේ.**

උසස් තානාන්තර, ගරු නම්බු නාම, ධනය, බලය, ඔවුනට අහිමි වී ඇත. අවංකව මිනිසුන් මෙන් මිනිස්කම රැකගෙන ජීවත් වීම වැදගත් ය. බොරුවෙන් අසාධාරණයෙන් ජීවත් වනවාට වඩා දිළිඳුව සිටීම භාග්‍යයකි. ක්‍රිස්තුන් වහන්සේ දිළිඳුන් දුටුවේ දෙවි පියාණන් විසින් ආශිර්වාද කරන ලද පිරිසක් ලෙසය. උන්වහන්සේගේ දූත කාර්යය වූයේ දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරීමයි. ඔවුන් වහන්සේ තරම් අසරණයන්ට ප්‍රේම කළ කෙනෙක් මෙලොව බිහිවී නැත. ඔවුන්ගේ දුක් ගැහැට ගැන උන්වහන්සේ දුටුවේ අද සමාජය බලන කෝණයෙන් නොවේ. අසරණයන්ට ප්‍රේම කළ සමිඳාණන් වහන්සේ තම දුක් විඳීම් ද, දිළිඳුන්ගේ පැවැත්මද සැසඳීමට උත්සාහ කළාය. සිය ප්‍රේමය විසින් මිනිසුන්ට ප්‍රේමය, බැහැපත්කම, කරුණාව, දයාව උගැන්වීය. තවද ප්‍රේමයේ පනත ලොවට හඳුන්වා දුන් උන්වහන්සේ මිනිසුන්ට අනෙකාට ප්‍රේම කරන ආකාරය කියා දුන්නේය. තවද සමිඳාණන් අසරණයන්ට ප්‍රේම කළ ආකාරය වැන්දඹු ස්ත්‍රීන්ගේ එකම පුත්‍රයා මියගිය පසු නැවත නැගිටුවාලමින් අනුකම්පා දැක්වූ ප්‍රාතිහාරයෙන් සනාථ වේ. (ලූක් 7:12-14)

උන්වහන්සේ අසරණයන්ට කොපමණ ප්‍රේම කළා ද යන්න සනාථ කිරීමට අවස්ථා රැසක් ඇත. විටක සමහර දිළිඳු පිරිස් තම ආකල්ප සහ ක්‍රියාකාරකම් මැද සමාජයෙන් කොන්ව සිටි නමුත් සෑම දිළින්දෙකුටම එක මිම්මෙන් මැනීම සාධාරණ නැත. සමහරුන් යහපත් ආර්ථිකය සහ සමාජ මට්ටමක දිවි ගෙවන මිනිසුන් වශයෙන් පසුබෑමකට ලක් වන අතර එය තුළින් ඊර්ෂ්‍යාව මතුවිය හැකිය. නමුත් සැවොම එක මිම්මෙන් මැනීමට යාම හා ඔවුන කොන් කිරීම නොකළ යුත්තකි. කිතුනුවන් වශයෙන් අනුකම්පා කිරීම, සමාව දීමට, අපව පුහුණු කර ඇත. අප ඔහුගේ මානුෂික තත්ත්වය හා ආර්ථික තත්ත්වය මීට වඩා සැළකිලිමත් ව සොයා බලා කටයුතු කිරීම අප විසින් කළ යුත්තකි.

ක්‍රිස්තුන් වහන්සේගේ කාර්යය රටකට ගමකට සීමා කළේ නැත. උන්වහන්සේ තම කාර්යය කාලයකට සීමා කළේ ද නැත. තමා විසින් හඳුන්වා දුන් එම කාර්යය මුළු මහත් කිතුනුවන් වෙත පැවරීය. අප උන්වහන්සේගේ කාර්යයන් ඉතිරි කොටස ඉදිරියට ගෙන යාම කළ යුතුය. උන්වහන්සේ හඳුන්වා දුන් දිව්‍යසි කාර්යය අප ඉදිරියට ගෙන යා යුතුයි. අතීතයෙ රන් කාසි වලට ජේසු සමිඳුන්ව පාවා දුන් ජුදාස් වරුන් අදද අප අතර සිටීමට පුළුවන.

ගව මඩුවක උපත ලද ඔවුන් වහන්සේගේ නත්තල් පුවත අදට ද වලංගුය. උන්වහන්සේ අපෙන් ඉල්ලා සිටින්නේ අන්‍යයන්ට ප්‍රේම කිරීමටය. අසරණයන් කෙරෙහි පරිත්‍යාගයෙන් හා දයාවෙන් යුතුව බැලීම ය.

උන්වහන්සේ මිනිසාට සිතීමට යහපත් සිතක් ද ශක්තිමත් මනසක් ද ලබා දී ඇත.

**ආන්ජලෝ සිල්වා**
**මොරටුව**




# සුහද නත්තල

කඳුකර කොමළී මීදුම් සළුවෙන් එතිලා
විල්වල ඕලු මානෙල් නෙළුමන් පිපිලා
නත්තල් සුළඟ යයි ගොයමට අත වනලා
ජේසුගෙ සිරි උපත ලෝකෙට එළිය කළා

ලොව සැම දෙනා කළ පාපෙන් මුදවන්න
දුකින් පෙළෙන අයගේ සිත් සනසන්න
පවිටු දනන් හට යහපත ගෙන එන්න
ජේසුට තිබුණෙ ගව ඔරුවයි සැතපෙන්න

**ඩෑ. ජෝ. පීරිස්**
කොරළවැල්ල

# සාමයේ කුමරුනි

**දෙව් බව හිස්කර මනු සතහට ගැළවුම ගෙන දෙන්න**
**කැපවී දිළිඳු බවට මාළිග නොව පැල්පත් සරසන්න**
**ඇපවී දනන් වෙනුවෙන් මොක් උරුමය ලැබ දෙන්න**
**වැඩිය දෙව් බිළිඳුන් අප සැම පාපෙන් රැක ගන්න**

**අයුක්තිය රජකරනා අද ලොව ඔබ උපතින් නිවැරදි වේවා**
**අසාධාරණ හමුවේ හඬනා දනන් ඔබ උපතින් සැනසේවා**
**නිදොස් භාවය දිනවන්නට ඔබ උපත දින දින බලවත් වේවා**
**පාපය මිය ගොස් පින්බර හදවත් ඔබ උපතින් උපදීවා**

**ටෙක්ලා කල්දේරා**
දන්කොටුව



# අහෝ නත්තල

පාට පාට එලි දැල්වී නිවීයන
ගවලෙන් තියේ පාරදිගේ පෙලින් පෙළ
නත්තල් ගස්ද යුරෝපයෙන් ගොඩ බසින
සකිසඳ බලන් සැරසිලි පොරවා සිටින

කාලා බීලා ජොලිකරලා නටනකොට
සැදැහැවතුන් වෙරි වීලා වැටෙන කොට
ටිකට් විකුණලා කැරොල් කියනකොට
ගවලෙනේ ඉදිවිද ජේසුස් බිළින්දා

**ජගත් සමන්ත**
කොරළවැල්ල

# ම පැතුම....!

වෛර ක්‍රෝධය සිඳ බිඳි ගොස් ප්‍රේමයේ හඬ රැව් නැගේවා
සාමයේ සිසිලසින් සිව්දිග සියලු ජන හද ගිනි නිවේවා
දුගී පැල්පත සෝ සුසුම් බිඳ සිනාසී ලොව රජ කෙරේවා
දේශපාලන බේද දුරුවී සැම එකාමෙන් එකතු වේවා

ජාති ආගම් භේද දුරුවී සොම්නසින් උද්දාම වේවා
කුලය නිල බල තුරන් වී ගොස් මිනිස්කම හද තුළ රැඳේවා
උස් පහත් බැමි සුණු විසුණු වී එක මවක දරු කැලක් වේවා
පවිටු අදමිටු කුහක දනහට යහ මඟෙහි නෙත් විවර වේවා

රුදුරු ගිනි අවි බලය සුන් වී දනන් පීඩිත පණ රැකේවා
නා පොළොන් මාපිලුන් විස දළ සමග පුතු සෙල්ලම් කෙරේවා
දමිළ පුතුගේ කුස පුරන්නට සිහල දෙතනට කිරි එරේවා
සාමයෙ රණ ගීය ගයමින් පරෙවියන් නුබ විසර යේවා

දනන් පීඩිත තවත් මිරිකන දහසකුත් වර්ජන නිවේවා
රෝගියා දෙස බලන කම්පිත, දෙනෙත ඉසිවර, විවර වේවා
මුසා බස් මැද අනුන් වළලන කේලමින් කට මැත වැසේවා
මත් මතින් තරුණන් මුදා නව ලොවක අරුනළු යළි නැගේවා

කවිය අවියක් ලෙස අයුක්තිය පිටු දකින්නට සමත් වේවා
දූෂණය හා, භීෂණය කළු, දුම මැකී හිම කඳු මැවේවා
පිසෙන කිරිබත් සුවඳ දස දෙස විහිද සිව්දිග එක් කෙරේවා
උදාවන නව වසර සැමටම සතුට සම්පත ලඟා වේවා

**ඇන්තනි ජයලත්**
රාගම

# නමාමී

මින් පෙර දිනෙක උඳුවප් මහෙ වැටෙන හිම
පින් සර උතුම් කිතු හිමි වින් ලොවට මෙම
පෙන්වූ අයුරු යහ ගුණ දම් සතට සැම
සත් වර සිතින් දැහැමින් සිහි කරමි මම

පව්'ඳුර ඉවත් කොට සදහම් කිරණ විදා
දිව'යුරු පරිදි කළ ලෝකෙට එළිය උදා
පවතින බැවින් ඔබ ගැන මතකයෙහි රඳා
නව මින් සිරස සිරි පා යුග වඳිමි සදා

අත් හැර දමා රන් මිණි මුතු දේ ආදි
පින් දෙව් අණට නිබඳව වී සංවේදී
සත් දම් දෙසූ විරුවකු මෙන් බැස වීදි
උත්තම කිතු තුමන් නමදිමි සිත පෑදි

අසිපත් ඉවත ලා මුදු ගුණ වගා කොට
අවියත් නොවී නුවණින් දිවි ගෙවී මට
දෙව්පුත් දෙසූ සදහම සැම දෙනා හට
සිහිපත් කොට තබමි හිස දෙපා පිට

**දළුපත පිලීෂියන්**

# නත්තල් ඇත සමිඳුන් නැත

මිරිගුව ලුහුබැඳ අසිරිය ඩැහැගෙන
දිව යන මුත් නැත කිසියම් අරමුණ
සමිඳුන් දිනු ලොව නත්තල් ගවලෙන
පණිවුඩ දෙන තැන හදවත පිළිගෙන

පඬුරක් පිදුමට කැමැත්ත වේ නම්
සොහොයුරු සමගින් ගැටුමක් ඇත්නම්
කඩතොලු පිළිසිඳ ආපසු එන්නම්
පිළිගත හැකියයි කියන්නෙ කිතුදම්

ඇති හැකි සමහරු ජයටම කතිබොති
මංගල සැණකෙළි වෙනසකි ඇතිනැති
දහමට පිටු පෑ මිනිස්සු පරගැති
සමිඳුන් නැතිවද නත්තල සමරති

**ජූලියස් සෙනරත්**
සීදුවේ



# දේව නිධානය

පවිටු ලෝ දනා පවින් මුදන්ටා
ගෙන මනුවෙස් දිළිඳු පැලක
ජේසු උපන්නා

සිහිල් සුලං කැරලි රඟන - උඳුවප් මාසේ
ජේසු බිළිඳු ලොවට වැඩිය - බෙත්ලෙහෙම් පුරේ

පවින් පිරුණු කිළිටි ලොවට - දුන් දායාදේ
නිසල රැයක ගව මඩුවක - සිදු වූ ඒ දේ

උස්මිටි තැන් සම කරවන - මහා බලවේගේ
සාමය සුව සතුට බෙදන - දේව නිධානේ

**ප්‍රදීපා එම්. මේරියන්**
අළුත්කුරුව

# සුබ නත්තල්

නිසල රැයක
සියලු ජාතින්
එකට එක්කරන
සොඳුරු
දෙව් පුත් උපත
සමරන
ඔබ සැමට
පතමි
සුබ නත්තලක්!

**ආශීර් දුලිප් මාදසේකර**
බත්තරමුල්ල

# මව්පදවිය

සෙනෙහසක්
වඩන්නට
පැතුමක් පැතුවෙමි
සිහිනයක්දෝ
මායාවක්දෝ
පුතුනි ඔබ මට

**ශිරෝමි නිර්මලා**
දළුගම

# අතින් නොව හදින්

අකුරු දත් දින සිට
රචිත ගැදි පැදි අතරට
'නත්තලේ' අරුතට
බැන්ද 'පැණිගොමු'
නැගේ මතකෙට

මලින් මල එක් කර
සැදු මල් පැස ගොනු කර
ගවලෙනට පිය වර
නගා දෙව්පුතු
පුදමි පින් බර

මලක් වන් දෙව් පුතු
මලින් පුදදෙන අප සතු
ජේසු වඩිනා
තැනකි බල ගතු

හදේ මල් පිපෙනා
දිනකි නත්තල වටිනා
එබව දත් සුදනා
අතින් නොව හිමි
හදින් වඩනා

**පිටිපන මා ජයවීර**

# නිමැවුම්කරු නොපැතූ දවසක්

එකම දවසකි
එකම උත්සවයකි
එකම හේතුවකි
දුප්පත්තු හූල්ලති
ධනවත්තු කති බොති
අදමිටුවෝ ගරහති
වසරකට කල්දමා
උත්සවය නිමා විය
උත්සවයේ නිමැවුම්කරු
නොපැතීය එවැන්නක්

**මාරි ෆැන්සි පෙරේරා**
කලමුල්ල

# නව වසර වාසනාවන්

පැතුමන් උදාවී අරුනළු කිරණ පෙරා
සාමය සතුට සොම්නස හදවතින් දරා
සැම දන ගෙන යමින් දිදුලන ලොවක් කරා
අවුරුදු කුමරි පුබුදයි නව හැඟුම නුරා

සාමයෙ සුවඳ මල් දස දෙස පිපේවා
ප්‍රේමයෙ රන් හැඟුම් හද තුළ රැඳේවා
එකමුතු කමේ යැදුමෙන් සැම බැඳේවා
ලැබූ නව වසර සැමටම සෙත සැදේවා

**ලූෂන් ෂර්ලි එඩ්වඩ්**
ගෝනවල

# නව වසරේ ප්‍රාර්ථනා

පිපෙන පිපෙන මල් අතු අග සැරසේවා
නගන නගන හඬ ජයගොස පැතිරේවා
තබන තබන පය දියුණුව සැලසේවා
කරන කියන දේ හැමගේ ඉටු වේවා

අසන දකින අපරාධත් නොම වේවා
නපුරු දුදන හැම සිත් සුදනන් වේවා
ගලන කඳුළු නොව සිනහව රජ වේවා
නවමු වසර හැම සතසිත සැනසේවා

**එස්. පී. වසන්ත මාලා**
කොටරූපේ රද්දොළුගම

# සුබ පැතුම 2014 ට

සාමය පතා දහමෙහි කරවා ළතර
ලොව සනසනුව අකුසල පලපා එතර
උතුමඟු හොවා දෙව් දිනිතිය පාතඹර
සතුටින් පිළිගනිමු දෙදහස් දාහතර

කැප වී සලසවන ලෙස පරහට සේවා
සෝවුරු දයා ගුණ හද තහවුරු වේවා
ආසිරිවාදයෙන් දෙන දේවති දේවා
නව වස ලැබූ කිරි පැණියෙන් ඉතිරේවා!

**වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු**

# නැවත වඩිනු මැන

දෙව් පියතුමගේ අණසක ලෙසිනේ
මරි මව් කුසයේ පිළිසිඳ ගැනුනේ
ජුසේ තුමන් ඔබ සුරැකි පිය වුනේ
ලෝ ගැලවුම්කරු ඔබයි ජේසුනේ

තානායම්වල ඉඩක් නොලැබුනේ
නවතින්නට කිසි තැනක් නැති වුනේ
පුංචි ගවහලකි පිහිටට තිබුනේ
සාමේ පුත් කුමරු එහිදි ඉපදුනේ

**ශ්‍රියානි මානෙල් පෙරේරා**
ගිරිඋල්ල

# කුමාරයාණෙනී

තිස් වසරක් තිබුණා යුද ගිනි
නිවිලා දැනට වසර ගණනකි
සතුට අරන් අප සැම අතරට
වඩිනු මැන කුමාරයාණෙනී

ඇත තවම දිළිඳු කම හැම තැන
හිසෙහි දරාගෙන ජීවන බර
වෛර දරණ ඉදිරියට යන්නට
අසරණ අපහට දිරියක් නැත

දවසක් එන බව දැනෙයි අපට
සැනසෙමු සිතා අද වැනි දිනක
ලැබුවා සීනු හඬින් නත්තල
වඩිනු මැන කුමාරයාණෙනී

**සිරිපාල චන්ද්‍රසෝම**
මීගමුව

# කලාවෙන් පිළිබිඹු වන ශාස්ත්‍රවන්තයින්ගේ දේව ධර්මය

**2013. 12. 22 ලිපිය හා සබැඳේ..**

මුල් කාලයේ දී පැමිණි ශාස්ත්‍රවන්තයින්ගේ ගණන පිළිබඳ නිශ්චිත අදහසක් නොවීය. එය තිදෙනෙක් බවට නිසැක වූයේ මැතිව් ශුභාරංචියේ සඳහන් වන පරිදි පුදන ලද පඬුරු ත්‍රිත්වය පදනම් කර ගෙනය. ඒ දෙවන සියවස වනවිටය. එහෙත් ශාස්ත්‍රවන්තයින්ගේ ගණන ගැන එතරම් ගැඹුරින් සිතා නැති බවට ද කරුණු හෙළි වේ. රෝමයේ ඩොමිටිල්ලා කැටකොම්බයේ බිත්ති සිතුවමක එන ශාස්ත්‍රවන්තයින්ගේ ගණන හතරකි. පේදුරු තුමාගේ කැටකොම්බයේ සිටින්නේ එක් අයෙකි. මාසිල්ලිනුස් කැටකොම්බයේ දෙදෙනෙකි. විවිධ සිරියානු ලියැවිලිවල මෙම සංඛ්‍යාව ශාස්ත්‍රවන්තයින් දොළහක් දක්වා වැඩි වී ඇත. පරණ ගිවිසුමේ සඳහන් වන ආදි පිතුරු රැසක් විසින් ලියා ඇතැයි සමහරුන් විශ්වාස කරන අසම්මත ශුභාරංචියක් පදනම් කරගෙන ජෝන් ක්‍රිසොාස්තම් තුමාගේ ආරූඪ නමින් පස්වන සියවසේ දී පමණ ලියා ඇති Opus Imperfectum in Matthaeum ග්‍රන්ථයේ මෙලෙස දොළොස් දෙනෙක් ගැන සඳහන් වේ. ආර්මේනියානු සභාවේ ද මෙම සංඛ්‍යාව පිළිබඳ විශ්වාසයක් පවතී. හත්වන සියවසට අයත් Chronicle of Zuqnin නම් වංශකථාවේ විස්තර ඊට කදිම නිදසුනකි. ශාස්ත්‍රවන්තයින්ගේ ගණන පමණක් නොවේ, ඔවුන් හඳුන්වන නාමයන් සහ ඔවුන් නියෝජනය කරන ජන වර්ගයන් පිළිබඳවද ඇත්තේ විවිධ මතිමතාන්තරය භාවිත කරන නම් වල විවිධත්වයක් වැඩිපුරම දකින්නට ලැබෙන්නේ සිරියානු, කොප්තික, ඉතියෝපියානු, ආර්මේනියානු, ජෝර්ජියානු සහ පර්සියානු ආදි පෙරදිග භාෂා වලින් ලියා ඇති සාහිත්‍යයේ ය. ක්‍රි.ව. 500 දී පමණ ලියැවී ඇතැයි විශ්වාස කරන ජේසු බිළිඳුන්ගේ ළමා විය පිළිබඳ ආර්මේනියානු ශුභාරංචියට අනුව පර්සියාවෙන් මෙල්කොන් ද ඉන්දියාවෙන් ගස්පාර් ද අරාබියෙන් බැල්ඩසාර් ද නමින් රජුන් තිදෙනෙක් ආ බව ලියා ඇත. මෙම නම්වල උච්චාරණයන් මධ්‍ය කාලීන ලතින් සභාව මොවුන් හඳුන්වන ලද Melchior, Caspar (හෙවත් Gaspar ) සහ Balthassar යන උච්චාරණයන්ට බෙහෙවින් සමාන බව පෙනේ.

ශාස්ත්‍රවන්තයින් යන සිංහල අරුතින් භාවිත වන ග්‍රීක් "මැගි" (Magi) වචනය "මුනිවරුන්", "ජ්‍යොතිෂ ශාස්ත්‍රඥයින් සහ ඇතැම් විට පූජකයින් සේ සැලකුන නමුත් ආර්මේනියානු ළමා ශුභාරංචියත් සමඟම එය රාජකීයත්වයට සම්බන්ධ වචනයක් බවට පෙරළුණි. ක්‍රි.ව. 490 දී බයිසන්තියානු අධිරාජයා වූ සීනෝ (ක්‍රි.ව. 425 - 491) මෙම රජවරුන්ගේ අස්ථි ශේෂයන් පර්සියාවෙන් සොයාගෙන කොන්ස්තන්තිනෝපල් නගරයට ගෙනැවිත් ඇත. අනතුරුව කුරුස යුද්ධ සමයේදී ඒවා මිලාන් නුවරටත් අවසානයේ දී (1164 දී) ෆෙඩ්රික් බාබරෝසා අධිරාජයා විසින් ජර්මනියේ කොලෝන් නුවරටත් ගෙනැවිත් අලංකාර දෙව්මැඳුරක තැන්පත් කරන ලදි. (අද කොළොන් නුවර නිල ධජයේ ප්‍රධාන විරුද සලකුණ වන්නේ ද රතු පසුබිමේ ඇඳි රන් පැහැති කිරීට ත්‍රිත්වයේ රූප සටහනයි. එමඟින් රජතුන් දෙනා සංකේතවත් වේ.)

ශාස්ත්‍රවන්තයින්ගේ අපදානය අළලා පුරාවෘත්ත සහ සාම්ප්‍රදායික විශ්වාසයන් සමාජය තුළ ගොඩනැගී ඒමට ශත වර්ෂාධික කාලයක් ගත වී ඇතැයි කියැවේ මොවුන්ගේ නම් ගම් හෝ සංඛ්‍යාව හෝ ගැන සඳහන් නොකරන නමුත් ඔවුන්ගේ පැමිණීම ගැන පමණක් විස්තර කරන තවත් අසම්මත ළමා සුබාරංචියක් ලෙස ජාකොබ් තුමාගේ පූර්ව සුබස්නය මෙහිදී සඳහන් කිරීම වැදගත් ය. දෙවන සියවස මැද භාගයේ දී ලියැවී ඇති මෙම ලේඛනයේ මතෙව් තුමාගේ ශුභාරංචියට වැඩි යමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ජේසු බිළිඳාගේ උපත සිදුවී ඇත්තේ ගෙයක් තුළ (මතෙව් 2:11) නොව ගිරිලෙනක වන අතර පායන ලද බෙත්ලෙහෙම් තාරකාවේ ආලෝකය සෙසු සියළු තරු පරදවන සුළු වූ බව ශාස්ත්‍රඥයින් විසින් හෙරෝද් රජු ඉදිරියේ පවසන ලද බව සඳහන් කර ඇත. (අද බෙත්ලෙහෙමේ වන්දනාවේ යන පිරිස් ජේසු සමිඳුන් උපත ලත් ස්ථානය ලෙස නරඹන ගිරි ලෙන ඇත්තේ ද බෙත්ලෙහෙමේ උප්පත්ති දෙව්මැඳුරේ පොළොව යටය. එබැවින් පෙර සඳහන් කළ ජාකොබ් තුමාගේ ළමා සුබස්නයේ සඳහන් වන ගිරිලෙනක සිදුවූ උපත පිළිබඳ විස්තරයට එය සමීප වේ.)

ආදි සභා පියවරු ශාස්ත්‍රවන්තයින්ගේ වෘත්තාන්තය විග්‍රහ කිරීමට පැරණි ගිවිසුම් දිවැස් වැකි ද උපයෝගි කර ගත්තෝ ය. ඒ ගැලවුම්කරුවාණන් ලෙස ජේසුස් වහන්සේගේ ආගමනය ගැන කියැවෙන සංඥාවන් හෙබ්‍රෙව් ශුද්ධ ලියැවිල්ලේ ග්‍රීක් පරිවර්තනය (සෙප්ටුවාජින්තය) තුළ අන්තර්ගතව ඇතැයි ඔවුන් විශ්වාස කළ බැවිනි. සෙප්ටුවාජින්තය ගැඹුරින් හැදෑරූ සභා පීතෘ ජස්ටින් මාටිර් (ක්‍රි.ව. 100 - 165) තුමන්ගේ විවරණ මෙහිදී අපට වැදගත් වේ. සකල ජනතාවට ලැබී ඇති අළුත් ව්‍යවස්ථාව වන්නේ මෝසෙස් ගේ ව්‍යවස්ථාව නොව කිතු දහම බවත් ජුදා ජාතියේ එකම ගැලවුම්කාරයා වන්නේ ජේසුස් වහන්සේ බවත් ශුද්ධ ලියැවිලි අනුසාරයෙන් ඔප්පු කර පෙන්වීම ඔහුගේ අරමුණ විය. ඒ සඳහා ඔහු ජුදා රබ්බි වරයකු සමඟ සංවාදයක් නමින් ග්‍රන්ථයක් ලියමින් ගැලවුම්කරුවාණන්ගේ ආගමනයට අදාළව ලියැවී ඇති පැරණි ගිවිසුමේ දිවැස්වැකි ශාස්ත්‍රවන්තයින් විසින් සම්පූර්ණ කර ඇතිං බව පෙන්වා දුන්නේය. ඔහු මේ සඳහා යෙසායාගේ පොතේ 8:4 වන වගන්තිය උපුටා ගත්තේ ය. "මන්ද අම්මේ තාත්තේ කියා කියන්න දරුවාට හැකිවන්න පෙර දමස්කයේ සකල වස්තුවත්, සමාරියේ මුළු කොල්ලයත් අසිරියාවේ රජු විසින් ගෙන යනු ලබන්නේය" යන වැකියයි. ශාස්ත්‍රවන්තයින් යනු පෙරදිග ඇදහිල්ලක් නියෝජනය කළ පූජක පිරිසක් බවත් ඉන්ද්‍රජාල ක්‍රියා සහ ජ්‍යොතිෂයේ විශාරදයින් බවත් ජස්ටින් තුමාගේ අදහස විය. ඒ අනුව "දමස්කයේ සකල වස්තුව" සහ "සමාරියේ මුළු කොල්ලය" යනු කොඩිවින හා රූප වන්දනාව ලෙස විග්‍රහ කළ ඔහු ජේසු බිළිඳුන් වැඳ පුදාගත් පසු ශාස්ත්‍රවන්තයින් විසින් ඒවා බැහැර ලූ බව පෙන්වා දුන්නේ ය. මෙනයින් ගිරිලෙනක වෙත ආගමන මං මුලා වී මිථ්‍යා දෘෂ්ටින් පසු පස ගිය ශාස්ත්‍රවන්තයින්ගේ සිත් හැරීමේ අවස්ථාවක් සේම අභිනිෂ්ක්‍රමණයේ අවස්ථාවක් ලෙසත් විග්‍රහ කළේය. එබැවින් මතෙව් ශුභාරංචියේ එන උප්පත්ති කථාව කිතු දහම සත්‍ය වූත් නිර්මල වූත් එකම දහම බව ලෝකකයම හෙළි කරන කතන්නදරයක් ලෙසත් වැසිමනත් විවරණය කෙරිණි.

මේ අතර එවකට රෝම රාජ්‍යයට යටත් අප්‍රිකානු ප්‍රාන්ත නගරයක් වූ කාර්තේජ් හි අපෝස්තලික පීතෘවරයකු වූ ටර්ටූලියන් තුමා (ක්‍රි.ව. 160-225) ජස්ටින් තුමාගේ විවරණයන් තවදුරටත් විස්තාරාණය කරමින් ප්‍රකාශ කළේ කළින් ආ මඟ වෙනස් කර අන් මඟින් තම ගම් බිම් බලා යන ලෙස සිහිනයෙන් ශාස්ත්‍රවන්තයින්ට ලැබුණ උපදෙසින් (මතෙව් 2:12) ඔවුන් සුපුරුදු මිථ්‍යා ධර්ම මාර්ගය වෙනස් කර සත්‍යය වූ විශුද්ධි මාර්ගය දිගේ ගමන් කිරීමේ ආරම්භය මෙයින් ගම්‍යමාන කරන බවයි.

ක්‍රමයෙන් ප්‍රචලිතව ගිය මෙම අට්ය කථාවේ බලපෑම සමකාලීන චිත්‍ර කලාවට ද කාන්දු වීම වැළැක්විය නොහැකි විය. කලාකරුවෝ මෙම අටුවාවන් තව දුරටත් ගැඹුරින් විකාශනය කරනු පිණිස පැරණි ගිවිසුමෙන් ගත් නව ඓතිහාසික චරිත සමඟ ශාස්ත්‍රවන්තයින්ගේ චරිත සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම ඇරඹුවෝ ය. දිවැසිවර දානියෙල්ගේ පොතේ සඳහන් වන හනනියා, මිෂායල් සහ අසිරියා යන තරුණයින් තිදෙනා මිථ්‍යා රූප වන්දනාව ප්‍රතික්ෂේප කිරීම නිසා නෙබුකද්නෙසර් නම් පර්සියාන රජුගේ අණ පරිදි ගිනි උදුනට විසි කරන ලදුව ස්වාමින් වහන්සේගේ දූතයා ඔවුන් මරණයෙන් බේරාගත් පුවත (දානියෙල් 1:1-68) මේ සඳහා කලාකරුවෝ උපුටා ගත්තෝ ය. පර්සියාන රජ මාලිගය ඇසුරු කළ දානියෙල් දිවැසියා සහ හෙබ්‍රෙව් තරුණයින් මිථ්‍යා දෘෂ්ටික ප්‍රතිමා වන්දනා කිරීමේ විපාකයට එරෙහිව තම දිවැසියාවත් සිහින තේරීමේ හැකියාවත් යොදා ගත් බව සඳහන් වේ.

සිතුවම්කරණයේ දී කලාකරුවෝ ශාස්ත්‍රධාරින් තිදෙනා සමඟ මෙම පැරණි ගිවිසුම් චරිත තුනද දෙයාකාරයකින් මිශ්‍ර කළෝ ය. පර්සියානුවන් සහ වෙනත් පෙරදිග වැසියන් සමඟ රෝමවරුන් පොදුවේ භාවිත කළ ඇඳුම් පැළඳුම් මෝස්තර සහිතව ඔවුන් ඉදිරිපත් කිරීම පළමුවන ආකාරයයි. ඒ අනුව බඳ පටි සහිත කෙටි කළිසම්, එක් උරහිසක් මත එකට කැටි බඳ පටි සහිත කෙටි කළිසම්, එක් උරහිසක් මත එකට කැටි කළ උතුරු සළු, ඉදිරිය නෙරාගිය ලිහිල් දිගැටි බූට් සපත්තු සහ මුදුන් වූ හිස් වැසුම් ආදි ඇඳුම් පැළඳුම් සිතුවමට නැගුණි. දෙවන ආකාරය වූයේ රෝමයේ මාකස් සහ මාසිලියානුස් ගේ කැටකොම්බයේ සිතුවම්වල නිරූපිත පරිදි ශාස්ත්‍රවන්තයින්ගේ ත්‍රිකාය සමඟ දානියෙල් ගේ පොතේ එන තරුණයින්ගේ ත්‍රිකාය සැසඳෙන සේ එක තැන සිතුවමට නගා ඉදිරිපත් කිරීමයි. ප්‍රංශයේ ආර්ල්ස් හි සාන්ත ගිලෙස්ගේ ශෛලමය මිනී පෙට්ටියේ පිටත නෙලා ඇති පෙරදිග ඇඳුමෙන් සැරසුන මිනිසුන් තිදෙනෙක් දේව පිළිමයක් රැකවල් කරන සොල්දාදුවකු මඟ හැර බෙත්ලෙහෙම් තාරකාව දෙසට අත් දිගුකර ගමන් කරන ආකාරය රැගත් දර්ශනයකි. මෙය හතරවන සියවසට අයත් ය. මෙම තිදෙනා දානියෙල් පොතේ තරුණයින් තිදෙනා සමඟ ශාස්ත්‍රවන්තයින්ගේ සංයුක්ත අදහසක් ඉදිරිපත් කරන බව අදහස් කරයි.

ශාස්ත්‍රවන්තයින් සත්‍ය වූ කිතුනු ඇදහිල්ලට සාක්ෂි දැරීමේදී පිළිබිඹු කරන භූමිකාව ගැන ඇලෙක්සැන්ඩ්‍රියාවේ ඔරිගන් (ක්‍රි.ව. 182-254) නම් සභා පීතෘවරයා විස්තර කරන්නේ පැරණි ගිවිසුමේ බාලාම්ගේ දිවැස්වැකි අනුසාරයෙනි. ඔහුට අනුව ශාස්ත්‍රවන්තයින් තාරුකාව දුටු පසු තමාන් සතුව තිබූ මායාකාරී ගුප්ත වශී ගුරුකම්නවල බලය ව්‍යර්ථ වී යනු අත්දැක ඇත. ඊට හේතුව කුමක්දැයි සෙවීමට වෙහෙසුන ශාස්ත්‍රවන්තයින් හැදෑරූ පොත් අතරින් "ගණන් කථාවේ" 24:17 වගන්තිය හමු වී ඇත. ඒ බාලාම් නම් දිවැසියා කලකට පෙර කී දිවැස්වැකියකි. එහි අරුත වන්නේ ඊශ්‍රායෙල් වංශයේ ජාකොබ් ගේ පෙළපතින් බලවත් රජෙකු බිහිවන බවයි. එබැවින් මෙම බලසම්පන්න නිරිඳා මෙලොවට දැන් පහළ වී ඇතැයි ඔව්හු අනුමාන කළෝය. අනතුරුව ඔවුහු මෙම නිරිඳා සොයා ජුදෙයාවට පැමිණියෝ ය.

බාලාම්ගේ අනාගත වාක්‍යය පදනම් කරගෙන ඔව්හු අහසේ පායා ආ ධූම කේතුවේ දර්ශනයත්, ස්ව ගුරුකම් බලය බිඳී යෑමත් යන කාරණාවන් අවධානයට ගනිමින් උපත ලත් මෙම බලවන්තයා දෙවි - මිනිස් ස්වභාවයෙන් යුත් අසමසමයෙක් බව තීරණය කළෝ ය. ඔරිගන් තුමා විනග්‍රහ කර පෙන්වන විධියට ශාස්ත්‍රන්තයින් යනු හුදෙක් ජේසු සමිඳුන් බැහැදුටු ආගන්තුක පිරිසක් පමණක්ම නොවේ. උන්වහන්සේ විමුක්තිදායකයාණන් යැයි හඳුනාගත් ලෝක ඉතිහාසයේ පුරෝගාමී ඇදහිලිවන්ත පිරිසක් ද වේ.

ශුභාරංචි රචක මැතිව් තුමා බාලාම්ගේ තරුව සමඟ ශාස්ත්‍රවන්තයින්ගේ ආගමනය යන සිදුවීම් දෙක එකිනෙක ගැටගසන්නට උත්සාහ දරා නැතත් මුල් සභාව නම් මෙම සංසිද්ධීන් අතර සබඳතාවයක් තිබෙන බව තහවුරු කරන ලද බවට සාක්ෂි තිබේ.

**ඉදිරියට....**

**රංජිත් නිමල් කුරේරා**

# පුංචි සිතුම්ගේ නත්තල් සිහිනය

පුංචි සිතුම්ට මිහිරි නත්තලේ සුවඳ දැනුණා. කඩ සාප්පුවල සුවිසල් මන්දිරවල දිලිසෙන විසිතුරු පාට පාට විදුලි බුබුළුවල ආලෝකයෙන් බැබළෙන නත්තල් ගස් දැක්ක සිතුම්ගේ පුංචි සිත කලබල වුණා.

හැම නත්තලකටම විසිතුරු නත්තල් ගසක් හැදීමේ සිහිනය බොඳවී ගියේ ඔහුගේ නැතිබැරිකම නිසාමයි. ගෙයි ඇලවුණු බිත්තියක කෙළවර මල්ලී එක්ක පහල වෙලෙන් ගෙනා කිරි මැටිවලින් හදපු සුරුවම් ටික තියලා හදන ගවලෙන ළඟ ලස්සන විසිතුරු නත්තල් ගහක් හිටෙව්ව නම් කොච්චර අගේද?

"අම්මේ මට රු. 200 ක් දෙන්ඩ"

"රු. 200 ක්....

මොනවට ද පුතේ ඔච්චර සල්ලි"

"අනේ අම්මේ මට මේ සැරේ ලස්සන නත්තල් ගසක් හදන්න ඕනෑ"

"ඉතින් පුතේ නංගිට දුන්නෙත් කහට තේ ටිකක්"

මගේ අත හරියේ තියෙන්නෙත් රු. 200 ක් විතරයි"

"හරි හරි අම්මේ කමක් නෑ....

අර බට ගහෙන් අත්තක් කපලා මේ සැරෙත් නත්තල් ගසක් හදන්නම් කෝ."

සිතුම් අම්මගේ ඇස් වලින් මිණි කැට වගේ කඩා හැලෙන කඳුළු දැකලා " අනේ අම්මේ මට සල්ලි එපා" අම්මා දෑතින් කඳුළු පිසදාගෙන "පුතේ, මේක ගන්න, මම නංගිට මාමලගේ කඩෙන් ණයට කිරි පිටි පැකට් එකක් ගන්නම්..." කියා අම්මා සිතුම්ට රු. 200 ක් දුන්නා. සිතුම් හිමිදිරි උදයෙම ඉක්මන් ගමනින් නගරයට ගියා.

උදෙන්ම නගරයට පැමිණි කස අතු පුරවපු ලොරියක් නවත්වලා තිබුණා. සිතුම් එතැනට ගිහින් ඒ ලොරියේ මාමලා දෙන්නට කස අතු බාන්න උදව් වුණා. "ලොකු අතු වෙනම ගොඩ ගහන්න, පොඩි අතු වෙනම ගොඩ ගහන්න." කියා ඒ අය සිතුම් ට ඇරවුම් කළා. සිතුම් ඔවුන් කී විදිහටම ඒ වැඩේ පිළිවෙලට කළා. ඒ අය සිතුම්ට උදේ කෑමත් දුන්න. "ඔය ළමයා කැමති කස අත්තක් තෝරාගන්න. මෙන්න එහෙනම් ඔයාට කස අතු දෙකක්ම". සිතුම් හරිම සතුටින් කස අතු දෙක අරගෙන ඉදිරියට ගියා. "ආ. සිතුම් ඔයා මේ සැරේ නත්තල් ගස් දෙකක්ම හදනවා වගේ".. දෙයියනේ හිරුෂ දැක්කද දන්නෙ නෑ මං කස අතු ලොරිය ළඟ වැඩ කරනවා. සිතුම්ට නිකමට හිතුණා. "මෙන්න ඔයාටත් කස අත්තක්" අනේ සිතුම් අපේ අම්මා නත්තල් ගහ හදලත් ඉවරයි. තාත්තා ඉතාලියෙන් එවපු සුදු නත්තල් ගහ පෝච්චියක ගහන්න විතරයි තියෙන්නේ "සුදු නත්තල් ගහක්" "ආ කමක් නෑ මං ඔයා දෙන නත්තල් ගහත් ගන්නම්කෝ. එන්ඩ එන්ඩ ඔයාටත් නත්තල් සැරසිලි ටිකක් අරගෙන දෙන්නම්. අම්මා මට ඇතිවෙන්න සල්ලි දුන්නා. මෙන්න ඔයාටත් බලුප් වැලක්...."

සිතුම් යාළුවා දුන්නු නත්තල් බඩුයි නංගිට ගත්ත කිරි පිටි පැකට් එකයි සිලි බෑගයක දාගෙන කස අත්තත් කරේ තියාගෙන සිතුම් ගෙදර ගියා.

සිතුම් සතුටෙන් ගේ දෙසට පා නැගුවත් හරි පාලු ගතියක් දැනුණා. සිතුම්ගේ පපුව ඩිග් ඩිග් ඩිග් ගාලා ගැහෙන්න පටන් ගත්තා. කිසිම කෙනෙක් එළියට ආවේ නෑ. ගෙට ගොඩ වුණා විතරයි මල්ලියි නංගියි එළියට ආවා. නංගි හොඳටම අඬනවා. "කෝ... මල්ලි අම්මා... "අම්මා ම්... ම්..." "මොකද මල්ලි අම්මට" "අම්මව ස්පිරිතාලයට අරගෙන ගියා" "ස්පිරිතාලෙට?" "අම්මා කුස්සියේ වැටුණා"

අනේ දෙවියනේ! අපේ අම්මට මොකද වුණේ. අපේ තාත්තා රස්සාවක් හොයාගෙන ගෙදරින් ගියේ නත්තලට සල්ලි ටිකක් හොයාගෙන එන්න නේද? මේ විදිහට සිතුම්ගේ මනසට සිතුවිලි ගොඩක් ගලාගෙන ආවා. නංගිව වඩා ගත්ත සිතුම් කුස්සියට ගිහිල්ලා දන්න විදිහට කිරි හදලා පෙව්වා. ඉතිරි කිරි ටික මල්ලිට දුන්නා.

රෑ බෝ වුණා. සිතුම්ගේ දුක වැඩිවුණා. නංගිට, මල්ලිට හොරෙන් සිතුම් ඉකිබිඳිමින් ඇඬුවා. අම්මා නැති දුකෙන් නිදිමතේ හූල්ලන නංගිව තුරුල් කරගෙන සිතුම් කැඩිච්ච ඇඳේ ඇල වුණා. කිසිම භය හතරක් නොදන්න දඟකාර මල්ලි බිම ආලා තිබුණු නත්තල් ගහ ඇලවෙලා තියෙන බිත්තිය අයිනේ ලෑලි පෙට්ටියක පස් පුරවලා හිටෙව්වා. අත් වැඩවලට දිලිසෙන ටොෆි කොලවලින් හදපු නත්තල් සැරසිලි, අයියා ගෙනාපු අලුත් නත්තල් සැරසිලි සේරම නත්තල් ගහේ එල්ලුවා. ගවලෙනක් පිදුරා ආලා ලස්සනට හැදුවා. නත්තල් දා රෑ දොළහ වෙද්දි හැම තැනම වෙඩි හඬ පැතිරුණා. සිතුම් අඩ නින්දෙන් අවදි වෙලා බලනකොට මල්ලි හොඳටම වැඩ. ඔහු මල්ලිට ටිකක් උදව් වුණා. හිරුෂ අරගෙන දුන්න බලුප් වැල පරණ කාර් බැටරියක උදව්වෙන් පත්තු කළා. සිතුම්ගේ මල්ලිට නම් පුදුම සතුටක් සිතුම්ට නම් පුදුම දුකක්. අරුණ උදයේ දිලිසෙන තරුවැල් වසාගත් ලා හිරු රැස් පතිත වෙද්දි ඒ දෙස හිස් බැල්මක් හෙලා සිටි සිතුම්ගේ කම්මුල් දිගේ ඇද හැලුණු කඳුළු වැල් බිම දිගේ දිය ධාරාවක් වගේ ගලාගෙන ගියා. දවල් වේගෙන එන විට සිතුම්ට රෝහලට දුවන්න හිතුණා. "අනේ ජේසුනි!, අපේ අම්මාව රැකබලා ගන්න." මේ විදිහට සිතුම් ජේසු සමිඳුන් යදින්න ගත්තා.

හදිස්සියෙම ත්‍රීවිලයක් ගේ ඉදිරිපස නැවතුණා තාත්තා බෑගයක් බරටම අරගෙන ත්‍රී විලයෙන් බැස්සා. පොඩි මාමාගේ නැන්දා බබෙක් තුරුළු කරගෙන ඉදිරියට ආවා. තාත්තා අම්මාවත් අල්ලගෙන හෙමින් හෙමින් ගේ දෙසට ආවා. පොඩි මාමාත් ත්‍රීවිලය නවත්තලා ගේ ඇතුළට ආවා. කට්ටියම මල්ලි අටවපු ගවලෙන ළඟ දණ ගැහැව්වා. සිතුම් ආච්චි අම්මා වියා දුන්නු රටා ආපු පන් පැදුර දිග හැරියා. නැන්දගේ අතේ උන්නු පුංචි මල්ලි බබාව ජේසු ළඟ තිබ්බා. නංගිත් හිනා මුණෙන් එතැනට ආවා. නංගි බබා දෙස සතුටින් බලාගෙන හිටියා. වැඩි වේලාවක් ගියේ නෑ. හිරුෂ දවල් කෑමත් අරගෙන ගෙදර අයත් එක්ක එතැනට ඇවිල්ලා, හිරුෂ අම්මාගේ ෆෝන් එක අතට ගත්ත. ලස්සන ගීතයක්.

බෙත්ලෙහෙමේ අද රෑ උපන්නා<br>
ලස්සන බිළිඳෙක් මල් වගෙයි<br>
මවගේ ළයේ සුරතල් විඳින්නා<br>
මුතුවැනි රූ සපුවයි ඇගේ

මේ විදිහට පුංචි සිතුම්ගේ නත්තල් සිහිනය සැබෑ වුණා.

**එල්සි මුදලිගේ නැන්දා - මීගමුව**

# සලෝමි ජේසු උපන් තිඹිරිගෙට එබී බැලුවාද?

**2013. 12. 22 ලිපිය හා සබැඳේ..**

ජන සංගණනය දින බෙත්ලෙහෙම
බහෙවින් ජනාකීර්ණව පැවැතිනි.
ඩකඩක් ඇති සැම තැනක්ම
ගන්තුකයන්ගෙන් හා ඥාතින්ගෙන්
රී ගොසිනි. නැවතීමට තැනක් සොයා
ැනීම ජුසේ තුමාටත් මරිය තුමීටත්
ලහෙසි පහසු කාර්යයක් නොවීය.
මුදල් ගෙවා නැවතිය හැකි
වාතැන්ගෙයි පවා ඉඩ නොතිබුණෙන්
වහලක තිබූ ඉඩකඩෙහි නවාතැන්
ත්හ. කෙසේ වෙතත් දුරදක්නා
ුවණින් යුතු ජුසේ තුමා කල්තියා
න්නඹු මාතාවකගේ සේවයට සූදානම්
කාට තබා ගත්තේ ය. ජුසේ තුමාගේ
පර සූදානම තහවුරු කරමින් එදා
ත්‍රියේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ
දේව පුත්‍රයාගේ) උපත සිදුවිය. ඒ පිළිබඳ
විස්තර වාර්තා මතෙව් තුමාගේ සහ
ක් තුමාගේ සුවිශේෂවල සඳහන් වේ.
තෙව් 1:18-25/ ලූක් 2:1-21) ඒවා අපි
ළි යළිත් අසා කියවා ඇත්තෙමු.

ඒ ආශ්චර්යවත් උත්පත්තිය

එහෙත් එදා රාත්‍රියේ සිදු වූ තවත්
ෂ්මිත දෙයක් ගැන ද තොරතුරු
න් අනාවරණය කරගෙන ඇත.
එම උපත සිදු වී ඇති අපූර්වතම
කාරය ගැනයි. අපට එතරම් නුහුරු
ම අනාවරණයට පාදක වී ඇත්තේ
තානායේ මැන්චැස්ටර් විශ්ව
දයාලයේ පුස්තකාලයේ තිබී සොයා
ත් ක්‍රි.ව. සයවැනි සියවසට අයත්
ැත් දල වලින් කරන ලද කැටයම්
ත්‍රයකි. මෙම සිතුවමේ ජේසු උපත,
ම්භීරත්වයකින් තොරව නමුත් විවිධ
තාරතුරු අන්තර්ගතයක් ලෙස කොටස්
දකකට සිතුවම් කොට ඇත. එහි ඉහළ
කාටසේ දේව මෑණියන් විසින් ජේසු

බිළිඳු සිය ඔඩොක්කුවේ හිඳුවාගෙන සිටින ආකාරය දැක්වේ. එහි පෙරදින ශාස්ත්‍රවරුන් තිදොනාගේ රූ සටහන් ද දැක්වෙන අතර ජේසු බිළිඳුගේ හිසමත ඔටුන්නක් ද පළඳවා ඇත.

ඊට පහළින් නිරූපිත චිත්‍රයේ දේව මාතාවන් ජේසු බිළිඳා ගව ඔරුවක සතපවා එය ගඩොලින් තැනූ පූජාසනයක් වැන්නක තබා ඇති අයුරු දැක්වේ. එහි පසුබිමේ ගවහල අයිතිකරුගේ සතුන් කිහිප දෙනෙකුගේ රූ සටහන් ද දැක්වේ. ඊට අමතරව එහි පැත්තකින් තවත් එක් කාන්තා රුවක් ද සටහන් වී ඇත. මේ පිළිබඳව මැන්චැස්ටර් සරසවිය, ෂෙපීල්ඩ් සරසවිය, ඔක්ස්ෆර්ඩ් සරසවිය යන ආයතනවල පුරා විද්‍යාඥයින් හා වෙනත් බහුශ්‍රැත ඉතිහාසඥයන් ද එකතුව ක්‍රි.ව. 2000 දී ගැඹුරු විමර්ශනාත්මක අධ්‍යයනයක යෙදුණහ. එහිදී ඔවුන් විසින් අනාවරණය කරගත් කරුණු එක්කොට ජෝර්ජ් ජේ. බෲක් නම් කතුවරයා විසින් “ජේසු උපත” නමින් ග්‍රන්ථයක් පල කොට තිබේ. එය වර්ෂ 2000 දී එංගලන්තයේ දී මුද්‍රණය කොට ඇත. එහි අඩංගු ඇතැම් කරුණු සිංහල පාඨකයන්ගේ දැනගැනීම පිණිස, නොබෝ දා ස්වර්ග ස්ථ වූ අපේම පර්යේෂණාත්මක ලිපි සපයන්නකු වූ ගරු තිමති කොලමුන්නේ පියතුමා විසින් තම “යාගික මහෝත්තම පූජකයාණෝ” නමැති ග්‍රන්ථයෙන් හෙළි කොට තිබේ. ඉහත විද්‍යාඥයන් විශේෂයෙන් විමර්ශනයට ලක් කළේ එහි සටහන් වූ අමතර කාන්තාව හා ඇගේ කාර්යභාරය පිළිබඳවය. ඒ සඳහා ඔවුහු මළ මුහුද ආශ්‍රිතව මෑත දී හමු වූ කුම්රාන් ලියකියවිලි හා ග්‍රීක ඓතිහාසික පුවත් හා මුඛ පරම්පරාගතයන් රාශියක් පරිශීලනය කළහ.

ඒ අනුව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උපත සාමාන්‍ය දරු උපතක් ලෙස සිදු වී නැති බව ඔවුහු නිගමනය කළහ. මේ අසිරිමත් දරු උපත පිළිබඳ ඇසින් දුටු සාක්ෂිකරුවන් වූයේ කුමරි මරියාවන් හා පෙර කී වින්නඹු මාතාවය. වින්නඹු මාතාව එයින් මවිතයට පත් විය. ඇය ඒ තිඹිරිගෙයින් නික්ම ගවහලින් පිටතට ආවේද ඒ තෝන්තුවාවෙනි. ඒ වේලාවේම එතැනින් ගමන් කරමින් සිටි සලෝමි ද ඇයට මුණ ගැසුනි. මේ අරුම පුදුම සිද්ධිය ඇය සලෝමිට ද කීවාය. එහෙත් එයින් නොසෑහුණු සලෝමි (තෝමස් අපෝස්තුළුවරයා මෙන්) තමාම එහි ගොස් බලනු පිණිස වහා අවුත් තිඹිරි ගෙට ඇතුළු වූවාය. සැකය දුරුකර ගනු පිණිස ඇය මරිය තුමී ස්පර්ශ කර බැලුවාය. පුදුමයකි! ඇගේ අත ගින්නකට හසුවූ කලෙක මෙන් වියැලී ගියේය. සලෝමි මහත් සේ බියපත්ව මනස්ථාපවන්නට වූවාය. ඇයට කළ හැකිව තිබුණේ ස්වාමීන් වහන්සේට යාච්ඤා කරමින් භාවනා කිරීම පමනි. ඒ අතරතුර දේව දූතයකු විසින් ඇය අමතා ගවලෙනට ගොස් ජේසු බිළිඳුන් ස්පර්ශ කරන ලෙස දන්වන ලදි. ඇය එසේ කළාය. ඇගේ අත සැණෙකින් සුව විය. එහෙත් ක්‍රිස්තුන් වහන්සේ වැඩී ජෙරුසලමෙට එන තෙක් එය කිසිවකුට හෙළි නොකරණ ලෙසද ඇයට ආණ කෙරිණ. සලෝමී තම පුතුන්ට ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ “අග සව්” තනතුරු පැතුවේ මෙවැනි ඇඩි සම්බන්ධකම් සිත තබාගෙන බව අපට ද සිතා ගත හැකිය.

(විවිධ කිතුනු ලිපි ලේඛන හා ග්‍රන්ථ කිහිපයක් ඇසුරිනි)

**පමුණුගම**
**එන්. එම්. පෙරේරා**

# පළමු නත්තල් සුබ පැතුම



**ම**රියතුමී හා ජුසේ තුමා තානායමේ ඉඩකඩ නොතිබුණ
බැවින් ගවලෙන පිරිසිදු කරගෙන එහි නවාතැන් ගත්හ.
එත් පිදුරු අතුරා සාදාගත් නිදියහන ඔවුනට සුව යහනක් ම
ය. මැදියම් රැයේ මරියතුමී තම කුළුඳුල් දරුවා බිහිකර හාන්
රදි වලින් ඔතා ගවඔරුවේ තැබුවාය. ජුසේ තුමා ද පරිශුද්ධ
ළිඳා දෙස හද බැතියෙන් යුතුව බලා සිටි අතර, දේව දූතයෝ
හිරි හඬින් පැසසුම් ගී ගයන්නට වූහ.

මේ මොහොතේ තම බැටළු රැළ රකිමින් සිටි එඬේරුන්ට
ේව දූතයෙක් දර්ශනය විය. “ස්වාමීන් වහන්සේගේ තේජස්ශ්‍රීය
ඔවුන් සිසාරා බැබළිණි. ඔව්හු අතිශයින් බියපත් වූහ. එහෙත්
ේව දූතයා ඔවුන්ට කතා කොට, බිය නොවන්න, මෙන්න
කල ජනයා හට ඉතා ආනන්දජනක මංගල පුවතක්. මම
බ වෙත ගෙනෙමි. මක්නිසාද ස්වාමීන් වන ක්‍රිස්තුන් නම්
ැලවුම්කාරයෙක් ඔබ හට දාවිත්ගේ නුවර අද උපන්නේ ය.
රදි වලින් ඔතා ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ඔබට
ම්බ වන්නේය. එය ඔබට සලකුණ ය”යි කීය. (ශු. ලූක් 2:9-
) ඒ සමඟම දේවදූතයන් රැසක් ස්වර්ගයෙන් බැස අවුත් ගී
යන්නට වන.

මෙයයි පළමු නත්තල් සුබ පැතුම

දේවදූතයින් ගැයූ ගීය නම් “අති උසස් තැන්හි දෙවිඳුන්ට
හිමය ද මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද
වේවා” (ශු ලූක් 2:14) යන්නයි. මේ සුබ පැතුම දේව දූතයින්
ැවසුයේ දිළිඳු එඬේරුන්ටය. ඔව්හු වහාම ගොස් ගවඔරුවේ
ටි ජේසු බිළිඳාණන්ට වැඳ නමස්කාර කළෝ ය. ජේසු
මන්ගේ මංගල වාක්‍ය වූයේ ද “දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝ
මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යයද ඔබගේය” (ශු. ලූක්
20) යන්නයි. යෙසායා දිවැසිවරයා සඳහන් කර ඇති පරිදි
ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. දිළිඳුන් හට
බාරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ
ස්ක.” (යෙසායා 61:1), (ශු. ලූක් 4:18) නාසරෙත්හිදි ජේසුතුමා
ළ පළමු දේශනයයි.

මේ නත්තල දිළිඳුන්ගේ ය. එම නිසා අපි දිළිඳුන්ට සංවේදී
න, දිළිඳුන් නගා සිටුවන, දිළිඳුන් හා බෙදා ගන්නා නත්තලක්
රගනිමු. එවිට ජේසු බිළිඳුන් ජීවමානවම අප සමඟ වැඩ
සනු නොඅනුමානය.

**වෙන්නප්පුවේ වික්ටර් දෙහිපිටිආරච්චි**

## සිලි සිලියේ

ලි සිලියේ මද සුළඟයි - සුළඟේ තුරුවැල් මුමුණනවා
තයි සීතයි ගත දැවටෙන්නේ සිත් තුළ මුමුණනවා
ත්තල ආවා - නත්තල ආවා හද තුළ මුමුණනවා
ජේසු උපත හැඟුනා - ජේසු උපත හැඟුනා සිත මුමුණනවා

ස්සන කුමරි - ලස්සන කුමරි - මරියාවෝ සුකුමාලයි
ිඳු හඬට අවනත වූවෝ - අවනත වූවෝ හද සසලයි
මින් වරමින් ස්ප්‍රිතු මව් පදවිය ලැබුවා පින් සිරියයි
ේමේ සුරින්දා. ප්‍රේමේ නිරින්දා තරු වියනයි. සුරගීයයි බිළිඳු හඬයි

**සුනීතා මාලනි විජේසිංහ**
මතුගම

## ගවහල දුටු සඳ

ගවඔරුව තුළ මිණි පහන සුවනින්දෙ දැක
තරු රෑනක් හා සඳ කුමරිය ඔබ දෙස බලනු පෙනේ
සාමයේ අරුත ලොවට පසක් කළ දෙව් බිළිඳාට
රෑමල් කුමරියන් ළං වී ඇත සුවඳ මල් පුදන්න.....

දහම් වදනින් අප හදවත් අවදි කර වන්න
දයා බරිතව අප දෙස බලනවද පින්බර දෙනුවන් හැර
කියා දෙනු මැනව....... සිතට ගතට ජේසු බිළිඳුනි
දිනෙන් දින අපකරනා පාප සිතුවිළි...... නිමාකර ගන්න.....

**ආර්. ජෝශප් ප්‍රිය**
කොටිකාවත්ත

# රෝහලේ නත්තල

**රෝ**ගී තත්ත්වයෙන් අසරණව, වේදනාවෙන් පීඩිත වී, ආර්ථික ගැටළු වලට මුහුණ දෙමින් ගතින් සිතින් දුබල වූවන් රෝහලේ දී තරම් වැඩි පිරිසක් හමුවන තැනක් අපට එකවර මතකයට නොඑයි. රෝගියකු බවට පත් වූ විට මහා නිරිඳෙකු වූවත් අසරණය. තවකෙකුගේ පිහිට අවශ්‍යමය. තමාගේ නිරෝගී භාවය නැවත ඇතිකර ගැනීමට ඒ සඳහා දැනුමැත්තෙකුගේ උපදෙස් අවවාද පිළිපැදිය යුතුමය. තමාගේ සුපුරුදු ජීවන රටාව වෙනස් වී රෝගී සයනයක ගත කළ කෙනෙක් ඒ අත්දැකීම සිතින් මකා දැමීමට එක්වරකට දහස් වරක් කැමතිය. එවන් වූ අසරණ අවස්ථාවක ජාතිය ආගම කුලභේද නොසලකා පිහිට ලැබීම සැබවින්ම උත්තරීතර සහනයකි. මෙවන් වූ අවස්ථාවක තම ජීවිකා වෘත්තිය තුළින් ජේසු සමිඳුන් අත්දකින පිරිසක් ලෙස රෝහලේ කාර්ය මණ්ඩලය හඳුන්වා දිය හැකිය. ඒ අතරින් හෙදකම විශේෂිත වනුයේ රෝගියා සමඟ රෝහලේදී දිවා රෑ පුරාම උරනුර ගැටී තම සේවය අඛණ්ඩව පවත්වා ගැනීම නිසයි.

රෝගියාගේ කායික මානසික ආධ්‍යාත්මික අවශ්‍යතා මැනවින් හඳුනාගෙන සෞඛ්‍ය සම්පන්න භාවයට උපරිමයෙන් ළං වීමට, වේදනා අඩු කිරීමට, සැප පහසුව ළඟා කර ගැනීමට හෙදකම, වෙදකම තරමටම අවැසිය. මෙහිදී කතෝලික හෙදිය වැදගත් භූමිකාවක් දරන්නේ ඇයගේ ආධ්‍යාත්මය ශුද්ධාත්ම ආලෝකයෙන් පූර්ණ වී ඇති බැවිනි. කාරුණික හදවතක්, බුද්ධිමත් මනසක් හා කඩිසර දෑතක් ඇතිව රෝගියාට උවටැන් කිරීමට ඇයව තෝරාගෙන තිබීම දේව සැලැස්මේ අති උත්තම වරප්‍රසාදයකි.

හෙදකමේ යෙදෙන සැමවිටම හෙදිය දෙවියන් අත්දකියි. දේව කැමැත්තට හා සැලැස්මට ජීවමානව සම්බන්ධ වේ. දුප්පත් අසරණ වූවන් සමඟ නත්තලේ සාමය, සතුට බෙදා ගන්නා අසිරිමත් මොහොතේ දීද මේ දේව වරප්‍රසාදය කතෝලික හෙදිය හා බැඳුණු ශ්‍රී ලංකා කතෝලික හෙද සංගමයට සුවිශේෂි වූ අවස්ථාවකි. නත්තලේ සැබෑ අරුත කුළු ගන්වමින් කතෝලික හෙද සංගමයට රෝහලේ වෛද්‍යවරු ඇතුළු අනෙකුත් සහෝදර සේවක මඬුල්ලෙන්, ශාන්ත එවුජින් ස්වෙච්ඡා සංගමයෙන්, මහ බැංකුවේ කතෝලික සංගමයෙන්, මැද කොළඹ දිසා දිව්‍ය හෘදය සමිතියෙන්, පෞද්ගලික රෝහල්වල කතෝලික හෙද හෙදියන් දක්වන අනුග්‍රහය, ලබා දෙන සහය රෝගී සුවසෙත සඳහාමය වෙයි. මේ හැම දෙයකටම පහනක් ලෙස දීප්තිය ලබා දෙන රෝහල් උපාධ්‍ය නිර්මල මරිය නිකායික ගරු පියතුමන් අග නගරය පුරා රජයේ රෝහල් හා සම්බන්ධ වෙමින් කිතුතුමන් අප අතර තබා ගිය සාමය සතුට බෙදා දීමට සියළු අවවාද අනුශාසනා දේශනා කරති.

විශේෂයෙන් නත්තල් සමයේ ශ්‍රී ලංකා ජාතික රෝහල, ජාතික අක්ෂි රෝහල, අංගොඩ මානසික රෝහල, මුල්ලේරියාව මානසික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල, කාසල් වීදියේ කාන්තා රෝහල, ද සොයිසා කාන්තා රෝහල, බොරැල්ල ආයුර්වේද රෝහල මෙන්ම ගම්පහ මහ රෝහල, මීගමුව මහ රෝහල, රාගම මහ රෝහල, වැලිසර ළය රෝහල ආදි රෝහල්වල නත්තල් කැරොල් ගායනා වැඩසටහන් හා නේවාසික රෝගීන්ට තෑගි බෙදා දීම සිදුකෙරේ. මෙවරද දෙසැම්බර් මස අටවන ඉරුදින සිට ඉහත කී රෝහල්වල විශේෂ කැරොල් ගායනා පැවැත්විණි.

මෙහිදී සෑම නේවාසික රෝගියකුටම ත්‍යාග ප්‍රදානය කරන අතර සෑම රෝගියකුගේම ඇඳ අසලටම ගොස් නත්තල් කැරොල් ගායනා ඉදිරිපත් කරති. ඇඩි සත්කාර ඒකක වලදී පමණක් පොදුවේ කැරොල් ගායනා කෙරෙනුයේ රෝගීන්ගේ සුව සහනය උදෙසා ම ය. නත්තලේ බලාපොරොත්තුව සමඟින් ජුසේ තුමා හා මරියතුමී කුඩා ජේසු බිළිඳා සුරදූතයන් ඔවුන් පිරිවරා සිටිති. නත්තල් සීයා සාමයේ පණිවුඩය දන්වමින් “සැමට සුභ නත්තලක් වේවා” යැයි සියල්ලන්ටම පවසන්නේ ය. මෙසේ ඇරඹෙන පෙරහැර රෝහල් උපාධ්‍ය පියතුමන්, සහෝදරතුමන්, පැවිදි සොහොයුරියන්, පූජක සිසුන් පෙරටුකොට ගනී. කතෝලික හෙද හෙදියන්, රෝහලේ අනෙකුත් සේවක මණ්ඩලයේ කතෝලික සාමාජික සාමාජිකාවන්, ශාන්ත එවුජින් ස්වෙච්ඡා සංගමයේ සාමාජික සාමාජිකාවන්, වත්තල ශාන්ත ආනා බාලිකා විදුහලේ බාලිකාවන් එකමුතු වී පෙළ ගැසෙති. ගායන , වාදන හඬින් ජේසු තුමන් ලොවට දායාද කළ ප්‍රේමය, ඉවසීම, කරුණාව, බෙදා ගැනීම, එකමුතුකම මුතු පබළු ලෙස රෝහල පුරා විසිරී යයි. වේදනා විඳින දෑස් ඒ පබළුවල දීප්තියෙන් ප්‍රබෝධමත් වේ. බෝනික්කෙකු, සෙල්ලම් කාරයක් තෑගි ලබන පොඩිත්තෝ නත්තල් සීයා ජීවමානව දැකීමෙන් කඳුළු හංගා ගනිති. ඇඩි ලෙස රෝගි වූ දරුවකුගේ මවක් පියතුමන්ගෙන් තම දරුවාට ද ආශිර්වාද ලබා ගැනීමට කඳුළු පිරි දෙනෙතින් ආයාචනා කරන්නේ ආගම් භේද අමතක කරමිනි. මානසික රෝහල් වලදී අප ලබන අත්දැකීම් අනෙක් රෝහල් අබිභවා බොහෝ සංවේදී වෙයි. විශේෂයෙන් මුල්ලේරියාව අතරමැදි නිවස්නයේ සාමාජිකාවන් මේ ලොව පවුල නමැති කුටුම්භයෙන් අමතක කර දමා ඇති පිරිසකි. ඔවුන්ට ලැබෙන පුංචි කෑම පාර්සලය, ඇසෙන නත්තල් කැරොල් ගායනය ඔවුන්ගේ සිතට පහන් සිතුවිලි ඇති කරයි. කාන්තා රෝහල් හි අළුත උපන් බිළිඳා තුරුල් කරගෙන සිටින මව්වරු ජේසු බිළිඳුන් තුරුළු කරගෙන “බාලොලි බාලොලියෝ” ගීතිකාව ගයමින් සිටින මරියතුමී දැකීමෙන් දරු සෙනෙහසින් තම ලය පුරවා බර කර ගනිති. මෙහිදී අප අත්දකින පැහැබර අත්දැකීමක් වනුයේ බොදු හිමිවරුන් ද, හින්දු ආගමික පූජකවරුන් ද , මුස්ලිම් ආගමික පූජකවරුන් ද ඇතුළු විවිධ ආගමික පැවිදි සමාජය “ආගම් ඇත්තේ මනුෂ්‍ය වර්ග යාට බෙදීමට නොව සාමයෙන් ජීවත් වීමට “යැයි සපත කරමින් අප වෙත සිය සාමයේ දෑසින් බලා ආශිර්වාද කිරීමයි.

පසුගිය සැම වසරක මෙන්ම මේ වසරේදීත් මේ සියළු ආශිර්වාද හා සිනා රැල්ලක්ම නත්තලේ අප ලැබූ ආත්මීය තෘප්තිය ජීවමාන කරයි.

**චමරි ශ්‍යාමා නිලන්තිකා විතානගේ**
හෙදි නිලධාරි
බාහිර රෝගී අංශය
ශ්‍රී ලංකා ජාතික රෝහල - කොළඹ

# 2013 කිතුනු ඇසින්




සුවිශේෂ සිද්ධීන් ලෙසින් 2013 වසර මතකයට එනවිට හාහා පුරා කියා සිහියට නැගෙන්නේ අති උතුම් 16 වන බෙනඩික් සුදොතුම් පියාණන්ගේ විශ්‍රාම ගැනීමත්, අනුප්‍රාප්තිකයා ලෙස ප්‍රැන්සිස් සුදොතුම් පියාණන්ගේ පත්වීමත්ය. ඒ සමගම වසර 600 කට පමණ පසු සුදොතුම් පියතුමකුගේ ඉසුඹු ගැනීමත්, ප්‍රථම වරට සුදතුම් පිය අසුනටලතින් අමෙරිකානු අයකු පත්වීම, ජේසු නිකායික සංඝයට අයත්වීමත් ප්‍රැන්සිස් නාමය ගත් පළමුවන සුදොතුම් පියා ලෙස පත්වීමත් මතකයට එයි. එලෙසම 2013 ජනවාරි 1 වන දින ආරම්භ වූයේ අති උතුම් 16 වන බෙනඩික් සුදොතුම් පියාණන්ගේ "භාග්‍යවන්තයෝ නම් සාමය උදාකරන්නෝය" යන 44 වන ලෝක සාම පණිවිඩයත් සමගිනි.

### ජනවාරි මාසය

44 වන අගවිනිසුරු ලෙස මොහාන් පීරිස් මහතා දිවුරුම් දුනි. කොච්චිකඩේ සුදුවර අන්තෝනි මුනිවර කෞතුකාගාරය විවෘත කෙරින. බණ්ඩාරවෙල සිදුනියපිල නි.ම.නි පරිශ්‍රයේ නව ලූර්දු ගුහාව තත් ප්‍රාදේශීයාධිපති ගරු රොහාන් සිල්වා පියතුමා අතින් විවෘත කෙරින. හිටපු අමාත්‍යවරයකු වන පෙස්ට පෙරේරා මහතාගේත්, ප්‍රදීප ලේඛක ජෙරාඩ් සියඹලාපිටිය මහතාගෙන් අභාවය සිදුවිය. ගුවන් වන්දනා ගමන් සඳහා කීර්ති නාමයක් දිනූ 'සුපර්ලින්ක්' ආයතනයට වසර 30 සපිරිනි. ලොව සසල කළ ලාබාල ගෘහ සේවිකා රිසානා නපීක් හිස ගසා ඝාතනය කෙරින. මහා ප්‍රාඥයකු වූ ගරු තිස්ස බාලසූරිය නි.ම.නි පියතුමා ස්වර්ගස්ථ විය. සනත් ජයසූරිය මහතා ජාතික ක්‍රිකට් කමිටුවේ සභාපති ලෙස පත්විය.

### පෙබරවාරි මාසය

ප්‍රැන්සිස්කන් ශ්‍රේෂ්ඨාධිපති ගරු ජෝස් වැලේරා සහෝදරතුමා සිරිලකට සැපත් විනි. ලොව විශාලතම දෙව්මව් ප්‍රතිමාව බොලිවියාවේ ලාහෝර් කඳුකරයේ ප්‍රතිෂ්ඨාපනය කෙරින. විශ්වීය සහෝදරත්වය නිමැයු බැසිල් කහසිංහ මහතා සග සුව දිනීය. දෙව්මැඳුරු භූමිවල වෙනත් ගොඩනැගිලි ඉදි කිරීම නොකළ යුතු බවට අප කාදිනල් හිමිපාණෝ ප්‍රකාශ කරති. ධීවර නියෝජ්‍ය අමාත්‍ය ලෙස සරත් ගුණරත්න මහතා පත්විය. වසර 600 කට පසු විශ්‍රාම ගැනුන අතිඋතුම් 16 වන බෙනඩික් සුදතුම් පියනම වාර්තාවක් තබයි. විශ්‍රාමික සුදතුම් පියතුමන්ගේ සේවය අගයමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙ සැසි වාරයකදි ඇමතිවරුන් හා පක්ෂ නායකයන් දෙසුම් පැවත්වීම කැපී පෙනුනි. 'ගොලුහදවත' චිත්‍රපටයට වසර 50 සපිරුනි. අවිස්සාවේල්ල සාන්ත මරියා දෙව්මැඳුරේ 150 ජුබිලි සංවත්සරයට සමගාමිව ප්‍රධාන පාර ඉදිරිපිට තැන්පත් කළ දෙව්මව් ප්‍රතිමාව ගිනි තබනු ලැබීය.

### මාර්තු මාසය

සාන්ත ප්‍රැන්සිස් ධර්මදූත නිකායේ නව ප්‍රාදේශියාධිපති ලෙස ගරු ජෙයරාජ් අරුලානන්දන් සහෝදර තුමා පත්විය. වැනිසියුලාවේ ජනාධිපති හියුගෝ චාවේස් සගසුව දිනීය. කතෝලිකයන් දේශපාලනයේ නිරතවීමෙන් කතෝලික අයිතින් වෙනුවෙන් පෙනී සිටිය යුතු වගට චක්‍ර ලේඛනයකින් අවධාරණය කෙරිණ. 266 වන සුදොතුම් පියා ලෙස ආජන්ටිනාවේ අතිඋතුම් ගොර්ගේ මාර්ක් කාදිනල් බර්ගෝලියෝ හිමි, ප්‍රැන්සිස් නමින් පත්විය. මැක්ෂිමස් රෝයිගේ 'ශ්‍රී ලංකාවේ කල්වාරි' විල්සන් රුද්‍රිගුගේ "චේතනා පරිශුද්ධ වේනම්, ජයන්ත පලිහවඩනගේ 'ආදරණීය උරුමය' කැලිස්ටස් ජයමාන්නගේ 'කිතුනු දිවියට අත්වැලක්', මොරිස් බොල්ලැගලගේ හවුල් කාරයා, මලින්ත බෝපආරච්චිගේ කිතු දහමින් ජීවිතයට, ලෙස්ලි පෙරේරාගේ 'වීරපුතා' යන කතෝලික ලේඛන ග්‍රන්ථ දොරට වැඩීය. කඳාන සාන්ත සෙබස්තියන් බාලිකා විදුහල සියවස සපිරූ අතර සසුන් පිය අසුනට නව පත්වීම නිමිතිකොටගෙන මුද්දර හා කාසි නිකුත් කරනු ලැබීය.

### අප්‍රේල් මාසය

ඓතිහාසික හා සාහිත්‍යමය සේවය අගයමින් වී පර්නියෝල් ගරු ජේ. නි. පියතුමන්ට රාජකීය ආසියාතික සංගමය මගින් පදක්කමක් පිරිනැමින. ල.ක්‍රි.වි ජාතික අනුශාසක සමුළුව උත්සවශ්‍රියෙන් පැවත්විණි. රත්නපුර සර්ව ආගමික සංසදය මගින් දකුණු ඉන්දියා පූජනිය ස්ථාන වලදි බෞද්ධ හා කතෝලික බැතිමතුනට ප්‍රහාර එල්ල කිරිමට විරෝධය පළකරමින් රත්නපුර ඔර්ලෝසු කණුව අසල විරෝධතාවක් පැවත්වින. දක්ෂ ලේඛක ගීත රචනයන්ගෙන් ජන අරගල පුරෝගාමියකුවු චන්ද්‍ර කීර්ති කුලරත්න මහතා සගසුව දිනීය. කකුලෙන් සාමාන්‍ය පෙල ලියා විශිෂ්ඨ සමාර්ථ ලැබු මාක් ශ්‍රී ආයතනයේ දුලාංජලි ආරියතිලක දැරිය පැසසුම් ලැබීය. ශ්‍රී ලංකා රදගුරු මණ්ඩලයේ නව සභාපති ලෙස අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ද උපසභාපති ලෙස අතිඋතුම් රායප්පු ජෝශප් හිමිපාණන්ද මහලේකම් ලෙස අතිඋතුම් වැලන්ස් මැන්ඩිස් හිමිපාණන්ද පත්වූහ. අගරදගුරු පදවියේ තේවාචාර්ය 12 නමක් පූජක වරම් ලැබීය. සා.බෙනි ප්‍රාදේශීයාධිපති අතිගරු ලෙනාඩ් රණසිංහ පියතුමා හදිසි අනතුරකින් සගසුව දිනීය ඊශ්‍රායෙල් ජනපති පී. පිරෙස් සුදොතුම් පියා හමුවෙයි. සංගීතඥ පැට්‍රික් දෙනිපිටිය සගසුව දිනීය.

### මැයි මාසය

ඝාතනයට ලක්වූ ඔස්කා රොමෙරෝ අගරදගුරු හිමි භාග්‍යවරයට එසවීමට පියවර ගැනින. 'මීගමු හඬ' මංගල කලාපය අප කාදිනල් හිමිපාණන්ට පිළිගැන්වින.



පාදුවා නගරයේ කිතුනු ජාතික රැලිය අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවත්වින. ජාඇල ජ්‍යෙෂ්ට මාධ්‍යවේදී ලෝරන්ස් ප්‍රනාන්දු මහතා සහ ගරු බොනිපස් ප්‍රනාන්දු නි.ම.නි පියතුමා සගසුව දිනූහ. වසර 25 කට පසු උතුරත් දකුණ යාකරමින් යළි මැදවච්චියේ සිට මඩු රෝඩ් දුම්රිය ස්ථානය දක්වා දුම්රිය ගමනා ගමනය ඇරඹින. ලොව ප්‍රථම පාස්කු ඉඟිනළුව 'භාරතයානෝ' නෙළුම්පොකුණ රඟහලේදී රඟ දැක්වින. වින්සෙන්තියානු දයා සේවාවේ නිර්මාතෘ භාග්‍යවත් පෙඩ්රික් ඔසනාම්තුමාගේ 200 වන ජන්මෝත්සවය යෙදිනි. කතෝලික දේශපාලඥයෙකු වන පාර්ලිමේන්තු මන්ත්‍රී දොස්තර ජයලත් ජයවර්ධන මහතා සගසුව දිනීම.

### ජූනි මාසය

කුරුණෑගල පදවියේ 'පහන්ටැඹ' සඟරාව වසර 25 සැපිරීය. ගුරු මාතාවන් තම සිසු දරු දැරියන් ඉදිරිපිට දණගැස්වී ගැන කතෝලික ගුරු සංගම් විරෝධය පල විය. ලොව පුරා විසිරි සිටින කතෝලික ප්‍රජාව වෙනුවෙන් 'සියැලි හඬ' අන්තර්ජාල ගුවන් විදුලි වෙබ්අඩවිය අගරදගුරු පදවි මාධ්‍ය ඒකකය මගින් ඇරඹින. අඟුලාන සාන්ත ප්‍රැන්සිස් සේවියර් දෙව්මැඳුරේ සත්ප්‍රසාද කූඩුව බිඳ දමා ගිනිතැබීමට ගත් ප්‍රයත්නයක් වාර්තා වූ අතර එහි මීසම් වැසියන්ගේ ආදර්ශයත් ක්‍රියාකලාපයත් පැසුසමට ලක්විය. බස්නාහිර හා දකුණු මුහුදු වෙරළින් මුහුදු ගිය ධීවරයන්ට වු විපත පිළිබඳ සසුන් සොවත් සහන සැලසීමත් වාර්තා විය. වහකෝට්ටේ සාන්ත අන්තෝනි බැතියේ 325 සංවත්සරයත්, මීසම් සංඝයේ 125 සංවත්සරයත් නව දෙව්මැඳුරේ 75 සංවත්සරයත් එකම අවස්ථාවේ සැමරින. අප කාදිනල් හිමිපාණන්ගේ සංකල්පයකට අනුව පමුණුගමදි ගිහි ධර්මදූත පුහුණු මධ්‍යස්ථානය ඉදිකෙරින. මහාචාර්ය විමල් වීරක්කොඩි මහතා සගසුව දිනීය. ලෙබනනය ප්‍රධාන මැදපෙරදිග කුමරි මරියාවන් කැපකිරිමක් ලෙබනනයේ ගැරිසිස් ආසන දෙව්මැඳුරේදී සිදු කෙරින.

### ජූලි මාසය

බුද්ධගයා ත්‍රස්ත ප්‍රහාරය රදගුරු සමුළුව හෙළාදකින ලදී. 'එදා එසේ මෙදා මෙසේ' ගරු සාර්ටෝ නෝනිස් පියතුමාගේ ග්‍රන්ථය දොරට වැඩීය විශ්‍රාම විදුහල්පතිවරයකුවු විල්ප්‍රඩ් කරුණානායක මහතා සගසුව දිනීය. දේව වන්දනා කොමිෂමේ හිටපු සභාපති අතිඋතුම් ප්‍රැන්සිස් කාදිනල් අරින්සේ හිමි සිරිලකට සැපත්වින. ඉන්දිය ඔරිස්සා ප්‍රාන්තයේ බ්‍රවුන්ගම් ග්‍රාමය ගරු පැවිදි සොයුරියක් මැරකල්ලියක් විසින් දූෂණය කර දින 5 කට පසු මුදාහැරීම ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව සමතුලිතතාවයකින් තොරව ක්‍රියාකිරීම පිළිබඳව ජාතික ගිහි කොමිසම් සාමාජිකයන් නොසතුට පල කෙරින. ගරු තෝමස් කුරියකොස් ජේ.නි. සා. ගරු වික්ටර් කෘස් නි.ම.නි පියවරුන්ගේ ස්වර්ගස්ථ වීම් සිදුවිය. වන්දනා කණ්ඩායම් තුළින් දුෂ්කර ගම්මානවල දෙව්මැඳුරු සංවර්ධනයට අතදුන් රේමන් වීරතුංග මහතා සගසුව දිනීය. මීගමුව කතෝලික ශාසනාරක්ෂක මංඩලයේ පළමුවන සංවත්සරය උත්සවශ්‍රියෙන් පැවැත්වි. කරිටාස් ශ්‍රී ලංකා සංවිධානයෙ නිවාස 121 ක් ඉදිකර උතුරේ ජනයාට බෙදා දෙනු ලැබින.

### අගෝස්තු මාසය

ජනමාධ්‍ය විශිෂ්ඨතා සම්මාන උලෙළේදී කාටුන් ශිල්පි කැමිලස් පෙරේරා, ඡායාරූප ශිල්පි ඩන්ස්ටන් වික්‍රමරත්න, ඉංග්‍රීසි මාධ්‍යවේදිනි කැරල් ඇලෝසියස් යන තිදෙනාට සම්මාන ලැබින. කුරුණෑගල රදගුරු පදවියේ හෙන්ඩියාගල දෙව්මැඳුරට අන්තවාදින් කළ ප්‍රහාර වාර්තා විය. ඉතාලියේ ටිකිම් පෙයාර් සඟරාවෙන් අප සුදතුම් පියාණන් වසරේ විශිෂ්ඨතම පුද්ගලයා ලෙස නම් කෙරින. රතුපස්වල සිද්ධියේදී ගිනිඅවි රැගෙන පැමිණ වැලිවේරිය දෙව්මැඳුරේදි ප්‍රචණ්ඩ ලෙස හැසිරිම අප කාදිනල් හිමිපාණන් විසින් හෙලා දකින ලදි. 'මිදුම' මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන සංවිධානයට වසර 15 සපිරින. රතුපස්වල සිද්ධියට ජනපති හා රදගුරු සමුළුව සාකච්ඡා පැවත්විය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි ප්‍රථම සභාපති ඩේවිඩ් සොයිසා මහතා සග සුව දිනීය.

එසේම ගරු මේරි ජෝෂපා සොයුරියද සගසුව දිනීය. රූකාන්ත චන්ද්‍රලේඛා යුවලට අඩන්තේට්ටම් කළ චූදිතයන්ට ඔවුන් විසින් සමාව දීමට ඉදිරිපත්වීම පැසසුමට ලක් වූවක් විය. S.V.P ජාත්‍යන්තර සභාපති ගේබ්‍රියෙල් මොන්ඩොල් මහතා ශ්‍රී ලංකාවට පැමිණියේය.

### සැප්තැම්බර් මාසය

මරිය වසර කේන්ද්‍රකරගෙන ජාඇල අධිවේගි පිවිසුම් මාර්ගය අසල ගර්භවාස මරිමව් දෙව්මැඳුර විවෘත කෙරිණ. ධර්මදූත ළමා සමාජයට වසර 125 ක් සපිරුනි. ගබ්සාවෙන් බේරුන පිලිප් සහ පාවුලෝ අයිය මලෝ පූජකවරයට එසවුන පුවතක්ද වාර්තා විය. තෙරේසා මව්තුමියගේ 96 වන ගුණානුස්මරණයේදි එක්සත් ජාතික සංවිධානය විසින් දයාවේ ජාත්‍යන්තර දිනය ලෙස ප්‍රකාශයට පත් කෙරින. හිටපු ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු සිරිල් පෙරේරා පියතුමා සගසුව දිනීය. වතිකානයේ නව රාජ්‍ය ලේකම් ලෙස අතිඋතුම් පිස්ට්රා පැරලි අගරදගුරු හිමිපාණන් පත්විය. කතෝලිකයා සෘජුව දේශපාලනයට යොමුවීම අවශ්‍ය බව සුදතුම් පියා පෙන්වා දෙනු ලැබිණ.

දිලින්දන්ගේ ගිහි ආරක්ෂිකාව ලෙස නම් දැරූ ඉතාලි ජාතික මරියා බොලොන්නම් භාග්‍යවරයට එසවිය. සුදොතුම් පියාණන් විසින් සැප්තැම්බර් 07 සාමය සඳහා යැදුම් හා උපවාසයෙන් ක්‍රියාකරන ලෙස ප්‍රකාශ කෙරින.

### ඔක්තෝබර් මාසය

කරිටාස් සෙඩෙක් 45 වන සංවත්සරය උත්සවශ්‍රියෙන් පැවැත්වින. ඔක්තෝබර් 13 මුලු ලොවම මරියතුමියට කැපකිරිම සුදොතුම් පියාණන් විසින් සිදුකෙරින. 'සැමට සරණ' දයා සේවාවට වසර 25 සපිරිනි. ශ්‍රී කුරුසිය තාපසිකා නිකායට වසර 175 සපිරින. සගසුව දිනූ අතිඋතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන්ගේ 25 වන ගුණානුස්මරණය සිදුකෙරින. ගරු බර්නාඩ් කුවින්ටස් නි.ම.නි පියතුමා සගසුව දිනීය. රුක්මනි දේවි හෙල නිළි රැජින සගසුව දිනා වසර 35 සපිරිනි. ජාතික ලේඛක හවුලේ නිලවරණයේ ජාතික සභාපති ලෙස ලෙනාඩ් කුරේ මහතාගේ.ලේකම් ලෙස ජයසිරි ප්‍රනාන්දු මහතාත් භාණ්ඩාගාරික ලෙස මැක්ෂිමස් රෝයි මහතාත් පත්වූහ. ගරු තමති කොලමුන්නේ පැ.තු.නි පියතුමා සගසුව දිනීය.

### නොවැම්බර් මාසය

ශ්‍රී ලංකාවේ ඉපැරණිම සගරාව වූ 'භක්ති ප්‍රබෝධනය' වෙබ් අඩවියට පිවිසින. මොල්ටාවේ දොමිනිකාන පැවිදි සොයුරියන්ගේ නිකායේ 25 වසර සැමරින. බෙනදිකාන නිකාය නව ප්‍රාදේශියාධිපති ලෙස ගරු ශාමින්ද ජයවර්ධන පියතුමා පත්විය. කටාන ප්‍රදේශයේ කැසිනෝ ගම්මානයක් ඉදිකිරීමට විරෝධය පළ කරමින් අප කාදිනල් හිමිපාණන් ලිඛිතව දන්වනු ලැබීය. රාජ්‍ය සංස්ථා හා පුද්ගලික අංශවල කතෝලික සේවක සංගම්වල සාමාජික හමුවක් අප කාදිනල් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් බොරැල්ල ජුසේවාස් මධ්‍යස්ථායේ පැවත්වින. 64 වන ක්‍රිස්තු රාජ රැලිය ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය විසින් උත්කර්ෂවත් අයුරින් මට්ටක්කුලියේ පැවැත්වින. ගාල්ල පදවි අනුනායක ලෙස අතිගරු චාල්ස් හේවාවසම් පියතුමා පත්විය.

### දෙසැම්බර් මාසය

රාගම දියගල ළමා නගරයට වසර 50 ක් සපිරිනි. සිග්නීස් උන්ඩා 57 වන සම්මාන උලෙළ ජාතික රූපවාහිනියේ 'තරංගනි' ශාලාවේදි රංගධාරි රවින්ද්‍ර රංදෙනිය මහතාගේ සහභාගිත්වයෙන් පැවත් වින. පුංචි රෝමය ලෙසින් පසිඳු මීගමුවේදී දෙසැම්බර් 20, 21, 22 නත්තල් කලාපයක් ප්‍රකාශයට පත් කෙරින. ශ්‍රී ලංකාවේ ප්‍රශ්න වලට විදේශිය අනවශ්‍ය අතපෙවීම් නොකළ යුතු බවට අප කාදිනල් හිමිපාණන් කළ ප්‍රකාශය කාගේත් අවධානයට ලක් වූවක් විය. ශ්‍රී ලංකා ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයට වසර 60 ක් සපිරීම නිමිත්තෙන් මට්ටක්කුලිය නි.ම.නි කේන්ද්‍රයේදී ජාතික උපාධ්‍ය ගරු රන්ජන් මාල් මොරායස් පියතුමන් සහභාගි වු මහෝත්සවයක් පැවත්විණි. දකුණු අප්‍රිකා කලු ජාතික ප්‍රථම ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා සගසුව දිනීය. මරිය වසර කාදිනල් හිමිපාණන් විසින් ප්‍රකාශයට පත් කෙරින.

**තියබෝල්ඩ් සමරතුංග**




# සහෝදරත්වය නිසා, යුධ කෝලහාල අතුරුදන් වේ එකිනෙකාට සංවේදි නොවීමෙන් බොහෝ ගැටුම් ඇතිවේ

## අතිඋතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන්ගේ 2014 සාම දින පණිවුඩය

2014 ජනවාරි මස 1 නි දින පැවැත්වීමට නියමිත ලෝක සාම දිනය නිමිත්තෙන් ලෝ වාසී සියළුදෙනාට සොම්නස හා බලාපොරොත්තුව සහිත ජීවිතයක් සසුන් පියා ප්‍රාර්ථනා කළ සේක.

වතිකානය විසින් දෙසැම්බර් 12 වැනිදා නිකුත් කරැති ප්‍රැන්සිස් සසුනිසුරාණන්ගේ පණිවුඩය "සාමය කරා යන ගමනේ පදනම සහෝදරත්වය" යනුවෙන් දක්වා ඇත. එම පණිවුඩය මගින් සහෝදරත්වය පිළිබඳ ගැඹුරු විග්‍රහයක් කරැත. සසුන් පියා විසින් පණිවුඩය ආරම්භ කර ඇත්තේ "සහෝදරත්වය අත්‍යවශ්‍ය මිනිස් ගුණාංග යක්" බව පවසමිනි. ඒ මන්දයත් අපි එකිනෙකාට සම්බන්ධ මිනිසුන් වන හෙයිනි. තවද දක්වා ඇත්තේ සහෝදරත්වය නොමැතිව සාධාරණ සමාජයක් හා ස්ථිර සාර සැමදා පවත්නා සාමයක් ගොඩනැගිය නොහැකි බවයි. සහෝදරත්වය ගලා යනුයේ පවුල තුළිනි. එම නිසාවෙන් සාමය කරා ඇදී යන මුඛ්‍ය මාර්ගය පවුල බැව් සසුන් පියා අවධාරණය කරයි.

ලෝකය පුරා පවත්නා මූලික මිනිස් අයිතිවාසිකම් කඩකිරීම් තමන්මැ විශේෂයෙන් ජීවිතයට හා ආගමික නිදහසට ඇති අයිතිය පිළිබඳව අදහස් සසුන් පියා විසින් දක්වා ඇත. රහස් මිනිස් වෙළඳාම් සාපරාධය ගැනද විශේෂ සඳහනක් එතුමා විසින් දක්වා තිබේ. සහෝදරත්වය කරා මිනිසාගේ කැඳවීම ගැඹුරින් තේරුම් ගැනීමද එම තේරුම් ගැන්ම වළකාලීමට තුඩුදෙන්නාවූ බාධකයන් අවබෝධ කර ගැන්මද. තවද එම බාධාවන් ජයගැන්මේ ක්‍රමවේදයන් හඳුනා ගැන්මද අවධාරණය කරනු ලැබ ඇත. එම කාර්යයේදී තමන් පිළිබඳ දෙවිඳුන්ගේ සැළැස්ම අවබෝධ කරගෙන ඒ මාර්ගය ඔස්සේ පියවර ගැන්ම වැදගත් වනු ඇතැයිද දක්වා ඇත.





මෙම අනුශාසනාව ඔස්සේ, සසුන් පියා ශුද්ධ වූ බයිබලයේ කායින් සහ ආබෙල්ගේ ජීවිත සම්බන්ධය සවිස්තරාත්මකව හුවා දක්වන සේක. කායින් සහ ආබෙල්ගේ ජීවිත කථාවෙන් සහෝරදත්වය සඳහා අප තුළ කිඳා බැසගත් කැඳවීමක් ඇති බැව් අනාවරණය කරනු ලබයි. එහෙත් එම සහෝදරත්වයේ කැඳවීම අපහරණය කිරීමේ දුෂ්ට හැකියාවන් අප තුළ තිබෙන බැව්ද සසුන් පියා විසින් පෙන්වා දෙනු ලබයි. මේ ලෝකයේ මිනිසුන් හා ස්ත්‍රීන් හට දෙවි පියාණන් විසින් ඔවුන් තුළ පිහිටුවා ඇති සහෝදරත්වයේ ලැදියාවට පූර්ණ වශයෙන් ප්‍රතිචාරයන් දැක්විය හැකිදැයි සසුන් පියා ප්‍රශ්නයක් අසන සේක.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මරණය හා උත්ථානය මගින් මිනිස් සහෝදරත්වය එක් ආකාරයකින් යළි ප්‍රතිෂ්ඨාපනය කරැති බැව්ද දක්වමින් එතුමා විසින් උත්තර දී ඇත. කුරුසිය සහෝදරත්වයේ තිරසාර පදනම් පථයයි. එහෙත් එම සහෝදරත්වය එලෙසින්මැ ඔවුන් තුළ උපදවා ගැන්මට ක්‍රියා කිරීමේ හැකියාව ඔවුන්ට නොමැත.

ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය පිළිගෙන, එතුමන් තුළ ජීවත්වන්නෝ, දෙවි මහෝත්තමයාණන් පියාණන් ලෙස පිළිගනිමින් උන්වහන්සේ වෙත පූර්ණ ලෙසින් තමන් බාර වෙමින්, සියළු දේට වඩා එතුමන්ට ප්‍රේම කරති. දෙවිඳාණන් තුළ සන්ධාන ගත වන්නා, එතුමා සියල්ලන්ගේ පියා ලෙසින් දකින්නේය. ඒ අනුව එම තැනැත්තා, අන් සියල්ලන් සමග සහෝදරත්වයේ දිවියක් ගත කරනු ඇත. පෙර කලැ සසුන් පියවරුන්ගේ සමාජ ලේඛනයන් අනුවද සහෝදරත්වය සාමය සඳහා මාර්ගය බැව් වටහා ගැන්මට පහසු වනු ඇත. තවද සසුන් පියා දිළිඳුභාවය තුරන් කිරීම සඳහා සහෝදරත්වය පූර්ව අවශ්‍යතාවයක් යයිද අවධාරණය කරන සේක.

වර්තමානයේ පවත්නා ආර්ථික අර්බුදය ජයගැනීම සඳහා ආර්ථිකය තුළැ සහෝදරත්වය ස්ථානගත දැයි සොයා බලන ලෙසට සසුන් පියා ජනතාවට අවවාද කරයි. සහෝදරත්වය නිසා, යුධ කෝලහාල අතුරුදන් වේ. තවද එකිනෙකාට සංවේදි නොවීමෙන් බෙහෝ ගැටුම් ඇතිවේ යයිද සසුන් පියා ප්‍රකාශ කළ සේක. කලකෝලහාල ඇති කරන්නන්ගෙන් සසුන් පියා ඉල්ලා සිටිනුයේ පීඩාවට පත් තැනැත්තන් දෙස, පරාජය කළ යුතු සතුරන් වශයෙන් නොව සහෝදර සහෝදරියන් ලෙස අවධානය යොමු කරන ලෙසය. දුරාචාරය සහ සංවිධානාත්මක සාපරාධයන් විසින් සහෝදරත්වය කෙරෙහි නිරන්තර තර්ජනයන් කැරෙනා බැව්ද සසුන් පියා පෙන්වා දෙයි. සහෝදරත්වය විසින් නිදහස් හා සාධාරණත්වය අතර ද පෞද්ගලික වගකීම හා සහයෝගිතාවය අතරද, පෞද්ගලික යහපත හා පොදු යහපත අතරද සමතුලිතතාවය ඇතිකිරීමෙන් සමාජ සාමය ඇති කරනු ලැබිය හැකි යයිද එතුමෝ මැනවින් හුවා දක්වති.

එකිනෙකා සමග නිදහසින් හා සුහදතාවයෙන් ජීවත්වීම කෙරෙහි බාධා පමුණුවනු ලබන කරුණු කාරණා සහෝදරත්වයේ සැබෑ ස්ප්‍රීතුව විසින් ජයගනු ඇත. සහෝදරත්වය විසින් ස්වාභාවික පැවැත්ම ආරක්ෂා කරමින් වගා කරනු ඇතැයිද සසුන් පියා විසින් පෙන්වා දෙනු ලබයි. සහෝදරත්වය ඇත්දැකිය යුතුය; ආදරය විඳිය යුතුය; ප්‍රකාශ කළ යුතුය; ඒ සඳහා සාක්ෂි දැරිය යුතුය. සසුන් පියා එලෙසින් සිය අනුශාසනාව සමාප්ත කළ සේක.

**බැසිල් පොන්සේකා**

---

# කිතු උපත අමරණීයයි...

විවිෂ් යු අ මෙරි ක්‍රිස්ට්මස්!! මේ වදන් පෙළ නත්තල් දිනට පෙර මධ්‍යම රාත්‍රියේ නත්තල උදාවීමත් සමග අප කා කවුරුන් අතරත් හදවත් තුළත් දෝංකාර දෙන්නේය. නත්තල් දින උදා වී මධ්‍යම රාත්‍රියේ දී එකිනෙකා අතර අප හදවත් තුළ ඇතිවන ප්‍රීතිය ප්‍රකාශ කරන්නේ හද බැඳි සතුටිනි.

විවිධ වූ නත්තල් සැරසිලි සහ ඉතා අලංකාර වූ ජේසු බිළිඳුන්, ජුසේතුමන් සහ මරිය මව් වැඩ සිටින ගවලෙන් සාදා මුළු මහත් කිතුනුවන් භක්තියෙන් එය සමරනුයේ අති උත්කර්ෂවත් අන්දමිනි. එලෙසම විවිධ වූ ආර්ථික මට්ටම් වලින් සමන්විත කිතුනු පවුල් දේවස්ථානයට එක්රැස් වෙන්නේ ජේසුන් ක්‍රිස්තුන් ස්වාමි දරුවන්ගේ උපත සැමරීමටය. විවිධ වූ දේවස්ථානවල සිටිනා පූජකතුමන්ලා දිව්‍ය පූජාව විශේෂාකාරයෙන් පවත්වමින් එහි රැස්වී සිටිනා කිතුනුවන් ආශිර්වාද කරති. එලෙසම, නත්තල් නාට්‍ය, ගීතිකා හා ග්‍රන්ථ සැදැහැවතුන් විසින් නිර්මාණය කරන විවිධ ක්‍රියාකාරකම් තුළ අපගේ ජීවිතයේ සැබෑ නිර්මාණකරුවා සැමරීම කෙතරම් අපූර්වද!

උන්වහන්සේගේ උපත පිළිබඳ ශුද්ධ ලියවිල්ලේ මෙලෙස සඳහන් වේ. "දාවිත්ගේ පුත් ජෝසෙප්, ඔබේ බිරිඳ වන මරියා පාවා ගන්නට බිය නොවන්න, මන්ද ඈ ගැබ්ගෙන ඇත්තේ ශුද්ධාත්මයාණන්ගේ අනුහසිනි. ඇය ගැබ්ගෙන පුතකු බිහිකරන්නීය. උන්වහන්සේට ජේසුස් යන නාමය තැබිය යුතුයි."

වසර 2013 කට පෙර දිවැසිවරයකුගේ මුවෙන් ලෝකයේ ගැළවුම්කරුවාණන් මෙලොවට බිහි වූයේ, මේ අසිරිමත් නත්තල් දිනයේය. එකල්හි ලෝ දනන් කොයි කවුරුත් බලාපොරොත්තු වූයේ විල්ලුද පලස් මැද මුළු ලොවටම කියා පාමින් මේ පුත් කුමරු මෙලොවට පැමිණෙනවා ඇත යන්නයි. එනමුත් සියල්ලන්ම විශ්මයට පත් කරමින් එතුමාණෝ ලෞකිකත්වය ත්‍යාජ කරමින් ශුද්ධාත්මානුභාවයෙන් යුක්තව ඉතා දිළිඳු වඩුවෙකු වූ දාවිත්ගේ පුත් ජෝසෙප් සහ මරියාවන්ට දාව බෙත්ලෙහෙම් නුවර ඉතා දිළිඳු ගවලෙනක සීත මැදියම් රැයේ උපන්නේය.

දේව වචනයේ සඳහන් වන පරිදි,

"අන්ධකාරයේ ඇවිද්දා වූ සෙනග මහත් ආලෝකයක් දුටුවෝය. ගනදුරු දේශයෙහි විසූ අය කෙරෙහි එළියක් දැන් බැබළෙන්නේය." (යෙසායා අ:2)

ශත වර්ෂ ගණනාවකට පෙර යෙසායා දිවැසිවරයා පැවසූ මේ වදන් දෙවියන් වහන්සේ එකී පොරොන්දුව කඩ නොකර අප ආලෝකයාණෝ වන තම ඒක ජාතක පුත්‍රයාණන් වන ජේසුන් ක්‍රිස්තුන් වහන්සේ මෙම පාපි ලොවට එවා වදාළ සේක....

උන්වහන්සේ ආලෝකයයි. මේ පාපතර අඳුරු ලෝකයට සැබැවින්ම ආලෝකය ගෙන එන තැනැන්වහන්සේ උන්වහන්සේ වේ. සැබැවින්ම දුක, කඳුළ, වේදනාව සහ මරණය අපගේ ජීවිතය අඳුරින් අඳුරට ගෙන යයි. එය දෙවිඳුන්ගේ ක්‍රියාවක් නොවේ. එනමුත් අප ආදී මාපියන් කළ පාපයේ වරද මේ මුළු මිනිස් සංහතියම පාපයේ ගිල්වන්නට සමත් විය. එනමුත් දෙවියන් වහන්සේ අප අත් නැර අපව පාපයෙන් සහ දුක, වේදනාව, මරණයෙන් ගලවා ගන්නට තම ඒක ජාතක පුත්‍රයාණන් වහන්සේ මෙලොවට එවා වදාළ සේක. ඒ බවට දේව වචනය සාක්ෂි දරනුයේ,

"ධර්මයාණෝ මිනිසත් බව රැගෙන අප අතර වැඩ විසූ සේක. දේව වරප්‍රසාදයෙන්ද සත්‍යයෙන්ද පූර්ණ උන්වහන්සේගේ තේජශ්‍රීය, එනම්, පියාණන් වහන්සේ කෙරෙහි වූ එකම පුත්‍රයාණන්ගේ තේජශ්‍රීය, අපි දිටිමු." (ශු. ජොහාන් 1:14 වගන්තිය)

ජේසුතුමන් එදා දිළිඳු ගවලෙනේ උපත ලැබුවේ උන් වහන්සේගේ අති මහත් නිහතමානිත්වය නිසාය. මෙලොව උඩඟුවෙන් හා මමත්වයෙන් දූෂ්‍ය වී ඇති කලෙක දෙවියන් වහන්සේ අපට දැක් වූ අති මහත් ප්‍රේමය සහ දේව කරුණාව උදෙසා තම ඒක ජාතක පුත්‍රයාණන් වහන්සේ මෙලොවට දායාද කළ සේක. සැබැවින්ම එම පුවත ඇසීම කෙතරම් ආශිර්වාදයක් ද මෙලොවට!

සැබැවින්ම, ලෝකය පෙරට වඩා නපුරට ඇළුම් වී ඇත. ලෝකය සහ සමාජයේ සෑම තැනම දූෂණයට සහ විනාශයට ලක් වී ඇත. නූතන සමාජය අධ්‍යාත්මිකත්වයට වඩා ලෞකික ආශා පසුපස හඹා යාම හේතු කොට ගෙන නත්තල විකෘති වී ඇත. එය සිදුවුයේ මිනිසාගේ පාපයෙනි. එම පාපය නැසීමට හැකි එකම මාර්ගය ජේසු සමිඳාණන්ගේ ක්‍රිස්තු උත්පත්තියයි. එනමුත් මෙලොවේ, සමාජයේ, පවුල සහ තමන් තුළ පාපය නැසීම සඳහා අප විසින් කළ යුතු කාර්ය භාරයක් ඇත. එනම් අප මමත්වය පසෙක ලා එයින් ඈත් වී ජේසුතුමන් ගිය මාර්ගය අප ජීවිත තුළට ඈඳා ගත යුතුය. උන්වහන්සේව අනුගමනය කළ යුතුය. ඒ පිළිබඳව. ගීතාවලියේ ගීතිකාකරු මෙසේ පවසා ඇත.

"ඔබට විරුද්ධව, ඔබට පමණක් විරුද්ධව
මම පවු කළෙමි, ඔබ හමුවේ
මම නපුරු කළෙමි.
පවට නැඹුම ඇතිවයි,
මා මෙලොව උපන්නේ,
කෙලෙස් මලින් යුතුවයි
මා මවුකුසේ පිළිසිඳුණේ
දෙවිඳුනේ මා තුළ නිර්මල සිතක්
මවා වදාළ මැනව,
තිරසර නව දිවියක් මට දුන මැනව
(ගීතාවලිය 51:4-5, 10 වගන්ති)

සැබැවින්ම කෙනෙකු බොහෝ රජ සැප භුක්ති විඳින කළ තවකෙකු කුසගින්නේ හා දිළිඳුකමින් පීඩා විඳිති. ඇතැම් දරුවන් හට දෙමාපියන්ගේ සෙනෙහස ආදරය ලැබීමේ භාග්‍ය හිමි වන කල ලෝකයේ තම දෙමව්පියන්ගේ සෙනෙහස නොලැබ වීදි කොනක ජීවත් වෙන ළමයි කොපමණ සිටිත්ද? යම් කොටසක් රැකියාවේ ඉහළ තනතුරුවල රැඳෙමින් ඒවා භුක්ති විඳිමින් ඉතා සුබෝපභෝගි ජීවිතයක් ගත කරනා කල ලෝකයේ බොහෝ තරුණ තරුණියන් රැකියා වියුක්ත භාවයෙන් පීඩා විඳිති. සැබැවින්ම මෙලොව මෙවැනි වූ තත්ත්වයකට බඳුන් වූයේ දෙවියන් වහන්සේ මගින් නොවේ. එය අපගේ පාපයෙනි. ඒ නිසාය ඉහත ගීතිකා කරු සඳහන් කරනා පරිදි අප පාපයන් පිළිබඳ සැබෑ මනස්ථාපයක් ඇති කර ගත යුතු වන්නේ. එලෙසම ඔබ අසා ඇති පරිදි ලෝකය නපුරාට අතකොළුවක් වී ඇත. එනම් ලෝකය වෙළාගෙන ඇති පාපයේ මූලාරම්භකයා යක්ෂයාය. අප ආදි මාපියන් මුලා වූයේ මේ සාතන්ගේ බලපෑමේ ප්‍රතිඵලයකිනි. මේ පිළිබඳව ශුද්ධ ලියවිල්ලේ මෙලෙස සඳහන් වේ.

"සිහිසන් ඇතිව අවදිව ඉන්න. ඔබගේ විරුද්ධකාරයා වන යක්ෂයා ගොරවන සිංහයකු මෙන් කවරෙකු ගිලගනිම්දෝ හෝයි සිතමින් ඔබ මොබ ඇවිදින්නේය. ලොව පුරා සිටින ඔබගේ සහෝදරයන් එම දුක් කරදර වලටම භාජනය වන බව සිහිකර ඔබගේ ඇදහිල්ලෙහි ස්ථිරව සිට යක්ෂයාට විරුද්ධ වෙන්න. (1 පේදුරු 5:8-9)

මෙවැනි වූ භයානක සමාජ වාතාවරණයක ජේසු සමිඳාණන්ගේ ක්‍රිස්තු උත්පත්තිය අප ජීවිතයට ගෙන එනුයේ මහත් ආලෝකයකි. මන්ද සාතන් සහ පාපයෙන් අප හට මිදීමට ඇති එකම මාර්ගය ජේසු සමිඳාණන්ගේ අසිරිමත් කිතු උපත නිසාය.

ඒ මන්ද යත්, "මා කෙරෙහි අද හන්නා තුළින් ජීවන දායක ජල ධාරා, ගලන්නේය." (ශු. ජොහාන් 7:38) උන්වහන්සේ ප්‍රකාශ කළ සේක. සැබැවින්ම අප හට ඇදහිල්ල නොමැතිව උන්වහන්සේව ප්‍රසන්න කළ නොහැකිය (හෙබ්‍රෙව් 1:6). එතුමාණන් සමග ශක්තිමත් දේව සබඳතාවයක්ද ගොඩ නගා ගත නොහැක. ඇදහිල්ල ප්‍රකාශවීමේ වර්ෂය අවසාන වන මොහොතේ මේ ජරාජීර්ණ පාපිතර සමාජයට ඔබ වහන්සේගේ උපත සිදුවීම සෑම කිතුනුවකුගේ ජීවිතයට මහත් ආලෝකයක් වන්නේය. ජේසු සමිඳාණන්ගේ අමරණීය කිතු උපත තුළින් සත්‍ය වශයෙන්ම කියනුයේ තනතුරු, ධනය හා මමත්වය පදනම් කරගත් සමාජයක් නොව අප සහෝදර සහෝදරියන් සංවේදී හදවතක් ඇති කර ගනිමින් එකිනෙකාට දයාව කරුණාව දක්වමින් ජේසු සමිඳාණන්ගේ අතිමහත් ප්‍රේමය ලොවට කියා පෑමය. ඒ බව ශ්‍රේෂ්ඨ ඉංග්‍රීසි කිවිඳියක වු එමලි ඩිකින්සන් පැවසූ වදන් මගින් මෙම ලිපිය අවසන් කරමින් ඔබ සැමට ජේසු බිළිඳාණන්ගේ ආශිර්වාදය සපිරි සුබම සුබ නත්තලක් වේවායි ප්‍රාර්ථනා කරමු.

"මට හැකිනම්, හදවතක් බිඳීයාම වළක්වා ලන්නට, දුක් විඳින ජීවිතයක් සනසවාලීමට වැටුණු කෙනෙකු හට අත දෙන්නට, මං මුළා වූ කුරුල්ලෙකු තම කැදැල්ලට ගෙන යන්නට, එසේ නම්, මා දිවිය නිකරුණේ ගෙවා නැත. සැබවින්ම මෙයයි මගේ නත්තල. (එමලි ඩිකින්සන්)

**ජේම්ස් සංජීව ජයසිංහ**
කෝට්ටේ




# උතුරේ අසරණයන් තුල ජේසු බිලිඳුන් දුටුවෙමු !

## නත්තල මුලතිව් කුලම්ඉරුප්පු ජනතාව හා බෙදාගත් නායකකන්ද මීසමේ සැබෑ නත්තල් අත්දැකීම







නත්තල් සමය සුපුරුදු ලෙසින් එළැඹී ඇත. වෙනදාට අප නත්තල් සමය සැමරීම පිණිස සූදානම් වන්නේ අපේ නිවෙස් අලංකාර කරමින් නත්තල පවුල් තුළ සැමරීමටය. නමුත් මෙවර නත්තල ඊට බොහෝ වෙනස් ලෙස සැමරීමට නත්තල ආරම්භයේ පටන්ම අපට අපූරු අලුත් නිමිත්තක් ලැබුණි. ඒ කොළඹ පදවියේ අප එඬේරාණන් වන අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ නත්තල බෙදා ගැනීමේ ආරාධනයයි. මෙවර නත්තල පවුල් ලෙස අප කාබී සතුටු වෙනු වෙනුවට නත්තලේ සැබෑ අර්ථය අත්දකිනු සඳහා මෙම නත්තල තවත් නැති බැරි අසරණ කවුරුන් හෝ සමග බෙදා ගන්නා ලෙස උන්වහන්සේ සමස්ත කතෝලික ජනතාවටම පොදුවේ ආරාධනා කළහ. ඒ අනුව කොළඹ 'සෙත්සරණ ආයතනය' පවා නත්තල දිළිඳුන් සමග බෙදා ගැනීමට විශේෂ වැඩපිළිවෙලක් දියත් කරනු ලැබීය.

### නත්තල බෙදා ගැනීමට

කාදිනල් හිමියන්ගේ මේ ආරාධනය යථාර්ථයක් බවට පත් කිරීමට දැවැන්ත පියවරක් තැබුවේ නායකකන්ද මීසමයි. නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමන් සිය මීසම් ජනතාව සමග මෙවර නත්තල විශේෂයෙන් යුද්ධයෙන් පසු ආර්ථක හා මානසිකව පීඩා විඳිමින් සිටින ජනතාවක් හා බෙදා ගැනීමට අදහස් කරන ලදි. ඒ සදහා මුලතිව් හී කූලම්ඉරුප්පු නම් ග්‍රාමය තෝරා ගන්නා ලදි. කූලම්ඉරුප්පු යනු යුද්ධයේ අවසන් සටන සිදුවූ පුදුකුඩුඉරුප්පු ප්‍රදේශයේ සිට කිලෝමීටර කිහිපයක් මෙපිටින් තිබෙන ගමකි. ඔවුහු සෘජුවම යුද්ධයට මැදහත් වූවෝ විය. ආර්ථක අතින් ඉතා පහලට වැටුණු පවුල් 300 ක් පමණ මෙම ග්‍රාමයේ ජීවත් වෙන අතර මෙම මීසමට අයත් කුඩා දේවස්ථාන 6 ක් වේ. එම දේවස්ථාන සියල්ල යුද්ධයෙන් පසු පිලිසකර කළයුතු තත්වයේ තිබෙන ඒවාවේ.

### නායකකන්ද මීසම

නායකකන්ද මීසම මෙවර නත්තල බෙදා ගැනීම සදහා තෝරා ගනු ලැබුවේ මෙම ග්‍රාමයයි. නායකකන්ද මීසම යනු ලංකාවේ වැඩිම කතෝලික ජනගහණයක් වෙසෙන මීසමයි. පසුගියදා එය මීසම් තුනකට වෙනු කරනු ලැබුවද තවමත් එය වැඩිම කතෝලික පිරිසක් ඇති මීසමක් ලෙස ඉදිරියෙන් සිටී. එසේම මූල්‍යමය වශයෙන්ද ශක්තිමත්, ආර්ථක වශයෙන් යමක් කමක් කළ හැකි පිරිසක් නායකකන්ද මීසමේ සිටිති. නිසාම මෙවර කුලම්ඉරුප්පු ග්‍රාමය වෙනුවෙන් අවශ්‍ය පරිත්‍යාගයන් සදහා නායකකන්ද මීසම්වාසීන්ගෙන් ලැබුණේ නොමසුරු සහයකි. මෙම නත්තල් පරිග්‍යාගය සඳහා ඇතැමෙක් මුදල් හදල්ද, තවකෙනෙක් ද්‍රව්‍ය වලින්ද ඇතැමෙක් ශ්‍රමයෙන්ද දායක විය. මෙම වැඩසටහන සඳහා ජනතා දායකත්වනේ ලැබූ පරිත්‍යාලයන් හී සම්පූර්ණ වටිනාකම ලක්ෂ 35කට ආසන්න වේ. වෛද්‍ය සායනයේ බෙහෙත් හේත් ඇතුළුව එය ලක්ෂ 40 කට ආසන්න මුදලකි.

### දිවා රෑ නිදිමැරූ මෙහෙයුම

ලැබුණු ආධාරයන් මනා කළමණාකරණයෙන් යුතුව ඇසුරුම් කිරීම තවත් වගකිවයුතු කාර්යයක් විය. ද්‍රව්‍ය සෙවීමත්, ඒවා ගමේ ජනතාවට පරිත්‍යාග කිරීම සඳහා නිසි පරිදි ඇසුරුම් කිරීමත් අඩු පාඩු සඳහා පරිත්‍යාගශීලීන් සොයා යැමත් සිදුවිය. බොහෝ දෙනෙක් සිය දෛනික කටයුතුද මඳකට වෙනස්කර දිවා රෑ මෙම විශේෂ කාර්යය සඳහා දායකත්වය ලබා දුන්නේ මහත් කැමැත්තෙනි. ඇතැම් දිනක මධ්‍යම රාත්‍රිය දක්වාම අදාල හාල්, පොල්, පරිප්පු, තේ කොළ, ඇඳුම් පැළඳුම්, සබන්, වැනි ද්‍රව්‍ය නිසි පරිදි ඇසුරුම් කිරීමේ කටයුතු වල යෙදිනි. මෙය ඇත්තෙන්ම ඉතා හෘදයාංගමවම සිදු කළ කටයුත්තක් විය. මේ සඳහා නායකකන්ද මීසම් ජනතාව හා කොට්ඨාශ නායකයින්ද , සිංහල, දෙමළ තරුණ සමිතිද, මීසම් සභාවද, වෙනත් සමිති සමාගම්ද සිය දායකත්වය ලබාදුන් අතර මීසමේ සහයක ගරු චානක ප්‍රභාත් පියතුමාද, ගරු ඔගස්ටින් පියතුමාද, ගරු ශානක ජැන්ස් සහෝදරතුමාද දැඩි කැපවීමෙන් මෙම කාර්යය වෙනුවෙන් කැපවිය. ඇතැම් අවස්ථාවලදී බඩු පොදි කරග සමින් පවා එතුමන්ලා මෙම කාර්යය වෙනුවෙන් විශාල ලෙස කැපවිය. මෙම සම්පූර්ණ මෙහෙයුමේ ප්‍රධාන වගකීම කරට ගෙන වැඩ කටයුතු කරනු ලැබුවේ. 'නායකකන්ද තරුණ විවාහක එකමුතුවයි **(YCFF)**. මෙය දේවස්ථානයේ තරුණ සමිතිවල ක්‍රියාශීලීව කටයුතු කර විවාහ වූ සාමාජිකයින් නැවතත් සිය පවුල් පිටින් සමාජ සේවා කටයුතු සඳහා පිහිටුවා ගත් සමිතියකි.

### නත්තලේ කුලම්ඉරුප්පු බලා යෑම

ඒ දෙසැම්බර් 6 වැනි සිකුරාදාය. කලින් සූදානම් කළ බඩු භාණ්ඩ සියල්ල රැය පුරාම ලොරිවල ඇසුරූ නායකකන්ද මීසම් ජනතාව පසුවදා උදෑසනම කූලම්ඉරුප්පු බලා ගමන් ඇරඹූහ. ගමනට පෙර නඩය ඇමතූ මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමන් මෙය මරිය තුමිය එලිසබත්තුමිය බැහැ දැකීමට ගිය ගමන මෙන් ගමනක් බව අවධාරණය කරලීය. ඇත්තෙන්ම එය රජවරුන් විසින් පඬුරු පාක්කුඩම් රැගෙන ජේසු බිළිදු බැහැදැකීමට ගිය ගමන මෙන්ම ගමනකි. මුල් දිනයේ අප පැය 8 ක පමණ ගමනකින් පසුව රාත්‍රියේ කුලම්ඉරුප්පු ගමට ලඟාවිය. එදින රැයේ අපට සියළුම නවාතැන් පහසුකම් සපයා දෙනු ලැබුවේ සහෝදර ආරක්ෂක අංශ සාමාජිකයින් විසින් එහි පැවති පුදුකුඩුඉරුප්පු කඳවුර තුළය. එක් කණ්ඩායමකට නවාතැන් ගැනීමට සිදුවූයේ. හිටපු එල්. ටී. ටී ඊ නායකයාගේ පුත් චාල්ස් ඇන්තනී ගේ නිවසේය. එය දුන් ඇත්තේ හමුදා නිවාඩු නිකේතනයක් ලෙසය. පැය අටක දුෂ්කර ගමනකින් පසුව අප සිටියේ දැඩිසේ වෙහෙසට පත් වී නමුත්. පසුදින අප විසින් කළ යුතු සද්කාර්ය වෙනුවෙන් අප ඒ සියළු අපහසුතා දරා සිටියෙමු.

### දෑසට කඳුළු නැංවූ උණුසුම් පිළිගැනීම

උදෑසනම කුලම්ඉරුප්පු දේවස්ථානයට ගිය අප එදින උදෑසන දිව්‍ය පූජාවක් පවත්වා තුති පිදීය. ඉතා කුඩා පුංචි දේවස්ථානයක් වූ එහි පැවත් වූ ඒ දේව මෙහෙය කිසිදා අමතක නොවන නැවුම් අත්දකීමක්ම විය. මෙම දිව්‍ය පූජාව පවත්වනු ලැබුවේ ත්‍රෛයිභාෂිකවය. ඉන් අනතුරුව ග්‍රාමයේ ජනතාව විසින් එහි පැමිණි අප පිළිගැනීම සඳහා විශේෂ පිළිගැනීමේ උත්සවයක් සංවිධානය කර තිබුණි. කුලම්ඉරුප්පු ග්‍රාමයේ මීසම් සේවක පියතුමන් සහ එම දිසාවේ දිසා බාර පියතුමන් ද මේ සඳහා සහභාගී විය. ඉතා හෘදයාංගම පිරිසක් වූ කුලම්ඉරුප්පු ජනතාව, අලංකාර මල් යොදා සිය දැතින්ම සැදූ මල් මාලා හා මල් වට්ටි මගින් අප කණ්ඩායමේ සාමාජිකයින්ට ලබා දුන් උණුසුම් පිළිගැනීම අප කිසිසේත් අපේක්ෂා නොකළ, අප කාගේත් දෑසට කඳුළු නංවන්නට සමත් එකක්ම විය. ඔවුන් අප එන මගට මල් ඉසිමින් කළ පිළිගැනීම කිසිදා අපට මින් පෙර ලැබී තිබුණේ නැත. එය එතරම් අපූරුය.

### නව දෙව්මැදුරකට මුල් ගල තැබීම

ඉතා කුඩා අබලන් කුලම්ඉරුප්පු දෙව්මැදුර වෙනුවට නව දෙව්මැදුරක් තනාදීම අප කණ්ඩායමේ සිහිනය විය. එය මීසම්සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමා ප්‍රමුඛ නායකකන්ද ජනතා පැතුම විය. එනිසාම නව දෙව්මැදුර ඉදිකිරීම සඳහා මුල් ගල තැබීමත්, එහි ආකෘතිය ප්‍රදර්ශනය කිරීමත්, නව දෙව්මැදුර සඳහා ගෘහනිර්මාණ ශිල්පීන් යොදා අප විසින් නිර්මාණය කර තිබූ සැලැස්මත්, මූලික අදියර නිම කර ගැනීම සඳහා වූ ලක්ෂ 10ක චෙක් පතත්, කුලම්ඉරුප්පු මීසම් සේවක පියතුමන්ට නායකකන්ද මීසම් සේවක පියතුමන් අතින් ප්‍රදානය කිරීම මෙහිදී සිදුවිය. අනපේක්ෂිත සිදුවීමක් වූ මේ අවස්ථාව ඔවුන්ගේ නෙත් කඳුළින් පුරවනු අපට දැකගත හැකි විය.

### වෛද්‍ය සායනය

ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍යය නංවාලීම සදහා වෛද්‍ය සායනයක් පැවැත්වීම මීලඟ අංගය වූ අතර ඒ සඳහා අප සමග වෛද්‍යවරුන් තිදෙනක් හා හෙදියන් දෙදෙනෙකු ප්‍රමුඛ කණ්ඩායමක් එහි ගොස් සිටියහ. ඒ කණ්ඩායමට සහාය දක්වනු පිණිස මුලතිව් හී සිටි තවත් වෛද්‍යවරුන් තිදෙනෙකුද එක්විය. මෙම වෛද්‍ය සායනය සම්බන්ධයෙන් ග්‍රාමයේ ජනතාව තුළ පැවතියේ දැඩි උනන්දුවකි. එනිසාම 250 කට අධික ප්‍රමාණයකගේ රෝග පරීක්ෂා කර ප්‍රතිකාර හා අවශ්‍ය බෙහෙත් නොමිලේම ලබාදීමට අප කණ්ඩායමට හැකිවිය.

### උතුරු දකුණු සංස්කෘතිකාංග

අප පිළිගැනීමත් පිනවීමත් පිණිස කුලම්ඉරුප්පු ජනතාව විශේෂාංග කිහිපයක්ද සංවිධානය කර තිබෙනු දැකිය හැකිවිය. නැටුම් ගැයුම් වලින් යුක්ත වූ ඒ උත්සවයේ ඉතා දක්ෂ ලෙස නර්ථනයෙහි යෙදුණු දරු දැරියන් කිහිප දෙනෙකුම අපට දැකගත හැකි විය. තමන්ට ඇති ඉතා සීමිත සම්පත් අපූරුවට භාවිත කරමින් මෙම විශේෂාංග ඉදිරිපත් කිරීමත් ඔවුන් තුළ පැවති සහජ දක්ෂතාවයත් අප විශ්මයට පත් කිරීමට සමත් විය. දකුණෙන් ගිය සිංහල අප විසින් කලින් පුරුදුවී ගිය ද්‍රවිඩ නත්තල් කැරොල් ගීතද එහිදී ගායනා කෙරුණු අතර එයට ඔවුන්ගෙන් ලැබුණේද උණුසුම්, සිත් ඇදගන්නා ආකාරයේ ප්‍රතිචාරයකි.

### විනෝද ක්‍රීඩා මැද සිනා

අප සමග ගිය නායකකන්ද දේවස්ථානයේ ද්‍රවිඩ තරුණ සමිතියේ සාමාජික සාමාජිකාවන් විසින් කුලම්ඉරුප්පු ග්‍රාමයේ තරුණ තරුණියන් හා දරු දැරියන් යොදා ගනිමින් විවිධ ක්‍රීඩා කිහිපයක් කරනු ලැබූ අතර කුඩා ළමුන් පමණක් නොව තරුණ තරුණියන් හා ඇතැම් වැඩිහිටියන්ද සිනාමුසු මුහුණින් මෙම ක්‍රීඩා සඳහා සහභාගී විය. මෙය ඔවුන් කාහටත් විශේෂ අවස්ථාවක් වූ අතර ක්‍රීඩා සඳහා සහභාගී විමටත්, තරග වැදීමටත් ඔවුන් තුළ වූයේ පුදුම උනන්දුවකි.

### විශේෂ දිවා ආහාර වේලක් බෙදා ගනී

දිවා ආහාරය පිළියෙල කරනු ලැබුවේ අප සමග ගිය සූපවේදියෙකු වූ ජයසිරි මහතා හා කණ්ඩායමක් විසිනි. ඔහු නියෝජනය කරන නායකකන්ද දේවස්ථානයට අයත් කොට්ඨාශ කිහිපයක ජනතාවගෙන් ලැබුණු ආධාර මේ විශේෂ දිවා ආහාරය සඳහා වියදම් ලෙස යෙදවූ අතර ජයසිරි මහතා ප්‍රමුඛ කණ්ඩායම විසින් හිමිදිරි උදයේම අවදිව දිවා ආහාරය පිළියෙල කරන ලදි. කුලම්ඉරුප්පු ග්‍රාමයේ 700කට වැඩි පිරිසක් මෙම විශේෂ දිවා ආහාරය බුක්ති විඳින ලද අතර අපද ඔවුන් සමඟ එකට හිඳ එම විශේෂ දිවා ආහාරය රස විඳින ලදි.

### තරුණ තරුණියන්ට ක්‍රීඩා භාණ්ඩ

අප සමග ගිය තරුණ කණ්ඩායම විසින් කුලම්ඉරුප්පු ග්‍රාමයේ තරුණ සමිති සාමාජිකයින් වෙත ක්‍රීඩා භාණ්ඩ රාශියක්ද ප්‍රදානය කරන ලද අතර මෙවැනි ක්‍රීඩා භාණ්ඩ ප්‍රදානයක් මෙයට පෙර ඔවුන් වෙත කිසිදිනකත් ලැබී තිබුණේ නැත. විශේෂයෙන් යුද්ධයෙන් පසු මෙහි තරුණ කණ්ඩායම් සඳහා ක්‍රීඩා හා වෙනත් විනෝද කටයුතු සඳහා අවශ්‍ය කරන උපකරණ තිබී නොමැති බවත් එවැනි උපකරණ ලබා ගැනීම ආර්ථික වශයෙන් දුෂ්කර බැවින් ඒ ගැන තමන් උනන්දු නොවූ බවත් මේ අයුරින් ක්‍රීඩා භාණ්ඩ ලැබීම තමන් විශ්මයටත් සතුටටත් පත් වූ කරුණක් බවත් ඔවුන් අප හා පැවසූහ.

### නත්තල වෙනුවෙන් තෑගි ලබාදීම

ඉන් අනතුරුව නත්තල වෙනුවෙන් තෑගි බෝග බෙදාදීම අප අතින් සිදුවිය. විශේෂයෙන්ම නායකකන්ද මීසමේ ජනතාව විසින් සිය නත්තල වෙනුවෙන් කරන වියදම කැප කරමින් එය බෙදා ගැනීම පිණිස ලබාදුන් මූල්‍ය හා ද්‍රව්‍යමය පරිත්‍යාග රැසක් මෙහිදී නත්තල් ත්‍යාග ලෙස කුලම්ඉරුප්පු ග්‍රාමයේ ජනතාව වෙත බෙදා දෙන ලදි. මේ ත්‍යාග අතර ඔවුන්ට නත්තල ගත කිරීමට අවශ්‍ය හාල්, පරිප්පු, සීනි, තුනපහ, සබන්, කිරිපිටි, සැමන් වැනි වියලි ආහාර විශාල ප්‍රමාණයක්ද, ඇඳුම් පැළඳුම්, පාවහන් හා ඇඳ ඇතිරිලි විශාල ප්‍රමාණයක්ද විය. එසේම මුළුතැන්ගෙයට අවශ්‍ය ප්ලාස්ටික් බේසම්, බාල්දි හා භාජනත්, ඇළුමීනියම් භාජනත්, චිමිනි ලාම්පු හා තවත් එවැනි නිවසට අත්‍යවශ්‍ය භාණ්ඩ රාශියක්ද විය. 350ක් පමණ දෙනාට මෙම තෑගි කට්ටලය බැගින් ප්‍රදානය කරනු ලැබීය.

### අපි නැවත අත්වැල් අල්ලා ගනිමු

විශේෂයෙන් අප හා ගිය දෙමළ තරුණ සමිතියේ සාමාජිකයින්ගේ භාෂා පරිවර්තනයන් නිසා ඔවුන් හා අප අතර භාෂාව නිසා ඇතිවී තිබූ පරතරය නැති විය. මෙම උත්සවයේදී අප හට ස්තුතිය පළකළ ඔවුන්ගේ එක් කතාවක මෙවැනි අපූරු අරුතක් සටහන්විය ''**දකුණේ ඉඳලා බොහෝ දෙනෙක් අපිව වරින් වර බලන්න ආවා. සමහරු ඇවිත් අපේ විස්තර අහලා, අපිව පොටෝ ගහලා , අපිට ආධාර දෙනවයි කියලා යන්න යනවා. ඔවුන් අපිව බලන්න එන්නෙ හරියට සත්තු වත්තෙ කූඩුවක දාපු සත්තු බලන්න එනවා වගේයි. කවදාවත් අපිට ඔවුන්ව දැනුනෙත් නැහැ. ඔවුන්ට අපිව දැනුනෙත් නැහැ. ඒත් නායකකන්දේ සිට ඔබ ආව මොහොතේ සිට ඔබට අපිව දැනී ඇති බව අපිට හැඟුනා, ඔබේ සිනහවෙන්, ඔබේ කතාවෙන්, ඔබේ හැසිරීමෙන්, ඔබේ බැල්මෙන් අපිටත් ඔබව බොහෝ තදින් දැනුනා. කාලයක් අපේ අත් අතහැරිලයි තිබුණේ.. දැන් නැවතත් අපි අපේ අත් අල්ලා ගතයුතු යැයි අපට හැඟෙනවා....**''

### මීලඟට උතුරෙන් දකුණට

නත්තල නිමිත්තෙන් බොහෝ දුෂ්කර යුද්ධයකට පසු නැවත ගොඩනැගීමට වෙර දරන කුලම්ඉරුප්පු වැනි ග්‍රාමයකට තෑගි බෝග රැගෙන ගොස් ඔවුන් හා විනෝද වෙමින් නත්තල ගතකිරීමට අපට ලැබුණු මේ අත්දැකීම අතිශයම සුන්දර හා කිසිදු දිනෙක අමතක නොවන අන්දමේ අපූරු එකකි. නායකකන්ද මීසම් සේවක පියතුමන් වන ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමාගේ මීලඟ අදහස වන්නේ උතුරේ ඒ අපේම සහෝදර ජනතාවගේ තරුණ කොටස් දකුණේ අපේ ගම වන නායකකන්ද ග්‍රාමයට ගෙනැවිත් ඔවුන් සමග දින කිහිපයක් ගත කිරීමට අපේ තරුණ තරුණියන් හට අවස්ථාව ලබාදීමයි. එය අප අතර ජාතීන් ලෙස ඇතිවී ඇති දුරස්ථභාවය නැති කරමින් එකිනෙකා අවබෝධ කර ගැනීමට රුකුලක් වන විශේෂ වූ වැඩසටහනක්ද වේ.

මෙවර නත්තල නායකකන්ද ජනතාවට විශේෂ නත්තලක් වනවාට කිසිදු සැකයක් නැත. ඇත්තෙන්ම නත්තලේ සැබෑ සාමයේ, සමගියේ හා බෙදා ගැනීමේ සැබෑ අරුත සැඟව ඇත්තේද ඒ තුළයි. ලංකාවේ ආර්ථික අතින් ශක්තිමත් අනිකුත් මීසම්ද මෙලෙස දිළිඳු මීසම් වෙත අත්වැලක් වෙනවානම් අප සැමට සැබෑ ලෙසම කිතු සමිඳුන්ගේ දහම අත් දැකීමට හැකිවනු නොඅනුමානය.

**සටහන හා ඡායාරූප:**
**තිළිණ අලහකෝන්**




නත්තල් කෙටි කතාව

# නත්තල් ගවමඩුව

දහම් පාසල පැවැත්වූයේ පල්ලියේ ඉස්තෝප්පුවේය. පහළ ශ්‍රේණිවල දකුණු පැත්තේය. ඉහළ ශ්‍රේණිවල වම් පැත්තේය. ආගමට ලැදි පාසලේ ගුරු මහත්ම මහත්මීන් කීපදෙනෙකුද ස්වේච්ඡාවෙන් සේවය කරන පාසල් හැරගිය දක්‍ෂ ගැහැනු පිරිමි ළමුන් කීපදෙනෙක්ද, ආචාර්ය මණ්ඩලයට අයත් වූයේය.

මේ ටීචර් අක්කලාටත් ටීචර් අය්යලාටත් දරුවන්ගේ තිබුනේ මහත් ආදරයකි. ගුරුවරුන් පිළිබඳ ලැදියාවත් එසේමය.

දහම් පාසල හැම ශිෂ්‍යයෙකුටම මහත් ආශ්වාදයක් ගෙන දුන්නේ බයිබලයේ අලුත් ගිවිසුමේ පරණ ගිවිසුමේ ධර්ම උපදේශ හා ලස්සන කථාන්තර නිසාය. එදා කියාදුන්නේ පරණ ගිවිසුමේ සැම්සන්ගේ කතාවයි. ඉතිරි කොටස ඉදිරි පාඩමේදී කියාදෙන බව කියුකල සිසුන්ට ඇතිවූයේ මහත් කණගාටුවකි.

පාඩම නැවැත්වූයේ පල්ලියේ පුංචි ස්වාමිට දහම් පාසලේ ගුරුවරුන් හා සිසුන් අමතන්නට ඕනැවු නිසාය.

ලොකු කුඩා සිසුන් සියල්ලෝ එක්වී සිටියහ. ජේසු ක්‍රිස්තු ආරාධිතවේවා පියාණෙනි ළමුන් පියතුමාව ආචාරශීලිව පිළිගත්තේය.

‘ඔක්කොම ඉඩතියෙන තියෙන විදියට ඉස්සරහටවෙලා වාඩි වෙන්නකෝ’ සමහරු පුටු බංකුවල වාඩිවු අතර ඉඩ මදිවු ළමයි බිම වාඩිගත්හ.

කියන්න යන්නේ කුමක්දැයි කවුරුත් නොදැන සිටිමුත්, පුංචි ස්වාමි දහම් පාසලට එන්නේ නම් මොනවා හෝ හොඳ දෙයක් රැගෙන බව සියල්ලෝ දැන සිටියහ.

දරුවෝ කැමති දෙයක් ගැන කතා කරන්නයි මම අද සූදානම් වෙන්නේ. දැන් ලඟ ලඟ නත්තල එනවා. ඔයගොල්ලන්ට මොනවද නත්තල ගැන කියනකොට සිතට එන්නෙ.

ළමුන් එවිට එක එක දේ කීහ. නත්තල් සීයා තෑගිදෙනවා. කැවුම් කොකිස් ඉදෙනවා රස රස කෑම හැදෙනවා. රතිඤ්ඤා ගිනිකෙලි පත්තුකරනවා. පල්ලි යනවා. ඇයි ගව මඩුත් හදනවා.

න්ආ. නවත්තන්ඩ ගොඩක් වැඩ තියෙනවා වගේ. අපි කොතනද නැවැත්තුවේ. ගවමඩුව ලඟ හොඳම තැන. අපි එහේනම් ඒ ගැන කතා කරමු. අපි මේ සැරේ හදන්න ඕනේ ලොකු නත්තල් ගවමඩුවක්. ගමටම හරියන්න.

දැන් ඇන්ටන් කියන්න ලොකු ගවමඩුව හදනවනම් හදන්න ඕනෙ කොහොමද කියලා.

ෆාදර් ලොකු ගවමඩුවක් හදනවානම් අපේ අම්මල තාත්තල එක්ක කතා කරන්න වෙයි. අපිට විතරක් බෑ.

හරියට හරි එහෙම තමයි හොඳ එහෙනම් ඊට පස්සේ.

පොල් අතු ලී පරාල තහඩු ඇන ලනු ඒවා එකතු කරන්න වෙයි. අම්මල තාත්තලා උදව් කරයි.

ෆාදර් සිමෙන්තිත් ඕනෙද තියෙනවානම් හොඳයි.

එහෙනම් වැලි ගලුත් ඕනෙද

තියෙනවානම් වඩාත් හොඳයි. දැන් මේ ළමයි කියන්නේ ගවමඩුවට ඕනෙකරන දේවල් හොයාගෙන ගවමඩුව හදනවා කියන එකනේ.

එහෙමයි ෆාදර් සියල්ලෝම එක්වර සතුටින් පිළිතුරු දුන්හ.

ඉතින් කොහාටද මේ දෙවල් එකතු කරන්නේ.

අම්මල තාත්තල දෙනදේවලුත් ගෙදර තියෙන දේවලුත් අපි ළමයි කණ්ඩායම් ගැහිල එකතුවෙලා. ගමේ ගොඩේ ගිහින් ගවමඩුවට දෙන්නෙ මොනවද කියලා ලිස්ට් එකක් හදාගන්නවා. ඊට පස්සෙ දවසක ගිහින් ජේම්ස් මාමාගේ කරත්තෙන් එකතුකරගෙන එනවා.

හරි හොඳයි අදහස

ළමයි ගෙවල්වලට ගොස් මේ කතාව දෙමව්පියන්ට කීහ. පුංචි ස්වාමි ලෑස්තිවෙන්නෙ මේ සැරේ මුළුගමටම ලොකු ගවමඩුවක් හදන්න. ඔවුන් තමුන් හදාගත් ලැයිස්තුවේ මුලින්ම තම දෙමව්පියන්ගේ නම් හා දෙන දේවල් සටහන් කරගත්තේය.

පුංචි ස්වාමි මේ සැරේ මොනව කරන්ඩ හදනවාද දන්නේ නෑ. කමක් නෑ ලියන්න අපෙන් පරාල පහක් කියලා. අපේ කාගෙත් දරුවන්ගෙ වැඩක්නෙ. නත්තලත් පොඩි දරුවන්ගෙනේ.

සමහර දරුවන්ගේ ලැයිස්තුවල ගඩොල් පරාලේ සිට ගවමඩුවකට නොව ඊටත් වැඩි ගොඩනැගිලි ද්‍රව්‍ය දැක පියතුමා කිසිදාක නොවිඳි සතුටක් වින්දේය. උන්වහන්සේ ළමුන් ඉදිරියේම දණගසා දෙවි ස්වාමින් වහන්සේට ස්තුති ප්‍රශංසාවේවා’යි අයැදි සේක.

පුංචි ස්වාමිගේ බැහැපත්කම ගැන ළමුන් තුළ ඇතිවූයේ මහත් පැහැදීමකි.

ලැයිස්තුගත සියළුම භාණ්ඩ නොවැම්බර් මස පළමුවෙනි දිනට පෙර පල්ලියේ ගබඩා මඩුවට ගෙනැවිත් බාරදෙන ලෙස පුංචි ස්වාමි ඉල්ලා සිටියේය.නියමිත දින මඩුව පිරෙන්නට බඩු ගොඩග ැසුනි. මඩුවකට නොව කුඩා ගෙදරකට සෑහෙන තරමේ ලී හා වෙනත්දේ එක්වී තිබිණ.

ළමුන් වැඩේ හරියටම කරලා තියෙනවා, පියතුමා තමාටම කියා ගත්තේය.

දහම් පාසලේ නායකත්ව දරුවන්ද ඇතුළුව දෙමාපියන්ගෙන් සුසැදුනු කමිටුවක් ගවමඩුව ඉදිකිරීමට පිහිටුවා ගන්නා ලදි. කරන්න යන දේ ගැන තම තමුන්ගෙ න්ම ප්‍රශ්නකරගත් සමහර දෙමාපියෝ ඒ පිළිබඳ පුංචි සුවාමිගෙන් ප්‍රශ්න කිරීමට ඉදිරිපත් නුයේය. උන්වහන්සේටත් දරුවන්ටත් උදව් කළ යුතු යයි ඔවුන් වැඩිදුරටත් සිතුයේය.

ඔයගොල්ලන්ගේත් දරුවන්ගේත් නත්තල් ගවමඩුව ඔබ සියල්ලන්ගේ සිත් දෙව් ආදරයෙන් පිරී ඉතිරි යනු ඇති’යි පියතුමා කීවේ එවිටය. දැන් ලී දඬු පරාල තියෙනවා ගඩොල් සිමෙන්ති තියෙනවා පොල්අතු තහඩු තියෙනවා.

කැමති අම්මල තාත්තලට මේ ඉදිකිරීමට ශ්‍රමයෙන් දායක වෙන්නත් පුළුවන්.

දරුවන්ගේ දෙමාපියො කීපදෙනෙකුම ඉරිදා සෙනසුරාදා නිවාඩු දිනවල ගව මඩුවේ වැඩට ඒමට පොරොන්දු වූහ.

ඔවුහු සමහරෙක් වඩුවැඩ මේසන් වැඩද දත්තෝය. සමහරුන් අත් උදව්වට සූදානම් වූහ. එන පිරිසට දිනෙන් දින ආහාර සැපයීමට අයෙක් පොරොන්දු වූහ. තමන්ගේ කරත්තයෙන් ඕනෑම දෙයක් එහා මෙහා කරදීමට සීමොන් ආතා කැමති විය.

කතාකරගත් පරිදි නියමිත දින ගම කෙලවරේ පල්ලියට අයත් ඉඩමකට පුංචි සුවාමි

පිරිස කැඳවාගෙන ගියේය. වත්තේ තැනෙක මේසයක් සුදු රෙද්දකින් සරසා ඒමත මල්පෝච්චියක් පොල්තෙල් පහනක් හා කුඩා කුරුසියක් තබා සූදානම් කර තිබිණ.

සියල්ලෝ දිව්‍ය පූජාවට සූදානම් වුහ. පියතුමා පූජාව ආරම්භ කළේය. සැදැහැවතුන්ගේ සිත් භක්තියෙන් පිරී ඉතිරී ගියේය. සිදුවන්නේ කුමක් දැයි හැම අයෙකුටම අපැහැදිලිය. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාදීමෙන් පසු පියතුමා පිරිස ඇමතුවේය.

අපි අපේ ගවමඩුව හදන්නේ මෙතන. මේක පල්ලියේ ඉඩමක්. මම ලොකු පියතුමාගෙන් මේ සඳහා අවසර අරගෙන තියෙන්නේ. උන්වහන්සේ මේ දිනවල රෝමයේ වතිකානයේ ආගමික සම්මන්ත්‍රණයක. උන්වහන්සේ නත්තලට අපේ ගව මඩුව විවෘත කරන්න පැමිණේවි.

පූජාව අවසානයෙන් පසු දහම් පාසලේ කුඩා දරුවකු ලවා පස් පිඩැල්ලක්

කප්පවා ගවමඩුවේ ඉදිකිරීම් ආරම්භ කළේය. ලනු ඇද සීමා වෙන්කර හතරමුල්ලේ ගඩොල් කනු හතරක් ඉදිකිරීම සැලසුමට අයත්විය. ඉස්තෝප්පු කැල්ලක්ද, කුඩා කාමර දෙකක්ද පිටින් සතුන්ට කෑමට පිදුරු දමන්නට යාලත්තක්ද වෙයි.

සති අන්ත දෙදින තුළ වැඩකිරීමෙන් නොවැම්බර් අගවනවිට ගවමඩුවේ වැඩ නිමකරගන්නට හැකිවිනි. වහලය පොල් අතු සෙවිලිවිය. බිම කටු සිමෙන්ති අතුරා තිබිණි. ගවමඩුව ඉදිරිපිට පිල් කන්දක්විය.

පල්ලියේ වැඩට උදව්වු පේදුරු හට ගවමඩුව බලාග න්නට පුංචි ස්වාමි අමතර වැඩක් බාර කළේය. හැම රැයකට ගවමඩුව ඉදිරියේ පිල්කන්ද මත පේදුරු රාත්‍රිය ගෙව්වේය.

සිදුවනදෙය කුමක්දැයි දෙමාපියෝ නානා අදහස් පළකළත් පුංචි ස්වාමිට විරුදුව කිසිවක් නොකී අතර උන්වහන්සේගෙන් යහපතක් මිස අයහපතක් නොසිදුවන බව සියල්ලෝ විශ්වාස කළහ.

දෙසැම්බර් විසිහතරවන දින උදයේ දිව්‍ය පූජාව ගවමඩුවේ පවත්වන බව දහම් පාසලේ සිසුන්ටත් දෙමාපියන්ටත් දැනුම්දී එයට සහභාගි වන ලෙස පුංචි ස්වාමි ආරාධනය කළේය.

එතුමාගේ ආරාධනය පරිදි මුළුගමම දෙව් මෙහෙයට සහභාගිවීමට පැමිණ සිටියහ. ගවමඩුව ඉස්තෝප්පුවේ පූජාව තැබීමට මේසයක් සූදානම් කර තිබු අතර, අමතර තවත් මේසයක් ඒ හා සමගාමිව තබා තිබුණි. පූජාවේ යාග ඔප්පු කිරීමේ අවස්ථාවේදී පඬුරු වශයෙන් ගෙන ආ සත්ප්‍රසාද කරඬුව තෙල්පහන මල්පොකුර සමග කැවුම් කිරිබත් කෙසෙල් දෙවන මේසයේ තැන්පත්විණ.

පුංචි ස්වාමිගේ ගවමඩුවට ආශිර්වාද කිරිමේ ප්‍රධාන පියතුමා රෝමයේ වතිකානයේ සිට එවු පණිවුඩය දහම් පාසලේ ගුරු මහත්මියක විසින් ප්‍රකාශයට පත්කරන ලදි. එහි කියා තිබුනේ එතුමා ලංකාවට පැමිණීම තව මසකින් කල්යන බවද පුංචි සුවාමිගේ ගවමඩුව එතුමාටත් මීට දායකවු හැමටත් එලෝ මෙලෝ පින් එක්වන කටයුත්තක් බවය.

පුංචි සුවාමි සංවේදීව කථා කළේය. අපි නත්තල ගැන සිහිකරමු. එදා ගැබ්බරවු මරියතුමියට අවස්ථාවේ හැටියටවත් තම දරුවා ප්‍රසූත කිරීමේ කාර්යයට නවාතැනක් නොදුන් බෙත්ලෙහෙම් ජනතාව තුළ අප සිත් තුළ ඇත්තේ කෝපය මුසු වේදනාවකි. අද අපට ඒ අවස්ථාව ලබාදුන්නේ නම් අප ඔවුන්ට නවාතැනක් ලබාදෙයිද. ඒත් අද අපේ මීසමේ දහම් පාසල් ශිෂ්‍යයෝ හා ඔවුන්ගේ දෙමාපියෝ ඒ සත් කාර්යයට පෙළගැහිලා.

වසර විස්සකට අධික කාලයක් අපේ මියගිය මුතුන් මිත්තෝ සොයුරු සොයුරියන්ගේ මිනිවල් කැපූ මිනිපිට්ටනිය බලා කියාගත් තමන්ට කියා ඉන්න හිටින්න නිවහනක් නැති මේ රටේ බිම් අඟලක අයිතියක් කොහේවත් නැති ජෝශප්ටත් මරියාටත් නවාතැනක් වෙනුවට සදාතැනක් සූදානම් කරලා. මරියාගේත් ජෝශප්ගේත් ළදරුවාට මාස එකහමාරක් වයස. මට මීට මාස එකහමාරකට පෙර මේ කර්තව්‍ය කරන්න බැරිවීම ගැන මට දුක. ඔබ හැමට ජේසු පිහිටයි.

පුංචි සුවාමිගේ ඇරියුමෙන් දරුවාත් රැගෙන මරියා හා ජෝශප් ළමුන්ගේ ගවමඩුව තුළට ඇතුල්වෙද්දි බලා සිටියෝ කඳුලු පිරි දෑසින් අත්පොලසන් දුන්හ.

**කේ. ජේ. හෙන්රි පෙරේරා**
**මීගමුව**

# සාමය රැගෙන යාම

උඳුවප් සීතල ක්‍රම ක්‍රමයෙන් දැනෙමින් දැඩි සීතලකින් සිරුර වෙළාගෙන ඇත. හිරු කෙමෙන් අවරගිරට යයි. ඉර මුදුන්වත්ම සෙවනැලි ඉතා අඩුය. සූර්යයා අස්ථානගතවීමට තව පැයක් හෝ දෙකක් ගත වනු ඇත. එසැනින් රාත්‍රිය උදාවනු ඇත. මේ ලෝ දහමයි. දෙවියන් වහන්සේගේ නිර්මාණාත්මක කාර්යය යයි. ජීවිත මඟ කෙටිය. විඳින්නට, විඳවන්නට නොව දකින්නට අසන්නට නොව සවන්දීමටද බොහෝ දේ ඇත්තේ ය. කාලය හා අසීමිත වැඩ විසින් කලකට අමතක කරන ලද මගේ මතකය පාසල් වියේ ලබැඳි මිතුරිය දයානිගේ ශෝකී හඬෙහි රාවය සිහි ගන්වයි.

සැදෑ අඳුරෙන් වායු තලය වැසී ගියේ අදත් දයානිගේ සියළු බලාපොරොත්තු සුන් කරමිනි. තමාගේ දෙපයේ වීර්යය නැති වු දා සිට තම සැමියා වන සුමිත්ගේ කෙනහිලි වල අඩුවක් නොවීය. අන්තිමේදී ඇයත්, දරුවාත්, මහළුමවත්. නිවසේ තනිකර යාමට තරම් ද්‍රෝහියෙක් වු ඔහු ගැන තවදුරටත් සිහින මවමින් පසුවන දයානිට දැනුනේ මහා තනිකමකි. තම ජිවිතය ගැන විශාල බියක් සමගම, ප්‍රේමය සුවයක්ද යන්න සිහියට නැගිනි. එකම අහස්තලය යට එකම මිහිතලය මත සිටියද තමා සිටින්නේ කෙතරම් දුරකද යන්න සිහියට නැගිනි.

ඒ ශෝකී පාළු සිතිවිලිත් සමග සුමිත් සමග විවාහ දිවිය අරඹා සතුටින් ජීවත් වූ අතීතය ආවර්ජනය කළාය. ඔවුන්ගේ යුග දිවිය වඩාත් චමත්කාර ජනක වුයේ ඒ ආදරයේ ප්‍රතිඵලයක් ලෙස මෙලොව එළිය දුටු දියණිය චමත්කා නිසාය. තමා ඉතා වාසනාවන්ත යයි සිතෙන් උදම් අනමින් සිටි වාර අනන්තය. ඒ සුන්දර බව ඈත නොපෙනෙන මානයකට ගසා ගෙන ගියේ අනපේක්ෂිත ලෙසිනි. දියවැඩියා රෝගයෙන් පෙළෙන්නට වූ දයානිට ඇගේ කකුලේ නොදැනුවත්වම හටගත් තුවාලයක් ඔඩු දිවීම නිසා කකුල දණහිස ලඟින් කපා ඉවත් කරන ලදී. ඇවිදීමට නොහැකි වූ ඇය රෝද පුටුවේ පිළිසරණ පැතීය.

තම අසනීපයත් සමගම, සුමිත් තමා මඟ හරින බවත්, තමාටත්, දරුවාටත් තිබූ ආදරය ගිලිහි යමින් තිබෙන බවත්, ඔහු තමා සමග තිබුණු බැඳීම් වලින් ඉවත් වී ඇතිවාක් මෙන්ම තමාව මහත් කරදරයක් කොට සළකන බවක් ඉවෙන් මෙන් දයානිට දැනිනි. සවස රැ කියාව නිමා වී ගෙදර එනු වෙනුවට ඔහු කාමරයක් කුලියට ගෙන ජීවත් වන බවත් ආරංචි වී දයානිගේ හදවත ගිනි ගන්නට විය.

ජීවිතය මෙලෙසද, එක් එක් කාල පරිච්ඡේද වලදී අප ගත කරන අවධීන් එකින් එකට වෙනස්ය. මුළු ලොවම සුරපුරයක්ව පෙනුන විවාහ දිවියේ ඒ මුල් අවධිය අසීමිත බලාපොරොත්තු රැසකින් වෙලී සිටි බවත් ඇයට මතකය. මාව බලන්ඩ නාවත් අහිංසක දියණිය බලල යන්ඩ ආවත් මට ඇති. හදවතට දරා ගැනීමට බැරි දුක් වේදනා කඳුළු බවට පරිවර්තනය වෙද්දි දයානි ඉකි බිඳින හඬ ඇගේ මවට ඇසිනි.

“තමන්ව දාල ගිය මිනිහෙක් ගැන කඳුළු සලනවට වඩා වෙන වැඩක් නැද්ද” මව කේන්තියෙන් යුතුව ඇසුවාය. මොනවා කළත් තමාගේ සැමියාට මව දොස් කියනවාට ඇය අකමැතිය. “මේ පොඩි දරුවවත් ඔය මිනිහට මතක් වෙන්නේ නැද්ද? මව යළිත් අසන්නට විය. දයානිගේ සිත තුවාලයක් පෑරුනාක් මෙන් රිදුම් දෙන්නට විය. සිතට දැනෙන වේදනාත්මක සිතුවිලි අතර තෙරපෙමින් හුන් ඇයට ජීවිතය ඉතා කෙටි බවත්, ඒ කාලය තුළ අසන්නට, දකින්නට, විඳින්නට බොහෝ දෑ ඇති බවත් සිතුනි.

“මොනවා කළත් එයා මගේ ස්වාමිපුරුෂයනේ. මගේ දරුවාගෙ තාත්තානෙ.” ඇය මවට පිළිතුරු දුන්නේ එලෙසිනි.

“මේ තරම් අසරණ වුන වෙලාවක දාල යන මිනිස්සු ඉන්නවද” ඒ මවගේ ප්‍රශ්නයයි.

එහෙත් මේ මවටත්, දුවටත් නොපෙනෙන සුමිත්ගේ දුක්බර සිතුවිලි හැම දිනකම ඔහුගේ සිත වෙලා ගනී. තම කාර්යාලයේ මිතුරන් පවසන උසුලු කතා ඔහුට දරාගත නොහැකිය.

“මොකටද ඔය තරම් විඳවන්නෙ උඹ දික්කසාද වෙයන්. මේ ලෝකෙ වෙන ගෑනු නැද්ද? දැන් ඔය ගෑනිගෙන් වැඩක් තියනවයැ.” එම බස් ඔහුගේ දෙසවන් වලට වදින යවුල් පහර වැන්න.

ඒ සමගම තමාගේ ලබැඳි මිතුරා කෝසලගේ වචනත් ඔහුගේ හදවතේ සනිටුහන් වී ඇත. ඔහුගේ මිතුරන් අතරින් කෝසල තද කිතුනු බැතිමතෙකි. “උඹ කළ වැඩේ හරිම කැතයි. නින්දිතයි. තමන්ගේ භාර්යාව උනත් අසරණ වෙච්ච වෙලාවේ මොන පපුවක් තියෙන මිනිහද බං දාලා එන්නෙ. දැන් තමයි උඹ එයා ලඟ ඉන්න ඕනෑ වෙලාව. උඹේ විවාහ පොරොන්දු උඹට අමතකද? ලෙඩ දුකේදී ද සුව සැපේ දීද” මතක් කර ගනින් “උඹ කසාද බැන්දෙ ලෙඩ හැදුනාම අත්හැර දාන්න ද? එහෙනම් මොකටද කසාද බඳින්නෙ උඹට ඔය වගේ දෙයක් වුනොත් ඒ ගෑනි ඔහොම කරයි ද?” සුමිත් මහත් ඕනෑකමින් එයට සවන් දුන්නේය.

ඔහුට අතීතයේ නොමැකෙන සිද්ධීන් සිහිපත් වුනා. විවාහ වී අවුරුද්දක් ඉක්ම යාමටත් ප්‍රථම ඔහු කාර්යාලය නිමා වී නිවසට එන විට වේගයෙන් පැමිණි මෝටර් රථයේ හැපී විසි වී ගොස් කකුළක් ආබාධිත වූ අවස්ථාව. එදා දරුවකුද කුස තුළ දරාගෙන ඇය මාස කීපයක් ඇප උපස්ථාන කළ සැටි. නිදි මරමින් තම මහළු මවගේ වැඩ කටයුතුද කරමින් ඇය පරිත්‍යාගශිලි වූ සැටි ඔහුට මැවී පෙනුනා. ඒ සමගම “මේ නත්තලේවත් උඹට සාමය නැද්ද? රැ කියාවට ආ දින සිටම ආශ්‍රය කළ මම, උඹෙ අතීතය ඔක්කොම දන්නා මම උඹේ ඔය වැඩ පිළිවෙල අනුමත කරන්නේ නැහැ.”

හද කකාරමින් නැගී එන වේදනාව සුමිත්ට දරා ගත නොහැකි වුනා.

ඔහුට නිවසත්, අතීතයත් මතක් වුනා. පෙර අවුරුදු වල ඇය සමග ගොස් ඇඳුම්, පැළඳුම්, මව්පියන්ට තෑගි බෝග ගත් සැටි, රාත්‍රී පූජාවට ඇය සමග ගොස් ගවහළ ලඟ යාච්ඤා කළ අන්දම. දැන් දයානි රෝද පුටුවේ ඉඳගෙන කඳුළු සලමින් තමා එන පෙර මඟ බලා සිටින සැටිත් මැවී පෙනුනා. සිඟිති දියණිය නිවසට ගොඩවන විටම ‘තාත්ති’ කියමින් ඇගේ එල්ලෙන අන්දමත්, ජීවිතය තමාට එපා වුනාක් මෙන් ඔහුට දැනුනා. මහත් කළකිරීමකින් ආ පසු හැරුනා. “මම මොනතරම් අධම මිනිහෙක්ද?” හදවතේ පතුලෙන් නැඟී ආ වේදනාව කඳුලු බවට හැරී ඔහු මහ හයියෙන් අඬන්නට වුනා.

කෝසල කලබල වී ඔහුට අසනීපයක්වත් දැයි කරුණු විමසන්නට වුනා. ඔහු තීරණයක් ගත්තා තමන්ට අවවාද දීමෙන් සිත වෙනස් කළ සිය මිතුරා වන කෝසල සිප වැළඳගෙන නත්තලේ සාමය රැගෙන ඔහු සතුටින් සිනාසෙමින් නිවසට යාමට පිටත් වුනා.

කළ පව් සියල්ලට පසුතැවිලි වෙමු
පාප කමා දෙව් පියගෙන් ලැබ ගනිමු
සතුටු සිනා රැලි අතරින් පිළි ගනිමු
සැමට බෙදනට සාමය ලැබ ගනිමු

**අයිරින් පෙරේරා**
**තුඩැල්ල**




# නත්තලේ අරුතට ගැලපෙන R හතරේ සංකල්පය

කිතුනු කතෝලික අප සැමට නත්තලේ අරුතට ගැලපෙන R හතරේ සංකල්පය වත්මන් සමාජය තුළ නත්තලේ සැබෑ අරුත උඩු යටිකුරු කරමින් කෑමට, බීමට. ඔපයට. සෝබනයට පමණක් නත්තල සීමාකොට නත්තලේ ආධ්‍යාත්මික භාවය ටිකෙන් ටික අප සමාජයෙන් දුරස්වී තිබෙන බව දැකගත හැකිය.

පසුගිය දිනෙක අප සැවොම පුදුමයට පත් කරවමින් ඇතැම් වෙළඳ ව්‍යාපාරිකයින් මළවුන්ගේ මාසය ආරම්භයේදීම නත්තල් සීයාව (Sancta clause) එළියට දමා තිබෙනු දක්නා ලදි. ඒ මගතොට යන එන මගී ජනතාව තම වෙළඳසල් වලට අද්දවා ගැන්මට ඇමක් ලෙසින්ය. නත්තල් සීයලා සාප්පු සංකීර්ණ අසල නටමින්, උඩපනිමින්, ගෙජ්ජි සොලවමින් ඇතැම් ස්ථානවල නත්තල් සීයලා කෝලම් පප්පලා ලෙස වෙස්ගන්වා හතර පස් දෙනා ලෙස රබන් ගසමින්, ගිටාර් වයමින්, අඟර දඟර පාමින් මේ වෙරදරන්නේ තම සේවා යෝජකයාට පාරිභෝගිකයින් සිය ගණනින් අද්දවාගැන්මටය. ඒ අද සමාජයතුළ සිටින වෙළෙන්දන් නත්තලට ජනතාව ගොනාට අන්දවන අයුරුය.

මේ අතර තවත් පිරිසක් මළවුන්ගේ මාසයේ සිටම වලිකන්නේ සිය නිවෙස්, බඩු මුට්ටු, ගෙවතු අලංකාර කරමින් බාහිර ඔපයට මුල්තැන දීමටය. කාන්තා පක්ෂය සාප්පු සවාරි ආරම්භ කරන අතර පුරුෂ පක්ෂයද ලහි ලහියේ බාර්වල පෝලිම්වලට එක්වන්නේ නත්තලට කසපැන් බෝතල් Pack කරගැන්මේ තරගයටය. ඒ අප සූදානම් වන බාහිර නත්තලය. එහෙත් නත්තල සැබෑ ලෙසම දුගියාගේය. එදා දේශීය සංගීතයේ මුල් පුරුකක් වූ ගරු මර්සලීන් ජයකොඩි පියතුමා පැවසුවේ "මගේ නත්තල දුගියා බත්කන දා" බවය.

දෙවියන් වහන්සේ ලෝකය මවා, එහි අඩංගු සියළුම දේ මවා විශ්වයේ මුල්ම මිනිසා සහ ගැහැනිය ආදම් සහ ඒව මවා සියළු සම්පත් ඔවුනට ලැබදුන්නද තහනම් ගහේ ගෙඩි කමින් දෙවියන්ට, දේව අභිලාශයට එරෙහි වෙමින් පාපයට වැටුන මිනිසාගේ පරම්පරාවෙන් පරම්පරාවටම එම ශාපය අප සැම පසු පස තවමත් ලුහුබඳිමින් සිටී. එසේ උරුමකර දුන් ජන්ම පාපයෙන් තම ජනතාව මුදා ගන්නට මිනිස් මවකගේ කුසතුළින් එතුමා මෙලොවට ජනිත විය.

සත්‍යවශයෙන්ම දේව පුත්‍රයාට අහස දෙබෑකරමින්, මහා ශබ්ද නගමින්, ඉතා විරාජමානව, නැතහොත් රජ පවුලක් තුළින් මෙලොවට බිහිවිය හැකිව තිබුනද දුගී දුප්පත් අසරණ ජනතාව වෙනුවෙන් අන්ත අසරණයකු ලෙස මෙලොවට බිහිවූයේ අදට වසර 2013 කට පෙර බැව් පැවසේ. මිනිසාට පරම ආදර්ශයක් දෙමින්, මිනිසාගේ කුරිරු බව, වංචාව, බල ලෝභය, ප්‍රතික්ෂේප කිරීම්, පාවා දීම්, මුදලට බලයට ලොල්වීම අද සමාජයේ මෙන්ම එදා සමාජයෙද තිබූ බැව් මොනවට පෙන්වා දෙමින් එදා නත්තල් දින මැදියම් රැයේ ජේසු බබාට මෙලොව එළිය දකින්නට සිදුවූයේ හරකුන්, බැටලුවන් ලැගුම්ගත් ගව ලෙනක දුගී දුප්පත් අසරණයකු විලසින්ය.

ඉතාමත් දුක් සහිතවය. එහෙත් බොරුව, වංචාව, නොඉවසන අපව නොරවටන, සත්‍යාවදී රජ කුමරෙක් - අනාගතයට අපට රජෙක් උපන් බවට එදා නිල් අහසේ පෑවු වල්ගා තරුවක් මගින්ද, ඒ දෙස බලමින් ලොවේ තුන් දිසාවකින් රජවරුන් / පඬිවරුන් තිදෙනෙක් සුවඳලාටු ආදී ත්‍යාගයන් අත් දරාගෙන එතුමාව බැහැ දකින්නට පැමිණි බැව් අපට ඉතිහාසය පෙන්වා දෙයි. තම දරුවාගේ අනාගතය වෙනුවෙන් එදා සිටම උරදුන් මරි මව් සහ ජුසේ තුමා කෲර හෙරෝද් රජුගේ ඝාතන වලින් දරුවා බේරා ගන්නට වෙර දරමින් ගව් ගණනක් පයින්ම දිවා රාත්‍රී ඇවිද ගොසින්. දහඩිය පෙරමින් ඇඩි මෙහෙයකින් දරු පැටියාවද තුරුළු කරගෙන දිග ගමනක් යාමට කෙතරම් වෙහෙසක් දරන්නට ඇතිද? ඒ දෙමාපියන් දරුවන් වෙනුවෙන් වැයවන අයුරුය. පසුව දරුවා ලොකු මහත් වී එදා සමාජයේ වැරදි තැන්වලට අභීතව පහර දෙන විට, දූෂ්‍ය ජුදයින් පරිසිවරුන් බොරු චෝදනා එතුමාට එල්ල කරමින් බොරු නඩු වලට පටලවමින් පසුව කෲර වද වේදනා දෙමින්, බරවූ කුරුසියක් කරමත පටවමින්, කස පහර දෙමින් කපාල කන්දට දක්කපු හැටි එදා එතුමිය සියැසින්ම දකින්නට ඇත.

පසුව තම වැදූ අම්මා ඉදිරිපිටදීම එකල පල්හොරුන්ට දෙන දඬුවම වන කුරුසිය මත තබා ඇන ගසා පල් හොරුන් දෙදෙනෙකු මැද පිපාසයට ජලය ඉල්ලූ විට තිත්ත කාඩි පෙවූ හැටි හෙල්ලයකින් සිරුර තුවාල කළ බැව්ද ඉන්පසු කුරුසියේදී සිය අවසන් හුස්ම හෙලනට ප්‍රථම සිය මව සමස්ත ජනතාවගේ අම්මා ලෙස ප්‍රකාශ කළ හැටිද ඒ සියල්ල මිනිස් අම්මා කෙනෙකු ලෙසට කෙතරම් දුරට ඉවසා සිටින්නට ඇතිද? තම එකම දරුවාට දෙන ලද වද වේදනා සියල්ලම සියැසින්ම දැක දැක ඒ අම්මා එදා මුහුණ දුන් මානසික වේදනාව කෙතෙක්දැයි අපට සිතින්



සිතා ගන්නට පවා නොහැකිය. එදා ඒ සමාජය තුළදී අප සැමව ජන්ම පාපයෙන් මුදාගන්නට ලොවට වැඩිය ජේසුව මරණය දක්වා (උකුත්වීම) එදා ජුදා සමාජය තුළ ක්‍රියාත්මක වූ වෛරය, ක්‍රෝධය, පළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම්, පාවාදීම් වර්තමානයේදී අප සමාජය තුළද එලෙසම දක්නට ලැබේ.

එසේනම් එදා වසර 2013 කට ප්‍රථම ජේසු අපට ලබාදුන් ප්‍රේමයේ පණිවුඩයට සිදුවූයේ කුමක්ද? කෝ ඒ සාමය, සතුට, සොම්නස? කෝ ඒ මානසික සුවය. ඒ සැම සම්පතක්ම අප සමාජය තුළට. අප රට තුළට, විශේෂයෙන් අප පවුල් තුළට වැද්දගන්නට අපි හතරේ සංකල්පය වටා එක්වන්නට දැන් සුදුසුම කාලය බැව් මගේ වැටහීමයි. R හතරේ සංකල්පය වැලිවිට මීසම් සේවක ගරු අර්'නස්ට් ද මෙල් පියතුමා පෙන්වා දෙන්නේ මෙසේය. Reflect (මෙනෙහිකිරීම) Renouncing (අත්හැරීම) Repent (පසුතැවිලිවීම) Renewal (නවදිවියක් වෙනුවෙන් අලුත්වීම) මෙම R හතරේ සංකල්පය අප දිවිය තුළට, අප පවුල් තුළට වැද්දගතහොත් එයින් අපට විපුල ප්‍රතිඵල ලබාගත හැකි බැව් එතුමා අපට පෙන්වා දෙන ලද්දේ ආගමන කාලය සඳහා සූදානම් වීමට ජනතාවට මගක් පෙන්වමින්ය.

මේ අනුව නත්තලේදී (මෙවර නත්තලේදි) අපට බොහෝදේ මෙනෙහිකළ හැකිය. එදා ජේසු උපතේ සිට ජේසුගේ අවසන් ගමන දක්වාවූ වසර 33 ක කාල පරාසය තුළ සිදුවූ දෑ මා ලුහුඬින් දැක්වූයේ ඒ නිසාය. ඒ තුළින්ද අපි අපගේ පසුගිය ජීවිත කාලය තුළ, විශේෂයෙන් පසුගිය වසර තුළදී අපෙන් දෙවියන්ට අපෙන් සභාවට අපෙන් ජනතාවට, අපෙන් අසල්වැසියනට, විශේෂයෙන් අපෙන් අප නිවැසියනට සිදුකළ වැරදි, අඩුපාඩුකම්, සිත් රිදවීම්, අනවශ්‍ය නාස්ති, කාලය අපතේ හැරීම් පිළිබඳව මෙනෙහිකරමු. ඒවාට දෙවිපියාණන්ගෙන් සමාව යදිමු.

R සංකල්පයේ තෙවැන්න පසුතැවිලි වීමය. එක්තරා දහමකට අනුව අප ශරීරය කුනු ගොඩක්ය. පසුගිය දිනෙක මා කියවූ එක්තරා ලිපියක සඳහන් වූයේ අප ශරීරය තුළ ඇති ඇස්, කන්, නාසය, මුඛය. හිසකෙස් ඇතුලු සැම අංගයක්ම පිළිකුල් සහගත බවය. එහෙත් කිතුනුවන් වශයෙන් අපි ශරීරයේ ඇති සියළුම ඉන්ද්‍රියයනට ආදරය කරමු. ඒ එම සියලුම ඉන්ද්‍රියයන් අපට දෙවියන් වහන්සේ වෙතින් ලැබුණ දේවල් නිසාය. තවද අප අපගේ ශරීරයට ආදරය කළ යුත්තේ මනුෂ්‍යයකුගේ ජීවිත කාලය පුරාවටම ඒ සියළුම ශරීර අවයවයන් මිනිසාට අවශ්‍යම නිසාත් ඒ සියල්ලම එකිනෙකට සම්බන්ධ නිසාත්ය.

එහෙත් ශරීරය පිළිබඳව මානව අප සැම පසුතැවිලි විය යුත්තේ පසුගිය කාල පරාසය තුළදී අප කළ අනවර්ත ක්‍රියා, නාස්තිය, දූෂණයන්, ඊර්ෂ්‍යාකිරීම්, අනුන් හෙලා දැකීම්, අසල් වැසියන් නිරපරාදේ පාවාදීම්, කොන්කිරීම් තම සොයුරාගේ සොයුරියගේ මුදල් දේපළ මංකොල්ල කෑම්, අනුන් රවටා වංචාසහගත ලෙස ඔවුන්ගේ වස්තුව කොල්ලකෑම්, තම රාජකාරීන් හරි හැටි ඉටුනොකිරීම්, තම බිරිය, තම සැමියා, තම දරුවන්, තම දෙමාපියන් වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් පැහැර හැරීම්. දෙවියන් වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් පැහැර හැරීම්, විශේෂයෙන් දස පනත තුළ ඇති පනත් උල්ලංඝනය කිරීම් මේවා ගැන අප අනිවාර්යයෙන්ම පසුතැවිලි විය යුතුය.

එසේනම් අවසන් R සංකල්පය Renewal හෙවත් අලුත් වීමට. නව ජීවිතයකට අඩිතාලම තැබීමට කතෝලිකයාට සුදුසුම කාලය නත්තල් සමය බවට වාද විවාද නොමැත. ඒ සඳහා අපට නත්තල් මාසය පුරාවටම සූදානම් විය හැකිය. අධ්‍යාත්මික ජීවිතය තුළ, පවුල තුළ (නිවස තුළ) පාසල් දරුවෙක් නම් පාසල තුළ, රැකියා ස්ථානය තුළ, ගමන් ගන්නා පොදු වාහනය තුළ, අසල් වැසියන්, නෑ හිත මිතුරන් අතර, අපට අනිවාර්යයෙන්ම යහපත් දේ අලුත් දේ, හරි දේ ඉටුකරමින් හෙට ඉපදෙන ජේසු බිළිඳා පිළිගැන්මට අලුත් විය හැකිය.

කතෝලික කම අන් අයට යහපත තුළින් පෙන්විය හැකිය. ඒ සඳහා ඔබට R4 සංකල්පය ඔබගේ හදවත තුළට රුවා ගන්න. සිත් තුළට ඇතුල් කරගන්න. ඔබ දන්න හැමටම R4 පණිවුඩය දෙන්න. ජපන් ජාතිකයින් S5 සංකල්පය තුළින් පිරිසිදුකම, පිළිවෙල, අනවශ්‍ය දේවල් ඉවතට දමමින්, අවශ්‍ය දේ පමණක් ලංකරගෙන සාර්ථක වූවා සේ ඔබටද R4 සංකල්පය තුළින් ජීවිතය නව මගකට යොමුකළ හැකිය.

වැලිවිට
**එම්. ජෝ. පාරිස්**

# ගැමි ස්ත්‍රියක ලොව උතුම්ම කාන්තාව විය

පුරාණයේ සිට නක්ෂත්‍රය කෙරෙහි විශ්වාසය තැබූ මිනිසා අද්භූත වස්තූන් කෙරෙහි මෙන්ම ඉර, හඳ, ග්‍රහ, තාරකා කෙරෙහි ද අසීමිත විශ්වාසයක් තැබීය. විශේෂයෙන් බැබිලෝනියාව, මිසරය ආදි රටවල මිනිසුන් මෙසේ ග්‍රහචාරයන් පිළිබඳව විශ්වාසය තබමින් ඒ අනුව සිය ජීවිත හැඩ ගස්වා ගැන්මට හුරු වී සිටියහ. ආගමික පූජක වරුන් පවා බොහොවිට තම බලය රැක ගැන්ම සඳහා එම බලවේගයන් අනුගමනය කළහ. ඇතමුන් බියට පත්වූහ. භීතිය. සංත්‍රාසය හා විශ්මය දනවන සුළු සංකේතයන් වරින් වර අහස් තලයෙහි දිස්වීම කෙරෙහි ඔව්හු සිය අවධානය යොමු කරමින් සිටියේ පුරාණ දිවැසි වරුන්ගේ දිවැස් වාක්‍යයන් ඔවුනගෙ සවනත වැටී ඇති හෙයින් විය යුතුය.

කිතු වසින් වසර දෙදහසකට ඉහත රිදීවන් තරු කැට විසිරුණ නිල්වන් අහස් තලයෙහි පායා තිබු වල්ගා තරුව ලොව විශ්මයට පත් කළේය. ජනී ජනයා මෙන්ම විවිධ රාජ්‍ය පාලකයෝද මේ ගැන සොයන්නට උත්සුක වූහ. පායා ඇති තරුවේ මඟ සලකුණු ඔස්සේ ඔව්හු ගමන් කළහ. ලොව විමුක්ති දායකයාණන් වූ සාමයේ කුමරු බෙත්ලෙහෙමේ ගව මඩුවක උපත ලබා ඇත යන විශ්මිත පුවත ලොව පුරා පැතිර යද්දී ගැමි ස්ත්‍රියක හා දිළිඳු වඩුවකු වූ මරියා සහ ජෝශප් එතුමාණන්ගේ රැකවරණය විය. අහිංසක හදවත් ඇති ගවයන්, එළුවන්, මෙන්ම බැටළුවන්ද එතුමාණන් වට කරගෙන සිටියහ. දුප්පත් එඬේරුන් ගී ගායනා කළහ. මේ ජේසු උපතයි.

ලොව ඓතිහාසික ග්‍රන්ථවල, මෙන්ම ශු. සුවිශේෂයන්හි පවා ලියැවී ඇති මරියා ජෝශප් යුවළ කතාව ඉතිහාසයට මේ තරම් වැදගත් වූයේ ඇයි? ඒ දිළිඳු ගැමි ස්ත්‍රිය ලොව උතුම්ම, ස්ත්‍රිය ලෙස වරම් ලැබීමට භාග්‍යය ලැබුවේ ඇයි? ඇය මෙලොවට බිහිකළ දරුවා ලොව මානව මෙන්ම සමාජ විප්ලවයක් ඇතිකිරීමට සමත් වූයේ ඇයි?

එතුමාණන් මෙලොව ජනිත වන මොහොතේ සිය රැකවරණයට සිටියේ මව, පියා හා සිව්පා සතුන් පමණි. වත්මන් තාක්ෂණ යුගයේ මෙන් වෛද්‍ය උපකරණ හෝ ශල්‍ය වෛද්‍යවරු එහි නොසිටියහ. සාත්තු සේවිකා තබා අසල්වාසි කාන්තාවකවත් එහි නොවීය. නවාතැන් ලබා දී ඇයට කළ යුතු සත්කාරයන් කිරීමටවත්, නවාතැන් දීමටවත් නොහැකි වූ සමාජයක කෙසේනම් එවැන්නක් බලාපොරොත්තු වන්න ද? වත්මන් සමාජයෙහි මෙවැන්නක් සිදු වුවා නම් අද කාන්තාව සිය දරුවා එහි දමා පිටව යනු ඇත. එසේ නොවේ නම් මහ මඟ, ඇලක, දොලක දමා නොයයිද? මරියා හට මේ සියලු දුක් වේදනා විඳ දරා ගැනීමට තිබූ ශක්තිය පුදුමාකාරය. එය දේව අනුහසින්ම ඇය සනසාලන ගැළවුම් කරුවාණන්ගේ ලොව මාංශගතවීම සාක්ෂාත් කරගැන්ම සඳහාම වූවක් විය.

'මරියා' අද ලොව උතුම්ම ස්ත්‍රිය බවට පත්ව ඇත. ඇය ජේසු පුතුගේ මව පමණක් නොවේ. සකල ලෝකවාසි කිතුනුවන්ගේ මවය. භාග්‍යවන්තිය. දිළිඳු, අසරණ ගැහැනියක මේතරම් ඓතිහාසික තැනැත්තියක් බවට පත්වූයේ කෙලෙසද?

පාප අන්ධකාරයෙන් වැසී ගිය ලෝකය මුදාලීම පිණිස මිනිස් කය ගෙන මෙලොවට එන ජේසු කුමරාණන් සියලු දුක්, කරදර, හිරිහැර හා අවලාද මැද වුවද ඉතාමත් නිහතමානිව, බැහැපත් සිතින් යුතුව සියල්ල දරා ගත් හෙයිනි ඇය භාග්‍යවන්ත වූයේ.

සිය පුත්‍ර රත්නය තරුණ වියට පැමිණ එදා පැවති දුර්ජන සමාජයට විරුද්ධව සමාජීය විප්ලවයක් කරතියි. ඇය ද කිසිදා නොසිතන්නට ඇත. රාජ්‍ය පාලකයෝ සිය බලය තහවුරු කර ගැන්මේ ලා අසාධාරණ හා අයුක්ති සහගත නීති මැද ජනතාව පාලනය කළ අතර, අද සමාජය මෙන්ම එදා ද වංචා, දූෂණ, අක්‍රමිකතා බහුල වූ බවට ඉතිහාසය දෙස් දෙයි. "ඔටුවකුට ඉඳිකටු සිදුරකින් යා හැකි මුත් ධනවතකුට ස්වර්ගයට යාමට අපහසුය. දැන් සිනාසෙන නුඹලාට අශුභය මක්නිසාදයත් නුඹලා හඬා වැලපෙන්නහුය." මේ උන්වහන්සේ ධනවතුන් හා බලවතුන් විෂයෙහි ලා කී දෑය. ජෙරුසලෙම් දේව මාලිගයේ දූෂිත වෙළඳුන් පන්නා දැමුවේ කස පහරිනි. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය වෛරය හැම අත විසිරිලාය. පැවති සමාජයට එරෙහිව තනිව නැගී සිටි උන්වහන්සේ මානව මෙන්ම සාමාජීය විප්ලවයක පෙරමුණ ගත්තේය.

එතුමාණන්ගේ ක්‍රියා කලාපය ශුද්ධ ලියවිලි තම වාසියට හරවා ගත් නායක පූජකවරුනට, තර්ජනයක් විය. එතුමා ඔවුනට සතුරෙක් විය. කූට වෙළඳුන්ට හා බදු අය කරන්නන්ට එතුමාණන් එපා විය. රාජ්‍ය පාලකයන්ට හා දේශ පාලකයන්ට ඔහු හිස රදයක් විය. හෙරොද්ගෙන් ආරම්භ වූ මුල් කුමන්ත්‍රණය මෙන්ම එතුමාණන්ගේ ජීවිත කාලය පුරාම සිදුවූ විවිධ කුමන්ත්‍රණ පිළිබඳව සාක්ෂි එමටය. අද ශ්‍රී ලංකා වත්මන් සමාජය ද එදා ජුදා දේශයෙහි පැවති සමාජය මෙන්ම යැයි අපට වටහ ගත හැකිය. ජාතියක් ජාතියකට විරුද්ධය. ආගමක් ආගමකට විරුද්ධය. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය පිරි සමාජය මඩ ගොහොරුවකය. දූෂණ, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර, සොරකම්, මිනිමැරුම් මේ කිසිවකින් අඩුවක් නැති දුර්ජන සමාජයක අද අපි ජීවත් වෙමු. ජේසු සමිඳාණන් මාංශගත වූයේ මෙවන් ජන සමාජයන් සඳහාය. අප ජන සමාජය අයහපතින් මුදා, යහපත්, ශිෂ්ට සම්පන්න දේශයක් කරා පිය මැනීමට අද එතුමාණන්ගේ සහය අපට අවශ්‍යව ඇත. ලොවට සාමය පතන මෙම නත්තල් දිනදිවත් එතුමාණන්ගෙන් හා මරිය මාතාවන්ගෙන් මේ සඳහා මැදිහත් වන්නැයි ඉල්ලා යාච්ඤා කරමු.

ඔබ සැමට සුබ නත්තලක් හා සුබ නව වසරක් වේවා!

දළුගම
**ලියෝ එෆ්. දිසානායක**




# උඩඟු වීමෙන් තුළ සාමය, සහජීවනය ඇති වන්නේ නැහැ; සාමය, සහජීවනය ඇතිවන්නේ බැහැපත්වීම තුළයි

## වත්තල සාන්ත ආනා දේවස්ථානයේ නත්තල් දින මධ්‍යම රාත්‍රි දිව්‍ය පූජාවේදී කාදිනල් හිමිපාණෝ පවසති

''එදා ඊශ්‍රායෙල් ජනතාව ගලවා ගැනීමට ගැලවුම් කරුවායැයි කියමින් විවිධ පුද්ගලයින් ඉදිපත් වුනා. එසේ ඉදිපත්වූ බොහෝ දෙනාට ජනතාව ගලවා ගැනිමට හැකියාවක් ලැබුණේ නැහැ. ඔවුන් ජනතාව ගලවා ගැනීමට යැයි කියමින් ආවත් අවසානයේ ජනතාව තව තවත් පීඩාවට පත් වුනා පමණයි. එනිසාම ජනතාව සැබෑ ගැලවුම්කරුවා ඉපදෙනතෙක් ඇඟිලි ගනිමින් බලා සිටියා. එවැනි පසුබිමක ලෝක මිම්ම අනුව දුබලයැයි සම්මත විදිහට තමයි ගැලවුම් කරුවා ඉපදෙන්නෙ යැයි පැවසූහ.





ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දිළිඳු එඬේරුන් තුළ ගව මඩුවක දිළිඳෙක් මෙන් ඉපදීමෙන් අපේ ජීවිත වලටත් බැහැපත් කම ගැන පණිවුඩයක් ගෙන එනවා. අපි සාමාන්‍ය ජීවිතයේදී බොහො විට පමණට වඩා උඩඟු වෙනවා ආඩම්බර වෙනවා.

අපි අපේ ජයග්‍රහණ පිළිබඳව පමණට වඩා උඩඟු වෙනවා අපි අපි අපේ ක්‍රියා ගැන, අපේ ජාතිය ගැන, අපි පමණට වඩා අනවශ්‍ය ලෙස උද්දාමයට පත් වෙලා අනිත් කෙනා නොඉවසන, හැමදේම අපිට කරන්න පුළුවන්, අපි පමණක් ඉහලයි කියන උඩඟුභාවයට පත්වීම. අන් අය ඉවසන්නේ නැතිව තමන් ලබාගත්, තමන් කළ දේ පමණක් හරි යැයි සිතා කටයුතු කිරීම. ඒ නිසාම අපි අනිත් අයට පීඩා පමුණුවනවා. ඒ නිසාම අන් අය අපට එකග නොවීම අපට තර්ජනයක් යැයි අප සිතනවා. උඩඟු වීම තුළ සාමය, සහජීවනය ඇති වන්නේ නැහැ. සාමය සහජීවනය ඇතිවන්නේ බැහැපත්වීම තුළයි. මේ නත්තලේදී අප විසින් ඒ බැහැපත් කම අප ජීවිතයන් සඳහා අත්පත් කරගත යුතු වනවා' යැයි නත්තල් මහා මංගල දේව මෙහෙය අමතමින් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ වැඩිදුරටත් පැවසූහ. **සටහන / සේයා තිළිණ අලහකෝන්**

### "සංක්‍රාන්තිය" මෙවරත්

ක්‍රිස්තියානි එක්සේසත් කවය මඟින් නත්තලට නිකුත් කරනු ලබන "සංක්‍රාන්ති" නත්තල් සඟරාව මේ වසරේදී නිකුත් විය. ගරු ජුඩ් ක්‍රිසන්ත ප්‍රනාන්දු පියතුමාගේ හා ශිරාන් මෛත්‍රිගේ සම සංස්කාරකත්වයෙන්, බර්ට්‍රම් එස්. ප්‍රනාන්දු මහතාගේ සම්බන්ධීකරණයෙන් නිකුත් වූ පිටු 96 කින් සමන්විත මේ නත්තල් සඟරාව ඔබටත් ලබා ගත හැකිය.



59 වන කොළඹ කුඩා රංචුව ලෙස මෝදර සා. අන්තෝනි ප්‍රාථමික බාලිකාවන් 30 දෙනෙකුට 2013 නොවැම්බර් 27 වන දින නවක පෙළ පදක්කම් පළදන ලදී. මෙය විශේෂිත අවස්ථාවක් වූයේ බාලදක්ෂිකා සංගමයේ ලියාපදිංචි කිරීමෙන් අනතුරුව බඳවාගත් පළමු කණ්ඩායම වීමයි.

එම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස සහභාගිවූ ජනාධිපති බාලදක්ෂිකා අධ්‍යක්ෂ ආසිරි විතානගේ මෙනවිය, කොළඹ දිස්ත්‍රික් කොමසාරිස් පුෂ්පා පෙරේරා මහත්මිය, කොළඹ කලාප කොමසාරිස් සුසිමා බමුණුසිංහ මහත්මිය, කොට්ඨාශ කොමසාරිස් ඩොරති ඩග්ලස් මෙනවිය. විදුහලේ කුඩා මිතුරියක විසින් පිළිගත් අවස්ථාව විදුහලේ විදුහල්පතිනිය මානෙල් ගෝමිස් මහත්මිය කුඩා මිතුරියන් භාර ගුරුමහත්මින් හා ආචාර්ය මණ්ඩලය මෙම අවස්ථාවට සහභාගි විය.
**රනිල් රාජපක්ෂ**

## ස්වර්ණ ජුබිලි විවාහ සැමරුම

**1964.01.02 - 2014. 01. 02**



**ජෝ වික්‍රමසිංහ සහ මැටිල්ඩා පෙරේරා**

විවාහ දිවියේ වසර 50 ක් සපුරාලමින් ඔබ දෙපොල ලැබූ මහඟු දීමනා වෙනුවෙන් දෙවිඳුන්ට මහත් වූ සෙනෙහසකින් තුති ප්‍රශංසා ගී ගයන්නේ ඔබ දරු පිරිසයි.

රොෂාන් (පුතා) සහ නිල්මිණී, ආශා (දුව) සහ ප්‍රසාද්, සුරාජ් (පුතා) සහ සුරේකා ඇතුළු අශාන්, සුනෝජ්, කවිශාන්, ප්‍රවීන් යන මුණුබුරන් හා මිණිබිරිය අශාන්ති.

**"සදාසරණ" නැ. කළුවාරිප්පුව, කටාන**



මෙවර නත්තලේදී පමුණුගම වින්සෙන්ති ද පාවුලා සමිතිය ප්‍රදේශයේ අඩු ආදායම් ලාභින්වෙත නත්තල් තෑගි පිරිනැමූ අතර මීසම් සහයක ගරු රසික ලෝරන්ස් පියතුමා ත්‍යාග පිරි නැමූ අයුරු මෙහි දැක්වේ. **(සේයා - බෙන්ජමින් කිරිහෙට්ටි)**



ගොඩැල්ල කුරුස හන්දිය (බෝලවත්ත පාර) තරුණ පිරිස විසින් නත්තල් උත්සවය වෙනුවෙන් බෝට්ටුවක් හැඩයට නිර්මාණය කර තිබූ ගවලෙනයි මේ. **(ගොඩැල්ල වාර්තාකරු)**

# ඉරබඩගම නත්තල් හමුව

ඉරබඩගම මීසමට අයත් ඉරබඩගම, හෙට්ටිරිප්පුව, මුතුගලයාගම යන දේවස්ථානවල කිතුනු ඒකකවල නත්තල් එකමුතුව මේ දිනවල පැවැත්වේ.

අසිපා ක්‍රමවේදය පදනම් කරගෙන යාච්ඤා මෙහෙයකින් ආරම්භකර දේව වචනය කියවා මෙනෙහිකර කුඩා කණ්ඩායම් වශයෙන් එක්වී අදහස් බෙදාගැනීමත් දරු දැරියන්ගේ නත්තල් නාට්‍ය, විචිත්‍රාංග ඉදිරිපත් කිරීමත්, දරු දැරියන්ට ත්‍යාග බෙදා දීමත් සිදුකෙරේ.

සෑම පවුලක් එකට එකතු වී ආහාර ගැනීමත් සිදුකෙරේ. එකම පවුලක් ලෙස සාංඝිකත්වයේ හා බෙදාගැනීමේ සංඝයක් ගොඩනගමින් නත්තලේ යථාර්ථය ක්‍රියාවට නැංවීම මෙහි අරමුණ වී ඇත. ඉරබඩගම මීසම් සේවක ගරු රූපස් හිලරි පියතුමාගේ මෙහෙයවීම ඇතිව මෙම කටයුතු සිදුකෙරේ. ගරු ක්ලැරිස්, ගරු ඈන්, ගරු ට්‍රීසා යන පැවිදි සොයුරියන්ගේ සහයද මේ සඳහා ලැබේ. **ඉරබඩගම වාර්තාකරු**



බෝ පිටිය තුඩුව 165 ඒ ග්‍රාමසේවා වසමේ වැඩිහිටි සංගමයට රෙදි කූඩාරමක් පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝන් අමරතුංග මහතා විසින් පිරිනමන ලදි.

වත්තල බල මණ්ඩලයේ සභාපති ඇන්ටනි ජයමහ මහතා එම පරිත්‍යාගය බාර ගැනීම සේයාරුවෙන් දැක්වේ. ප්‍රාදේශීය සභා මන්ත්‍රී නීතිඥ නිව්ටන් පෙරේරා මහතා ද මෙහි වේ.



පසුගියදා තිල්ලන්දූව මීසම් සේවක ගරු ඇතනේෂියස් සමරසිංහ පියතුමන්ගේ ආරාධනයෙන් පැමිණි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් හිමිපාණන් විසින් තිල්ලන්දූව දේවස්ථානය අසළ මාවත "අබා කොස්තා පිය මාවත" නමින් නම් කර උත්සවාකාරයෙන් යුතුව විවෘත කරන ලදි. **(ඩුශාන් රුද්‍රිගෝ)**

# උල්හිටියාව 150 ජයන්තිය ප්‍රකාශයට පත් කරයි

නොබෝදා පැවති උල්හිටියාව සා. ප්‍රැන්සිස් සේවියර් මුනිඳුන්ගේ වාර්ෂික මංගල දේව මෙහෙය අවසානයේ හලාවත පදවි අනුනායක අතිගරු පීටර් චාර්ල්ස් පියතුමන් විසින් 2014 වසර උල්හිටියාව දේවස්ථානයේ 150 ජුබිලි වසර ලෙස ජයසක් මඟුල් බෙර හඬ ඔස්සේ ප්‍රකාශයට පත් කරන ලදි.

උල්හිටියාව මීසම් සේවක ගරු බෙනට් ශාන්ත, සහයක ගරු ප්‍රනිල්ක පියතුමන් හා සේවක මණ්ඩලයේද ආරාධනය පරිදි දර්ශණීය පෙරහරකින් කැඳවාගෙන ආ අනුනායක පියතුමන් විසින් දේවස්ථානයට පිවිසෙන මංසන්ධියේදී ජුබිලි වසරට සමගාමීව සිහිවටන ඵලකයක්ද නිරාවරණය කරන ලදී.

**ගොඩ්ප්‍රි ගාල්ලගේ**



ගොඩැල්ල කන්‍යාරාමය අසළ තරුණ පිරිස විසින් නිර්මාණය කළ කිතු උපත විහිදා දක්වන ගවලෙන. **(එච්. ඒ. සිරිල් පෙරේරා)**



නත්තල වෙනුවෙන් පමුණුගම දෙව්මැඳුර ඉදිරිපිට තනා තිබූ නත්තල් ගස. **(බෙන්ජමින් කිරිහෙට්ටි)**